# දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සහ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිළිබඳ විවරණය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2021 අප්‍රේල්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දෘඪ විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දුරකථන: +9411 2081384, +94112081385, +94112081386
ෆැක්ස්: +9411 2081388
වෙබ්: www.cpalanka.org
ඊමේල්: info@cpalanka.org
ෆේස්බුක්: www.facebook.com/cpasl
ට්විටර්: @cpasl

## පිළිගැනීම

මෙම වාර්තාව භවානි ෆොන්සේකා, කුෂ්මිලා රණසිංහ සහ චර්යා සමරකෝන් විසින් පර්යේෂණය කර රචනා කරන ලදි. මෙම වාර්තාවෙහි මූලික කෙටුම්පත් සම්බන්ධයෙන් අදහස් ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු, ලුවී ගනේෂතාසන්, නිවේදා ජයසීලන් සහ ෂාලෙම් සුමන්තිරන් විසින් සපයන ලදි. වාර්තාවෙහි පිටු සැකසුම අයුධ්‍යා අයෝධ්‍යා ගජනායක විසින් කරන ලදි. මෙම පර්යේෂණ වාර්තාව සැකසීමේ දී තොරතුරු සහ අදහස් ලබාදුන් සියලුම දෙනා වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ස්වකීය කෘතඥතාවය පළකර සිටී.

# පටුන


හැඳින්වීම ........................................ 4

1 වන කොටස - දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව ........................................ 7

පසුබිම ........................................ 7

නෛතික රාමුව සහ අදාළ ගැටළු ........................................ 14

1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත ........................................ 14

කාර්යයන් ........................................ 16

පරීක්ෂණ කොමිෂන් සභාවෙහි ප්‍රධාන නිර්දේශයන් සහ ඒවායෙහි ගම්‍යමාර්ථයන් ........................................ 19

පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් වන ගම්‍යමාර්ථයන් සහ අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර ........................................ 79

II වන කොටස - දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ........................................ 80

නෛතික රාමුව සහ අදාළ ගැටළු ........................................ 80

1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත ........................................ 80

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන්ට අදාල අතීත සිදුවීම් ........................................ 84

දේශපාලන පළිගැනීම් පිළිබඳ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් ........................................ 87

නිගමනය ........................................ 89

# හැඳින්වීම

වර්ෂ 2015 ජනවාරි 08 වන දින සිට වර්ෂ 2019 නොවැම්බර් 16 වන දින දක්වා කාලය තුළ දේශපාලන පළිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා දේශපාලන පළිගැනීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමේ පරීක්ෂණ කොමිෂන් සභාව වර්ෂ 2020 ජනවාරි 9 වන දිනැති අංක 2157/44 දරණ (අති විශේෂ) ගැසට් පත්‍රය මගින් පත් කරන ලදී. පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මෙම පරීක්ෂණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.[1] වර්ෂ 2020 ජනවාරි 22 වන දිනැති අංක 2159/16 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය හරහා එකී පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කාර්යයන් සංශෝධනය කිරීම මගින් පරීක්ෂණ කොමිෂන් සභාව වෙත පුළුල් බලතල ප්‍රමාණයක් ලබා දෙන ලදි.[2]

මෙම කොමිෂන් සභාවෙහි සාමාජිකත්වය සඳහා ගරු. උපාලි අබේරත්න මැතිතුමන් (විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු), ගරු. දයා චන්ද්‍රසිරි ජයතිලක මැතිතුමන් (විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු) සහ චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමන් (විශ්‍රාමලත් පොලිස්පති) යන අය පත් කරන ලදි. මෙහිදී මූලික වශයෙන්ම සටහන් කළ යුතු වන්නේ, මෙම පරීක්ෂණ කොමිෂන් සභාව එහි කාර්ය කටයුතු වර්ෂ 2020 පෙබරවාරි 17 වන දින ආරම්භ වීමට නියමිතව මාස හයක කාලයක් සඳහා පත් කරන ලදි. කෙසේ වෙතත්, වර්ෂ 2020 ජූලි මාසයේදී[3] මෙම පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කාලය තවත් මාස හතරකින් දීර්ඝ කරන ලද අතර වර්ෂ 2020 නොවැම්බර් මාසයේ අතිරේක දින 16 ක් ද වන පරිදි දීර්ඝ කරන ලදි.[4] පරීක්ෂණ කොමිෂන් සභාවෙහි අවසාන වාර්තාව වර්ෂ 2020 දෙසැම්බර් 8 වන දින ජනාධිපතිවරයාට භාර දෙන ලදි.[5]

විවිධ පාර්ශවයන් විසින් පරීක්ෂණ කොමිෂන් සභාවෙහි ක්‍රියා පටිපාටීන් හා නිර්දේශයන් පිළිබඳව විරෝධතා කිහිපයක් ඉදිරිපත් කරන ලද අතර එහිදී ප්‍රධාන වශයෙන්ම මෙකී පරීක්ෂණ කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය සාධාරණ හෝ යුක්තිසහගත නොවන බවට කරුණු ඉදිරිපත් වූ අතර එහිදී අදාළ චෝදනාවන්ට ලක් වූ පාර්ශවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඔවුන්ට තමන්ගේ අදහස් ඉදිරිපත් කිරීමට අදාළව නිසි අවස්ථාවන් සහ ඒ සම්බන්ධයෙන් දැනුම් දීම් පිළිබඳව දැන ගැනීමට නීතියෙන් හිමිව ඇති අයිතිවාසිකම නිසි පරිදි එකී පාර්ශවයන්ට ලබා නොදීම මෙන්ම

---

[1] 2020 ජනවාරි 9 වන දින අංක 2157/44 හි අති විශේෂ ගැසට් පත්‍රය, යොමුව
< http://www.documents.gov.lk/files/egz/2020/1/2157-44_S.pdf >

[2] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති (SC FR 32 /2020) යොමුව <https://www.cpalanka.org/centre-for-policy-alternatives-v-attorney-general-sc-fr-32-2020/> වර්ෂ 2021 පෙබරවාරි මස 15 වන දින ප්‍රවේශ විය

[3] 2020 ජූලි 8 දින අංක 2183/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, යොමුව
<http://www.documents.gov.lk/files/egz/2020/7/2183-26_S.pdf>

[4] 2020 නොවැම්බර් 9 වන දින අංක 2201/05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, යොමුව
< http://www.documents.gov.lk/files/egz/2020/11/2201-05_S.pdf>

[5] දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීෂණ කොමිෂන් සභාවෙහි අවසන් වාර්තාව ජනාධිපතිවරයාට භාර දෙන ලදි' (ඩේලි නිවුස්, 2020 දෙසැම්බර් 8) <http://www.dailynews.lk/2020/12/08/local/235555/final-report-pcoi-political-victimization-handed-over-president> වර්ෂ 2021 පෙබරවාරි මස 12 වන දින ප්‍රවේශ විය

මෙම පරීක්ෂණ කොමිෂන් සභාව විසින් කටයුතු කළ පුද්ගලික පාර්ශවයන් විසින් ද ඉදිරිපත් කළ පැමිණිලි ද ඇතුළුව සමහර පැමිණිලි සම්බන්ධයෙන් අදාළ පරීක්ෂණ කොමිෂන් සභාවෙහි බලතල රාමුව පවා ඉක්මවා යන පරිද්දෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් යම් යම් විරෝධතාවන් ඉදිරිපත් විය.[6]

ස්වකීය අවසන් වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, පරීක්ෂණ කොමිෂන් සභාවෙහි නිර්දේශ කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා තවත් ඉදිරි පියවරක් වශයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් [Special Presidential Commission of Inquiry (SPCoI)] ස්ථාපිත කරන ලද අතර, එහි වර්තමාන ක්‍රියාකාරකම් මහජනයාට විවෘත නොවන අන්දමින් සිදුවේ. පෙර කී පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසාන වාර්තාවේ අයිතම අංක 08 යටතේ ලැයිස්තුගත කර ඇති දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් වැරදිකරුවන් වූවන් මත ප්‍රජා අශක්නුතා පැනවීම නිර්දේශ කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට බලය ඇති තත්වයක් නිර්මාණය වී ඇත්තේ දැනට ස්ථාපිත අධිකරණමය ආයතන සහ විමර්ශන කොමිෂන් සභාවක නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ඇති යාන්ත්‍රණයන් ද මගහරිමිනි.[7]

පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ අයිතම අංක 09 සහ 10 හි සඳහන් පැමිණිලිවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ඉල්ලා අගමැති මහින්ද රාජපක්ෂ වර්ෂ 2021 අප්‍රේල් 9 වන දින පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. මෙම යෝජනාව මේ සතියේ ම අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත. මෙම පැමිණිලිවලට සම්බන්ධ විමර්ශකයින්, නීතිඥයින්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, සාක්ෂිකරුවන් සහ වෙනත් අයට එරෙහිව අපරාධ නඩු පැවරීමට මෙම යෝජනාව ඔස්සේ අනුමැතිය ඉල්ලා සිටී. අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය අඩපණ කිරීමට බලපෑ හැකි අන්දමට දැනට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු කිහිපයක් නිෂ්ප්‍රභ කිරීමට ද එකී යෝජනාව මඟින් අනුමැතිය ඉල්ලා ඇත.[8]

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉදිරිපත් කරනු ලබන මෙම විවරණයේ අරමුණ වන්නේ දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව සහ ඉන් පසුව ස්ථාපිත කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිහිටුවීම පිළිබඳ කෙටි විශ්ලේෂණයක් සැපයීමයි. මෙහිදී, නිමාවට පත් වූ පරීක්ෂණ කොමිෂන් සභාවේ ක්‍රියාදාමයන් සහ වර්තමානයෙහි සිදු වෙමින් පවතින විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය කටයුතු වූ කලී දේශපාලනීකරණය වූ සහ ගැටළු සහගත වන අතර

---

[6] කිෂාලි පින්ටෝ-ජයවර්ධන, 'ශ්‍රී ලංකාවේ අධිකරණ ආයතන මතට 'තද වැස්සක්' වැටීමට නියමිතය' (ද සන්ඩේ ටයිම්ස්, 2021 පෙබරවාරි 7) යොමුව <http://www.sundaytimes.lk/210207/columns/a-hard-raindestined-to-fall-on-sri-lankas-institutions-of-justice-431716.html> වර්ෂ 2021 පෙබරවාරි මස 12 වන දින ප්‍රවේශ විය

[7] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, දේශපාලන පළිගැනීම් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව හා පසුව සිදුකරන ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පවතින මූලික ගැටළුකාරී තත්වයන්, යොමුව <https://www.cpalanka.org/initial-concerns-with-the-report-of-the-commission-of-inquiry-toinvestigate-allegations-of-political-victimization-and-subsequent-action/> වර්ෂ 2021 මාර්තු මස 28 වන දින ප්‍රවේශ විය

[8] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 'දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව වෙත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව පිළිබඳ කෙටි සටහන'. යොමුව <https://www.cpalanka.org/short-note-on-the-resolution-seeking-parliamentary-approval-toimplement-the-recommendations-of-the-coi-on-political-victimization/ > වර්ෂ 2021 අප්‍රේල් මස 19 වන දින ප්‍රවේශ විය

එමඟින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් මෙන්ම අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි බරපතල ගැටළු සහගත තත්වයන් උද්ගත විය හැකි බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉතා අවධාරණයෙන් සටහන් කරනු ලැබේ. කෙසේ නමුත්, මෙම විවරණය වූ කලී පරීක්ෂණ කොමිෂන් සභාව සහ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිළිබඳ පරිපූර්ණ විශ්ලේෂණයක් නොවන බව සැලකිල්ලට ගත යුතුය. පරීක්ෂණ කොමිෂන් සභාවෙහි සහ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කටයුතු හා ප්‍රතිඵල සම්බන්ධයෙන් විවේචනාත්මකව කටයුතු කිරීමට සුදුසු පසුබිමක් සැකසීම සඳහා පහසුකාරීත්වයක් මෙම විවරණය ඔස්සේ ලබා දෙනු ඇති බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලාපොරොත්තු වේ.

මෙම විවරණය කොටස් දෙකකින් සමන්විත වේ. විවරණයේ පළමු කොටස මඟින් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවෙහි පසුබිම සහ නෛතික රාමුව පිළිබඳ දළ විශ්ලේෂණයක් ලබාදෙනු ලබන අතර, පසුව කාලානුරූපව සලකුණු කරන ප්‍රධාන දිනයන් සහ එහි කටයුතු වල ප්‍රගතිය සහ පරීක්ෂණ කොමිෂන් සභාවෙහි ප්‍රධාන නිර්දේශ සහ ඒවායේ ප්‍රතිවිපාකයන් ලැයිස්තුගත කරන ලද වගුවක් ඉදිරිපත් කෙරේ. මෙම විවරණයෙහි දෙවන කොටස ඔස්සේ පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් විමසුමට ලක් කිරීමක් සිදු කරනු ලබන අතර මීට පෙර විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවල නෛතික රාමුවේ දළ සටහනක් ද ඇතුළත් කරනු ලබන අතරම දැනට ක්‍රියාත්මක වන විමර්ශන කටයුතු පිළිබඳ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්ය කර්තව්‍යයන් සම්බන්ධයෙන් වන බලතල පිළිබඳව ද කරුණු ඉදිරිපත් කෙරේ.

# 1 වන කොටස - දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව

පළමුවන කොටස පරීක්ෂණ කොමිෂන් සභාවේ පසුබිම විමසා බලා එහි කටයුතු වලට අදාළ වැදගත් සංධිස්ථානයන් පිළිබඳ කාලරාමුවක් සපයනු ලබයි. එමෙන්ම, කොමිෂන් සභාවෙහි අතිශය පුළුල් බලතල රාමුව, ස්වාධීනත්වයක් නොමැතිකම සහ වර්තමානයෙහි සිදුවෙනමින් පවතින නීතිමය ක්‍රියාමාර්ග සහ විමර්ශන සම්බන්ධයෙන් වන ප්‍රතිවිපාකයන් ද ඇතුළුව නිමාවට පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවෙහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් තත්වය පෙන්වා දීම සඳහා එකී පරීක්ෂණ කොමිෂන් සභාවෙහි නෛතික රාමුව සහ ප්‍රධාන නිර්දේශයන් පිළිබඳ කෙටි විස්තරයක් ද මෙම කොටසට ඇතුළත් ය.

## පසුබිම

දේශපාලන විරුද්ධවාදීන් ඉලක්ක කර ගැනීම, වගවීම සඳහා වන ඉල්ලීම් වලින් ඈත්වීම සහ සාක්ෂි විකෘති කිරීම සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන් අතීතයේ දී භාවිත කර ඇත. එසේම, අධිකරණ ක්‍රියාදාමයන් සහ පොලිස් පරීක්ෂණ ප්‍රමාද වීමටත්, වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට ඇති අවදානම වැඩි කිරීමටත් එවන් කොමිෂන් සභාවන් හේතු වී තිබේ.[9] පෙර පැවති පරීක්ෂණ කොමිෂන් සභාවල නිර්දේශයන් හේතුවෙන් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ දූෂණ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව නඩු පැවරීමට නොහැකි වී තිබේ.[10] මීට පෙර පැවති ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන්හි[11] ස්වාධීනත්වයේ අඩු ලුහුඬුකම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජාත්‍යන්තර ප්‍රජාවේ සාමාජිකයින් ඇතුළු විවිධ ක්‍රියාකාරීන් විසින් විවේචනය කර ඇත.

නිදසුනක් වශයෙන්, වර්ෂ 2006 දී පිහිටුවන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය කිරීම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව අධීක්ෂණය කිරීම සඳහා පිහිටුවන ලද ජාත්‍යන්තර ස්වාධීන ප්‍රවීණ පුද්ගලයින්ගේ කණ්ඩායම (International Independent Group of Eminent

[9] ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්, 'විසි වසරක මිත්‍යාව: ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිෂන් සභාවන් (2009), යොමුව <https://www.amnesty.org/download/Documents/48000/asa370052009eng.pdf> වර්ෂ 2021 පෙබරවාරි මස 12 වන දින ප්‍රවේශ විය

[10] ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්, 'පැරණි අවතාර අලුත් ඇඳුමින්: ශ්‍රී ලංකාවේ භීතිය නැවත පැමිණීම' පිටුව 21, යොමුව <https://www.amnesty.org/download/Documents/ASA3736592021ENGLISH.PDF> වර්ෂ 2021 මාර්තු මස 21 වන දින ප්‍රවේශ විය

[11] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව: ප්‍රවණතා, පරිචයන් සහ ප්‍රතිවිපාකයන් (2014 දෙසැම්බර්) බලන්න. යොමුව https://www.cpalanka.org/the-presidential-commission-to-investigate-into-complaints-regarding-missing-persons-trends-practices-and-implications/ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, අතුරුදහන් වූවන් විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිසම පිළිබඳ විවරණයක් (2014 මාර්තු), යොමුව https://www.cpalanka.org/a-commentary-onthe-presidential-commission-to-investigate-missing-persons/

Persons - IIGEP), විසින් පෙන්වා දෙන ලද්දේ, "ජාත්‍යන්තර සම්මතයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව මානව හිමිකම් සම්බන්ධයෙන් විමර්ෂණයන් පැවැත්වීමට ශ්‍රී ලංකාවට ආයතනික වශයෙන් හැකියාවක් සහ දේශපාලන අධිෂ්ඨානයක් නොමැතිකම සම්බන්ධයෙන් ස්වකීය කනස්සල්ල පෙන්වා දෙන ලදි."[12]

එපමණක් නොව, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා විසින් (United Nations High Commissioner for Human Rights) වර්ෂ 2015 දී නිකුත් කළ වාර්තාවේ[13] මෙසේ සඳහන් වන්නේ ''එහි විමර්ශනය අතරතුර, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය විසින් වර්ෂ 2006 උදලාගම කොමිසම සහ වර්ෂ 2012 යුද හමුදා විමර්ශන අධිකරණය ඇතුළුව ප්‍රකාශයට පත් නොකළ දේශීය පරීක්ෂණ කිහිපයක වාර්තා වෙත ප්‍රවේශය ලබා ගත්තේය. මෙම වාර්තා මගින් මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය ඔවුන්ගේ ස්වාධීනත්වයේ අඩු ලුහුඬුකම් සම්බන්ධයෙන් ස්වකීය කනස්සල්ල සනාථ කරනු ලබයි...'' පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද සමරසිංහ විසින් මෙම වාර්තාව පිළිබඳ පාර්ලිමේන්තු විවාදයේදී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ස්වකීය කනස්සල්ල පළ කළ බව අවධාරණය කරන ලදි. තවද, පරණගම කොමිෂන් සභාව සම්බන්ධයෙන් ද එම සඳහනම කළ බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.[14]

දේශපාලන පළිගැනීම් පරීක්ෂණ කොමිෂන් සභාව පිහිටවූ දා සිට, එය අවස්ථා කිහිපයකදීම ක්‍රියාත්මක වෙමින් පවතින අධිකරණ කටයුතුවලට බාධා කිරීමට උත්සාහ කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස නීතිපති දෙපාර්තමේන්තුව සමඟ ගැටුම්කාරී තත්වයක් ඇති විය. නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට සිතාසි නිකුත් කිරීම සම්බන්ධයෙන් ගත් කල, තොරතුරු සෙවීමේ ආයතනයක් ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව[15] එහි බලතල ඉක්මවා ඇති බවත් එබැවින් එය වලංගු නොවන බවත් නීතිපතිවරයා විසින් කොමිෂන් සභාවට දැනුම් දී තිබේ.[16]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති සාධාරණ නඩු විභාගකට ඇති අයිතිවාසිකම් සහ රජය විසින් පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහතික කිරීමේ වගකීම මඟ හැරීම සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු විවේචනයට ලක් විය. පරීක්ෂණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් වරප්‍රසාද

---

12 ජාත්‍යන්තර ස්වාධීන ප්‍රවීණ පුද්ගලයින්ගේ කණ්ඩායමෙහි (International Independent Group of Eminent Persons - IIGEP) අවසන් වාර්තාව, යොමුව <http://www.humanrights.asia/wp-content/uploads/2018/07/The-Final-Report-of-the-IIGEP.pdf> වර්ෂ 2021 අප්‍රේල් මස 5 වන දින ප්‍රවේශ විය

13 11 වන පිටුවෙහි 57 වන ඡේදය

14 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, හැන්සාඩ් (2015.10.22), යොමුව <https://www.parliament.lk/uploads/documents/hansard/1446089031089971.pdf> පිටුව 1014

15 සුල්ෆික් ෆර්සාන්, 'පරීක්ෂණ කොමිසම අධිකරණ විනිශ්චය සභාවක් නොව කරුණු සෙවීමේ මණ්ඩලයක්; නීතිපති (නිව්ස්ෆර්ස්ට්, 2020 ජූනි 23), යොමුව <https://www.newsfirst.lk/2020/06/23/coi-not-a-judicial-tribunal-but-a-fact-finding-bodyag-complete-letter-to-coi/> වර්ෂ 2021 පෙබරවාරි මස 12 වන දින ප්‍රවේශ විය

16 ඩේලි පෝස්ට් එල්.කේ., 'දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවට නීතිපතිවරයා පවසයි. නීතිපති දෙපාර්තමේන්තු නිලධාරීන් කැඳවීමට එයට බලයක් නැත' (ඩේලි පෝස්ට් එල්කේ, 2020 ජූනි 23), යොමුව <https://www.dailypost.lk/ag-tells-coi-on-politicalvictimisation-it-has-no-mandate-to-summon-ag-dept-officials/> වර්ෂ 2021 පෙබරවාරි මස 12 වන දින ප්‍රවේශ විය

ප්‍රශ්නයක් මතු කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා වරෙක පවසන ලද්දේ, ''කොමිෂන් සභාවට පැමිණීමට වරින් වර මට කොමිෂන් සභාවෙන් සිතාසි ලැබී තිබේ. එම කැඳවීමේදී මා වගඋත්තරකරුවෙකු ලෙස නම් කර ඇත. ඒවා සිංහල භාෂාවෙන් පැවති බැවින් ප්‍රතිචාර දැක්වීමට හා එම කරුණු ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තන කිරීමට යැවීමට මට අවශ්‍ය තොරතුරු ලබා දෙන ලෙස මම කොමිෂන් සභාවට ලිඛිතව දැන්වුවෙමි. මම එම කොමිසම ඉදිරියේ දෙවරක් පෙනී සිටිමින් එම ඉල්ලීම ම කළෙමි. එහිදී මට කොමසාරිස්වරයා නියෝග කරන ලද්දේ මා හට ලේඛන හා ඒවායේ පරිවර්තන ලබා දෙන ලෙසයි. එවැනි කිසිවක් සිදු නොවීය.''[17]

පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම පිළිබඳව විපක්ෂය විසින් ස්වකීය කනස්සල්ල පළ කරන ලදි. ප්‍රධාන විපක්ෂයේ සංවිධායක හා මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පවසන ලද්දේ, ''දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ මත දඬුවම් තීරණය කිරීම සඳහා තවත් ජනාධිපති පරීක්ෂණ කොමිසමක් පත් කර තිබේ. එයට ලබා දී ඇත්තේ මාස තුනක් වූ කාලයක් පමණි. ඒ වන විට අප එය පාර්ලිමේන්තුවේ විවාදයට ගත යුතු අතර එම වාර්තාවල අන්තර්ගතය දැන ගත යුතුය. ඒවා සභාගත නොකිරීමෙන් ක්‍රියාවලිය ප්‍රමාද කිරීම අසාධාරණ ය.''[18]

පාර්ලිමේන්තුවේදී විවාදයට දිනයක් නම් කරන ලෙස විපක්ෂය විසින් කරන ලද ඉල්ලීම් ගණනාවකට අනුව,[19] පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව වර්ෂ 2021 මාර්තු 9 දින සභාගත කරන ලදි.[20]

---

[17] සමන් ඉන්ද්‍රජිත්, 'සුමන්තිරන්ගේ වරප්‍රසාද ප්‍රශ්නය පාර්ලිමේන්තු ආචාර ධර්ම හා වරප්‍රසාද කමිටුවට යොමු කරන ලදි' (ද අයිලන්ඩ්, 2021 පෙබරවාරි 11), යොමුව <https://island.lk/sumanthirans-privilege-issuereferred-to-parliamentary-ethics-and-privileges-committee/> වර්ෂ 2021 පෙබරවාරි මස 15 වන දින ප්‍රවේශ විය

[18] සමන් ඉන්ද්‍රජිත්, ''පාස්කු සංහාරය සහ දේශපාලන පළිගැනීම් පිළිබඳ විශේෂ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස විපක්ෂය රජයෙන් ඉල්ලා සිටී (ද අයිලන්ඩ්, 2021 පෙබරවාරි 11), යොමුව <https://island.lk/opposition-urges-govt-totable-pcoi-reports-on-easter-carnage-and-political-victimisation/> වර්ෂ 2021 පෙබරවාරි මස 15 වන දින ප්‍රවේශ විය

[19] 'දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම විපක්ෂය විසින් ප්‍රශ්න කරයි' (කොළඹ ගැසට් පත්‍රය, 2021පෙබරවාරි 18), යොමුව <https://colombogazette.com/2021/02/18/opposition-questions-failure-to-table-report-on-politicalvictimization/> වර්ෂ 2021 පෙබරවාරි මස 15 වන දින ප්‍රවේශ විය

[20] සඳසෙන් මාරසිංහ, 'දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් වාර්තාව සභාගත කරන ලදි (ඩේලි නිවුස්, 2021 මාර්තු 10), යොමුව <http://dailynews.lk/2021/03/10/political/243600/political-victimisation-commissionreport-tabled> වර්ෂ 2021 පෙබරවාරි මස 28 වන දින ප්‍රවේශ විය




### 2020 ජනවාරි 9

2015-2019 කාලය තුළ දේශපාලන පළිගැනීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පත් කිරීම.

### 2020 ජනවාරි 20

පරීක්ෂණ කොමිෂන් සභාවේ මූලික කාර්යයන් සංශෝධනයට ලක් කරමින් ඊට පුළුල් බලතලලබා දෙන ලදි. පරීක්ෂණ කොමිෂන් සභාවට පළමු පැමිණිල්ල ලැබීම.

### 2020 ජනවාරි 27

හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ සහ වෙනත් අයට එරෙහිව පැවති නඩුවෙහි ඉදිරි කටයුතු නිත්‍ය මහාධිකරණය විසින් ඉදිරියට යාම වළක්වන නියෝගයක් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ අතර පැහැරගැනීම් සම්බන්ධයෙන් චෝදනා ලැබූ නාවික හමුදා නිලධාරීන් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් පැවති විමර්ශන සහ චෝදනා ගොනු කිරීම්, ප්‍රගීත් එක්නැලිගොඩ පැහැර ගැනීම සම්බන්ධයෙන් චෝදනා ලැබූ හමුදා නිලධාරීන්ට එරෙහි නඩු පැවරීම, සහ අලි ජාවාරම සඳහා නිරාජ් රොෂාන්ගේ නොහොත් ''අලි රොෂාන්'' ට එරෙහි නඩු විභාගය ද ඇතුළුව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් විමර්ශන පවත්වන නඩු සම්බන්ධ විභාග කිරීම සහ නඩු පැවරීම් අත්හිටුවන ලෙස නීතිපතිවරයාට දන්වා සිටියහ.

### 2020 ජනවාරි 29

ඉහත නඩුවේදී ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීමෙන් වළකින ලෙස නීතිපතිවරයාට නියෝග කිරීමට පරීක්ෂණ කොමිෂන් සභාවට ව්‍යවස්ථාපිත හෝ නීතිමය බලයක් නොමැති බව නීතිපතිවරයා විසින් විමර්ශන කොමිෂන් සභාවට ලිඛිතව දැනුම් දෙන ලදි.

**2020 පෙබරවාරි 7**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂ විසින් පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දී ඇති පුළුල් බලතල අභියෝගයට ලක් කරමින් මූලික අයිතිවාසිකම් අයදුම්පතක් ගොනු කරන ලදි.

**2020 පෙබරවාරි 17**

පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය කටයුතු ඇරඹීම.

**2020 මාර්තු 3**

"අලි රොෂාන්" සහ තවත් හත් දෙනෙකුට එරෙහිව අලි ජාවාරම් කිරීම පිළිබඳ නඩු විභාගය මෙහෙය වූ ත්‍රිපුද්ගල මහාධිකරණය විසින්, පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් පර්ල් වීරසිංහට වර්ෂ 2020 මාර්තු 6 වන දින අධිකරණයෙහි පෙනී සිටින ලෙස නියෝගයක් නිකුත් කරන ලද්දේ එකී නඩුවට අදාල ලිපි ගොනු සම්බන්ධයෙනි.

**2020 මාර්තු 6**

අදාල සිකුරාදා දින වීරසිංහ අධිකරණයට නොපැමිණි අවස්ථාවේදී අධිකරණය ඇයව අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් විනිසුරු මඬුල්ලක් විසින් නිකුත් කරන ලදි. ත්‍රිපුද්ගල විනිසුරු මඬුල්ල සඳහන් කරන ලද්දේ මෙවැනි කොමිෂන් සභාවන් ලේඛන සම්බන්ධයෙන් ඒ අයුරින් නම් ක්‍රියා කරනු ලබන්නේ එහි දී අධිකරණයන්හි කටයුතු කිරීමට නොහැකිව අක්‍රීය විය හැකි බවයි.

ඊට ක්ෂණික ප්‍රතිචාරයක් වශයෙන්, මාර්තු 11 දින පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටින ලෙස නීතිපතිට කැඳවීමක් කරන ලදි. එහි දී විමර්ශන කොමිෂන් සභාව සඳහන් කරන ලද්දේ එකී නඩුව සම්බන්ධයෙන් කොමිෂන් සභාවෙහි විමර්ශන අවසන් වන තෙක් නීතිපතිවරයාගේ කටයුතු අත්හිටුවන ලෙසට නියෝගයක් ලබා දී තිබියදීත් එය උක්ත අධිකරණ නියෝගය තුළින් නීතිපතිවරයා විසින් හිතාමතාම ස්වකීය සීමාව ඉක්මවා යාමට ගත් උත්සාහයක් බවටය.

**2020 මාර්තු 11**

පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ නීතිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න මහතා ලිඛිත ප්‍රතිචාරයක් ලබා දෙමින් කියා සිටියේ නීතිපතිවරයාගේ කාර්ය කර්තව්‍යයන් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණ බලයක් හෝ අධිකාරිත්වයක් විමර්ශන කොමිෂන් සභාවට නොමැති බවයි.

**2020 ජූනි 17**

ඇවන්ගාඩ් ආයුධ ජාවාරම් නඩුවේ තමන්ගේ කාර්යයන් පිළිබඳව කරුණු දැක්වීමට පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටින ලෙස ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ ජනක බණ්ඩාරට නොතීසි හා දැනුම් දීමක් කරන ලදි.

**2020 ජූනි 22**

නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධයෙන් සිතාසි හෝ නොතීසි නිකුත් කිරීමට බලයක් නොමැති බවත් එවැනි ක්‍රියාමාර්ගයක් නීති විරෝධී සහ අවලංගු බවත් නීතිපතිවරයා විසින් පරීක්ෂණ කොමිෂන් සභාවට දැනුම් දෙන ලදි.

### 2020 ජූලි 8

අංක 2183/26 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් පරීක්ෂණ කොමිෂන් සභාවේ කාලය මාස හතරකින් දීර්ඝ කරනු ලබයි.

### 2020 සැප්තැම්බර් 2

දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශනය කිරීමේ පරීක්ෂණ කොමිෂන් සභාවේ මූලික වාර්තාව අගමැති මහින්ද රාජපක්ෂ වෙත භාර දෙන ලදි.

### 2020 නොවැම්බර් 6

විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පස් දෙනෙකු විසින් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු දූෂිත යැයි චෝදනා කරමින් පැමිණිල්ලක් අල්ලස් සහ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවට ගොනු කරන ලදි.

### 2020 නොවැම්බර් 7

පරීක්ෂණ කොමිෂන් සභාවට අපහාස කිරීමේ චෝදනාව මත අදාල පැමිණිලිකරුවන්ට පොලිසියෙහි පෙනී සිට ඔවුන්ගේ පැමිණිලි පිළිබඳ කරුණු දක්වන ලෙසට දැන් වූ අතර අල්ලස් සහ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව පාලනය වන නීතිය යටතේ එසේ එවැනි පැමිණිල්ලක් පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ නොකර සිටීමේ අයිතිය ඇත.

### 2020 නොවැම්බර් 9

විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කැඳවනු ලැබූ අතර ඔවුන්ට එරෙහිව අභියාචනාධිකරණයෙහි අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව තීරණය කර ඇති බව දැනුම් දෙන ලදි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් අංක 2201/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් පරීක්ෂණ කොමිෂන් සභාවේ ධූර කාලය දින 16 කින් දීර්ඝ කරන ලදි.

### 2020 නොවැම්බර් 28

පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන් විසින් පරීක්ෂණ කොමිෂන් සභාව පිළිබඳ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරමින් ප්‍රකාශ කළේ පරීක්ෂණ කොමිෂන් සභාවේ ක්‍රියාපටිපාටීන් මගහැරී බවට වැරදි ලෙස තමන්ව හැඳින්විය හැකි බවයි.

### 2020 දෙසැම්බර් 8

පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව ජනාධිපතිතුමාට බාර දෙන ලදි.

### 2021 ජනවාරි 19

පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දේ.

### 2021 ජනවාරි 29

පරීක්ෂණ කොමිෂන් සභාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව පත් කරන ලදි.

**2021 පෙබරවාරි 10**

කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ප්‍රකාශ කළේ පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන්ගේ පැමිණිල්ල ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ පාර්ලිමේන්තු කමිටුවට යොමු කළ හැකි බවයි.

**2021 පෙබරවාරි 11**

සමගි ජන බලවේගය විසින් පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙසට රජයෙන් ඉල්ලා සිටි අතර එකී වාර්තාවෙහි නිර්දේශ මත මාස තුනක් ඇතුළත දඬුවම් නියම කිරීම සඳහා තවත් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිසමක් සභාවක් ස්ථාපිත කිරීමේ තීරණය ද අවධාරණය කරන ලදි.

**2021 පෙබරවාරි 18**

විපක්ෂය විසින් නැවත නැවතත් කරන ලද ඉල්ලීම් නොසලකා පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය අසමත් වීම පිළිබඳව විපක්ෂය ප්‍රශ්න කරන ලදි.

**2021 මාර්තු 01**

පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව වහාම නිකුත් කරන ලෙස ජනතා විමුක්ති පෙරමුණ රජයෙන් ඉල්ලා සිටියේය. ජනතා විමුක්ති පෙරමුණ තවදුරටත් පැවසුවේ, ජනාධිපති මහලේකම් කාර්යාලයෙහි තොරතුරු නිලධාරී විසින් පෙබරවාරි 8 වන දින එකී වාර්තාව ලබා දිය නොහැකි බවට දැනුම් දී තිබූ බවය.

**2021 මාර්තු 02**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාව යටතේ පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයින්ට එරෙහිව විමර්ශනය කරන ලෙස ඉල්ලා සමගි ජන බලවේගයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 40 දෙනෙකු ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළහ. එකී පෙත්සමට ප්‍රකාරව, පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇති ඇතැම් නිර්දේශයන් ඔස්සේ අධිකරණයට අපහාස කිරීමක් සිදුවන බව පෙන්වා දෙනු ලැබීය.

**2021 මාර්තු 07**

ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමයෙහි හිටපු සභාපතිවරුන් ද වූ ජ්‍යෙෂ්ඨ නීතිඥයින් විසින් ස්වකීය"බරපතල කනස්සල්ල" ප්‍රකාශ කරමින් පෙන්වා දෙන ලද්දේ පරීක්ෂණ කොමිෂන් සභාවෙහි වාර්තාවේ අන්තර්ගතය ඔස්සේ "මේ රටේ නීතියේ ආධිපත්‍යයට, අධිකරණයෙහි ස්වාධීනත්වයට හානි කරනු ලබන්නා සේම නීතිපති දෙපාර්තමේන්තුවේ අපක්ෂපාතී හා කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට ද හානිදායක වන බවයි."

**2021 මාර්තු 09**

පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවෙහි සභාගත කරන ලදි.

**2021 මාර්තු 12**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු සිවිල් සමාජ සංවිධාන විසින් පරීක්ෂණ කොමිෂන් සභාවේ සොයා ගැනීම් සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වයන් පිළිබඳ ස්වකීය අවධානය යොමු කිරීම.

**2021 අප්‍රේල් 01**

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ බලතල අප්‍රේල් මස 1 වන දිනැති අංක 2221/54 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් දීර්ඝ කරන ලදි.

**2021 අප්‍රේල් 09**

පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථාදායක අනුමැතිය ඉල්ලා අගමැතිවරයා විසින් පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන ලදි.

# නෛතික රාමුව සහ අදාළ ගැටළු

## 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත

වර්ෂ 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත (සංශෝධිත) යටතේ පරීක්ෂණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදි.[21] එම පනතේ 2 වන වගන්තිය යටතේ, පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට අවශ්‍ය යැයි හැඟෙන සෑම අවස්ථාවකදීම විමර්ශනයක් හෝ පරීක්ෂණයක් හෝ ඒ දෙකම සුදුසු පරිදි පැවැත්විය යුතු බවට සහ පහත තොරතුරු ලබා ගැනීම පිණිස පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත.

- රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක්, ඕනෑම ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, ඕනෑම රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක් හෝ වෙනත් ආයතනයක පරිපාලනය, කළමනාකරණය සහ කාර්යයන් සම්බන්ධයෙන්

- ඕනෑම රාජ්‍ය නිලධාරියෙකුගේ, ව්‍යවස්ථාපිත ආයතනයක, ඕනෑම රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක හෝ ඕනෑම ආයතනයක සේවකයෙකුගේ හැසිරීම සම්බන්ධයෙන්

- ඔහුගේ මතය අනුව ජාතික අවශ්‍යතාවයන් හෝ මහජන ආරක්ෂාව හෝ යහපැවැත්ම සඳහා වන ඕනෑම කාරණයක් හෝ සිද්ධියක් සම්බන්ධයෙන්

පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක බලතල පනතේ 7 වන වගන්තියේ දක්වා ඇත.

1. සාක්ෂි ලබා ගැනීම සහ  සාක්ෂිකරුවන් ප්‍රශ්න කිරීම.

2. දිවුරුම් දීම හෝ සහතික කිරීම මත ඕනෑම සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි ලබා දීම ඉල්ලා සිටීම

3. ඕනෑම අධිකරණයක හෝ විනිශ්චය සභාවක ගොනු කර ඇති හෝ වාර්තාගත කර ඇති යම් ලේඛනයක්/ද්‍රව්‍යයක් ලබා ගැනීම සඳහා ඕනෑම අධිකරණයකට හෝ විනිශ්චය සභාවකට අයදුම්පතක් ඉදිරිපත් කිරීම.

[21] වර්ෂ 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත, යොමුව
<https://www.lawlanka.com/lal/consolidationFullView?selectedAct=1981Y1V8C&searchPage=false>

4. කිසියම් පුද්ගලයෙකු සතු කිසියම් ලේඛනයක් හෝ ඔහු සන්තකයේ ඇති වෙනත් ද්‍රව්‍යයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම.

5. ඕනෑම පුද්ගලයෙකුට තමා සන්තකයේ තිබිය හැකි තොරතුරු ලිඛිතව ලබා දෙන ලෙස ඉල්ලා සිටීම.

6. ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ඕනෑම තැනැත්තකු කොමිෂන් සභාවේ ඕනෑම රැස්වීමකට සාක්ෂි දීමට හෝ ඔහු සන්තකයේ කිසියම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට කැඳවීම සහ ඔහු සාක්ෂිකරුවෙකු ලෙස විභාග කිරීම.

7. සාක්ෂි ආඥා පනතේ කවර විධිවිධානයක් පැවතියද, සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලදී අනුමත කළ නොහැකි ඕනෑම සාක්ෂියක් පිළිගැනීම.

8. විමර්ශන කටයුතු මහජනයාට විවෘත කිරීම හෝ විමර්ශන කටයුතු වලින් මහජනයා බැහැර කිරීම සහ විමර්ශන කටයුතු වලදී මාධ්‍ය කැඳවීම හෝ බැහැර කිරීම

9. විමර්ශනයට භාජනය වන්නේ යම් පුද්ගලයකුගේ ක්‍රියාවක් ද නැතහොත් විමර්ශනයට භාජනය වන කාරණය සම්බන්ධයෙන් කිසියම් ආකාරයකින් අදාළත්වයක් ඇති හෝ සැලකිලිමත්භාවයක් පෙන්වනු ලබන ඕනෑම පුද්ගලයෙකුට එවැනි පුද්ගලයකු විසින් අදාළ විමර්ශනය සම්බන්ධයෙන් සාධාරණව දැරීමට සිදු වූ මුදල් හා වියදම් ප්‍රදානය කළ යුතු යැයි නිර්දේශ කිරීම.

10. විමර්ශනය කිරීමට කොමිසමට බලය පැවරූ පරිදි අදාල විමර්ශනයට භාජනය වන්නේ යම් පුද්ගලයකුගේ ක්‍රියාවක් ද නැතහොත් විමර්ශනයට භාජනය වන කාරණය සම්බන්ධයෙන් කිසියම් ආකාරයකින් අදාළත්වයක් ඇති හෝ සැලකිලිමත්භාවයක් පෙන්වනු ලබන ඕනෑම පුද්ගලයෙකු සම්බන්ධයෙන් සුදුසු විනය ක්‍රියාමාර්ගයන් ගැනීමට අදාළ අධිකාරී ආයතනය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

පනතේ 8 වන වගන්තිය යටතේ, අදාළ කොමිසම මගින් ඉල්ලා සිටින්නේ නම්, මෙම පනත යටතේ පත් කරන ලද කොමිෂන් සභාවකට ජනාධිපතිවරයා විසින් පහත සඳහන් බලතල ලබා දිය හැකිය.

1. ඕනෑම පුද්ගලයෙකුගේ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කොමිෂන් සභාවක් විසින් සිදුකිරීමේ දී එවන් තැනැත්තකුගේ හෝ එම පුද්ගලයාගේ කලත්‍රයාගේ හෝ දරුවකුගේ බැංකු ගිණුමකට අදාළ ගනුදෙනු කිරීම් ඇතුළත් ඕනෑම ලේඛනයක් ලබා දෙන ලෙසට ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකුවක කළමනාකරුවකුට ලිඛිත දැනුම්දීමකින් ඉල්ලා සිටීමට බලය.

2. ඕනෑම පුද්ගලයෙකුගේ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කොමිෂන් සභාවක් විසින් සිදුකිරීමේ දී එවන් තැනැත්තකුගේ හෝ එම පුද්ගලයාගේ කලත්‍රයාගේ හෝ දරුවකුගේ කටයුතු

සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන මෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ලිඛිත දැනුම්දීමකින් ඉල්ලා සිටීමට ඇති බලය.

පනතේ 10, 11 සහ 12 වගන්ති යටතේ කොමිෂන් සභාවට අපහාස කිරීම හෝ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද නොතීසි වලට අවනත නොවීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව අභියාචනාධිකරණය හරහා දඬුවම් ලැබිය හැකි තත්වයකි. මෙම පනතේ 18 වන වගන්තියට අනුව, කොමිෂන් සභාවක කිසිදු සාමාජිකයෙකු සද්භාවයෙන් සිදුකරන ලද හෝ නොකර හරින ලද කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමක් සිදු නොකළ යුතුය.

## කාර්යයන්

දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාව වර්ෂ 2020 ජනවාරි 9 වන දින අංක 2157/44 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පත් කරන ලදී. වර්ෂ 2020 ජනවාරි 22 වන දින අංක 2159/16 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් එකී කොමිෂන් සභාවෙහි මුල් කාර්යයන් සංශෝධනය කරන ලදී.

පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් පහත පරිදි වේ,

2015 ජනවාරි 8 සිට 2019 නොවැම්බර් 16 දක්වා කාලය තුළ දේශපාලන පළිගැනීම් යැයි කියනු ලබන චෝදනා පිළිබඳ තොරතුරු විමසා තොරතුරු ලබා ගැනීම.

(අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය පරිපාලනය සම්බන්ධයෙන් යම් අයථා ක්‍රියා හෝ අක්‍රමිකතා නැතහොත් ඊට අදාළ වන නිසි පිළිවෙත්, ප්‍රතිමාන, මාර්ගෝපදේශ, කාර්ය පටිපාටීන් සහ ප්‍රශස්ථ පරිචයන් නොසලකා හැරීමක් සිදු වී තිබේ ද යන වග;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය විසින් කෙරුණු කිසියම් විමර්ශනයන් කෙරෙහි කවර වූ ආකාරයකින් බලපෑම් කිරීමක්, අවහිර කිරීමක් හෝ වළක්වාලීමක් සිදු කිරීම හේතු කොටගෙන කිසියම් තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට සෘජුව හෝ ව්‍යංගයෙන් හානියක්, අලාභයක්, පීඩාවක් හෝ අනර්ථයක් සිදුව තිබේ ද යන වග;

(ඇ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය

විසින් විමර්ශනයන් පැවැත්වීමේ කාර්යය පවරනු ලැබූ කිසියම් නිලධරයෙක් ඉහත කී දූෂණ විරෝධී ඒකකය ඇතුළු තෙවන පාර්ශවයන් විසින් කෙරුණු අයුතු බලපෑම යටතේ ක්‍රියාකර තියේ ද යන වග;

(ඇ) ඉහත කී දූෂණ විරෝධී ඒකකය, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකයෙහි කාර්යයන්ට අදාළව නැතහොත් කිසියම් නීතියක් පසිඳලීම හෝ යුක්තිය පසිඳලීමට අදාළව කිසියම් තැනැත්තෙක් දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ දී බලය අනිසි ලෙස යෙදවීමක්, අවභාවිත කිරීමක්, දූෂණ හෝ කිසියම් වංචනික ක්‍රියාවක් සිදු කර තිබේ ද යන වග;[22]

2020 ජනවාරි 22 දින අංක 2159/16 ගැසට් පත්‍රය මගින් එම පරීක්ෂණ කොමිෂන් සභාවට මුලින් පවරා තිබූ බලතල සංශෝධනය කරන ලදි. ඉහත සඳහන් ආයතන විසින් දේශපාලන පළිගැනීම් වලට ලක් කිරීම සහ බලය අනිසි ලෙස භාවිතා කිරීම හෝ අයුතු ලෙස පරිහරණය කිරීම යන චෝදනා විමර්ශනය කිරීමේ බලයට අමතරව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ ක්‍රියාමාර්ග විමර්ශනය කිරීමේ බලය ද පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දී ඇත.

ත්‍රිවිධ හමුදා සහ ශ්‍රී ලංකා පොලිසිය හා රාජ්‍ය සේවයට අදාළව ජාතික ආරක්ෂාව සහ / හෝ රාජ්‍ය සේවයට අහිතකර ලෙස බලපාන විමර්ශන, පරීක්ෂණ සහ නීතිමය කටයුතු වලදී අගතියක් ඇතිවීම වැළැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීමට ද පරීක්ෂණ කොමිෂන් සභාවට නියම කෙරිණි.[23] විමර්ශන කොමිෂන් සභාවේ සංශෝධිත බලතල මගින් හඳුන්වා දුන් වගන්තිය (ඉ) ඉහත සඳහන් ආයතනවලට පහතින් පෙන්වා දී ඇති අන්දමට බලය පවරයි.

> "2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළදී උක්ත ආයතන වෙත ඉදිරිපත්වී ඇති පැමිණිලි අතරින් මෙම අධිකාරී පත්‍රයේ සඳහන් උක්ත දූෂණ විරෝධී ඒකකය විසින් විමර්ශනයට භාජනය කළ යුත්තේ කවර තැනැත්තෙකු ද යන වග පළමුව තීරණය කොට අනතුරුව විමර්ශන ආරම්භ කළේ යැයි සැළකෙන සියළු පැමිණිලි හා ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති ජාතික ආරක්ෂාවට බලපානු ලබන පැමිණිලි කවරේදැයි සොයා බලා, එකී තුන්වන පාර්ශවයේ බලපෑම් හේතුවෙන් නීතිය පසිඳලීමේ දී හෝ යුක්තිය පසිඳලීමේ දී යම් තැනැත්තෙකු අගතියට පත්වන්නේ යැයි සැළකෙන පරීක්ෂණ,

[22] 2021 ජනවාරි 9 වන දිනැති අංක 2157/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2020/1/2157-44_S.pdf>

[23] 2020 ජනවාරි 22 වන දිනැති අංක 2159/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2020/1/2159-16_S.pdf

විමර්ශන හෝ *නීති කටයුතු වලදී,* ත්‍රිවිධ හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය හා රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන පරීක්ෂණ, විමර්ශන හෝ නීති කටයුතු වලදී සහ / හෝ අන් කවර වූ හෝ *ආකාරයකින් අගතියට පත්වී ඇතැයි සලකනු ලබන අවස්ථාවලදී එලෙස අගතියට පත්වීම හෝ ජාතික ආරක්ෂාවට හා රාජ්‍ය සේවාවන්ට වන අහිතකර බලපෑම වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික පියවර ගැනීම;*''[24]

පරීක්ෂණ කොමිෂන් සභා පනත (සංශෝධිත පරිදි) මඟින් පෙන්වා දී ඇති විධිවිධාන ප්‍රකාරව බලන කල, ඒ යටතේ යම් පරීක්ෂණ කොමිෂන් සභාවකට නීත්‍යානුකූලව ලබා දිය හැකි බලතල වල සීමාවෙන් ඔබ්බට ගොස් මෙම විමර්ශන කොමිෂන් සභාවට බලතල ලබා දී ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් මෙම බලතල අභියෝගයට ලක් කරමින් මූලික අයිතිවාසිකම් පිළිබඳ අයදුම්පතක් ගොනු කරන ලදි.[25] ඕනෑම පුද්ගලයෙකුට අසාධාරණ ලෙස නඩු පැවරීමෙන් හා අසාධාරණ ලෙස විමර්ශනයට ලක් කිරීමෙන් ආරක්ෂා කිරීම සඳහා නීතිය දැනටමත් ආරක්ෂාවන් සපයන බවත්, පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දී ඇති බලතල වූ කලී දැනටමත් ස්ථාපිත නීතිමය ව්‍යුහයන්ට පිටින් ක්‍රියාත්මක වන බවත්, එයින් අපරාධවලට ගොදුරු වූවන්ට බරපතල අගතියක් ඇති කළ හැකි බවත්, වසර ගණනාවක් තිස්සේ පවතින ප්‍රමාද නඩු කටයුතු තවදුරටත් කල් යෑමේ විභව හැකියාවක් ඇති බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය මූලික අයිතිවාසිකම් පෙත්සමේ සඳහන් කර ඇත. පරීක්ෂණ කොමිෂන් සභාවට ලබා දී ඇති පුළුල් බලතල හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති බලතල වෙන් කිරීම සහ නීතියේ ආධිපත්‍යය උල්ලංඝනය කරනු ලබන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් ද උල්ලංඝනය වනු ඇත.[26]

---

24 ඉහත එම

25 *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති* (SC FR 32/2020), යොමුව <https://www.cpalanka.org/centre-for-policy-alternatives-v-attorney-general-sc-fr-32-2020/> වර්ෂ 2021 පෙබරවාරි මස 15 වන දින ප්‍රවේශ විය

26 *විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එදිරිව නීතිපති* (SC FR 32/2020)

# පරීක්ෂණ කොමිෂන් සභාවෙහි ප්‍රධාන නිර්දේශයන් සහ ඒවායෙහි ගම්‍යමාර්ථයන්

| පසුබිම | පරීක්ෂණ කොමිෂන් සභාවෙහි ප්‍රධාන නිර්දේශයන් | ගම්‍යමාර්ථයන් |
|---|---|---|
| **1. දූෂණ විරෝධී කමිටු සාක්ෂිකරුට එරෙහිව පැමිණිලි කිරීම:**<br>විජයදාස රාජපක්ෂ | | |
| මෙම පැමිණිල්ලේ වගඋත්තරකරුවන් ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු නම් කර තිබේ. දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිසමේ විමර්ශනය සම්බන්ධයෙන් වර්ෂ 2020 නොවැම්බර් 28 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන් විසින් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන ලදි.[27] පරීක්ෂණ කොමිෂන් සභාවෙන් තමාට නොතීසි ලැබී ඇත්තේ සිංහල භාෂාවෙන් බවත්, පරිවර්තන සඳහා නැවත නැවත කරන ලද ඉල්ලීම් නොසලකා හැර ඇති බවත් ඔහු ප්‍රකාශ කරන ලදි. ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ, ඔහුව "වගඋත්තරකරු" ලෙස හඳුන්වනු ලබන බැවින්, ඔහුට එරෙහි ඕනෑම චෝදනාවකට අදාළ තොරතුරු ඔහුට ලබා දෙන ලෙසයි. කෙසේ වෙතත්, | දූෂණ විරෝධී කමිටුවට එරෙහි පැමිණිලි සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ට දඬුවම් පැනවීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවීමට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ [29] නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් වර්ෂ 1978 අංක 07 දරණ විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනතෙහි විධිවිධාන යටතේ වර්ෂ 2021 ජනවාරි 29 වන දින පිහිටුවන ලදි.<br><br>වැරදිකරුවන්ට සිවිල් අශක්නුතාවයන් පැනවීම නිර්දේශ කිරීමට කොමිසමට බලය ඇත.[30]<br><br>පරීක්ෂණ කොමිෂන් සභාවක නිර්දේශ 'ක්‍රියාත්මක කිරීම' සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවන ලද පළමු අවස්ථාව මෙයයි. සමාන්‍යයෙන් සිදුවන සුපුරුදු ක්‍රමය වී ඇත්තේ දණ්ඩන නීතිය යටතේ පියවර ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක නිර්දේශ නීතිපති වෙත යොමු කිරීමයි. පරීක්ෂණ |

[27] සමන් ඉන්ද්‍රජිත් 'සුමන්තිරන්ගේ වරප්‍රසාද ප්‍රශ්නය පාර්ලිමේන්තු ආචාර ධර්ම හා වරප්‍රසාද කමිටුවට යොමු කර ඇත', යොමුව
<https://island.lk/sumanthirans-privilege-issue-referred-to-parliamentary-ethics-and-privileges-committee/>

| | | |
|---|---|---|
| චෝදනාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා කොමිෂන් සභාවෙන් කිසිදු තොරතුරක් ඔහුට ලැබී නොමැත.[28] | | කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී සාමාන්‍ය නඩු සහ අධිකරණ ආයතන මග හැරීමට මෙය හේතු විය හැකිය.<br><br>තම නිලධාරීන් පරීක්ෂණ කොමිෂන් සභාවට කැඳවීම පිළිබඳව නීතිපතිවරයා විසින්ම විරෝධය දැක්වීම සහ දැනට පවතින නඩු පැවරීම් පිළිබඳව ප්‍රශ්න කිරීම නිසා මෙය සැලකිලිමත් වීමට හේතුවක් වේ. එවැනි ප්‍රශ්න කිරීම්වලට නීතිපතිවරයා විරුද්ධ වූයේ කරුණු සෙවීමේ පරීක්ෂණ කොමිෂන් සභාවකට දැනට පවතින අධිකරණ නඩු කටයුතු වලට මැදිහත් වීමට බලයක් නොමැති බවට වූ පදනම මතය.[31] |

[29] 2021 ජනවාරි 29 වන දිනැති අංක 2212/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2021/1/2212-53_S.pdf>

[30] චන්දනි කිරින්දේ, අලුතින් පත් කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් වැරදිකරුවන් කරනු ලැබුවහොත් 'පෙර රජයේ සාමාජිකයන්ට සිවිල් අශක්නුතාවයන්ට මුහුණ දීමට සිදුවනු ඇත' (ඩේලිඑෆ්ටී, 2021 පෙබරවාරි 1), යොමුව < http://www.ft.lk/front-page/Members-of-previous-Govt-may-face-civil-disability-if-found-guilty-by-newlyappointed-Special-Presidential-CoI/44-712430 > වර්ෂ 2021 පෙබරවාරි මස 1 වන දින ප්‍රවේශ විය

[28] ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, හැන්සාඩ් 2020.11.28, යොමුව <https://www.parliament.lk/uploads/documents/hansard/11736_english_2020-1128.pdf>

[31] කිෂාලි පින්ටෝ-ජයවර්ධන, 'ශ්‍රී ලංකාවේ අධිකරණ ආයතන මතට 'තද වැස්සක්' වැටීමට නියමිතය' (ද සන්ඩේ ටයිම්ස්, 2021 පෙබරවාරි 7) යොමුව <http://www.sundaytimes.lk/210207/columns/a-hard-raindestined-to-fall-on-sri-lankas-institutions-of-justice-431716.html> වර්ෂ 2021 පෙබරවාරි මස 12 වන දින ප්‍රවේශ විය

<table>
<tr><td colspan="3">2. 'එකොළොස් දෙනකු අතුරුදහන් වීම' පිළිබඳ නඩුවෙහි විමර්ශනයන්ට එරෙහි පැමිණිල්ල - පැමිණිලි අංක. 01/2020, 02/2020, 03/2020 සහ 05/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>අද්මිරාල් වසන්ත කරන්නාගොඩ<br>රියර් අද්මිරාල් ඩී.කේ.පී. දසනායක<br>කොමොදෝරු සුමිත් රණසිංහ</td></tr>
<tr><td>වර්ෂ 2008 අගෝස්තු 25 සිට 2009 මාර්තු 21 දක්වා කාලය තුළ කොටහේන සහ තදාසන්න ප්‍රදේශවලින් පුද්ගලයන් 11 දෙනෙකු පැහැරගෙන යාමේ සිද්ධිය සම්බන්ධ විමර්ශනය මෙම පැමිණිල්ලට අදාළ වේ. දීර්ඝ විමර්ශන වලින් පසුව, ත්‍රිපුද්ගල නිත්‍ය මහාධිකරණයෙහි නඩු පවරන ලදි. සාක්ෂිකරුවන් බිය ගැන්වීම සහ පැහැරගෙන යාමේ චෝදනාවට ලක්වූ නාවික හමුදා නිලධාරීන් උසස් කිරීම පරීක්ෂණ මගින් පෙන්වා දී තිබුණි.<br><br>අද්මිරාල් වසන්ත කරන්නාගොඩ ඔහුගේ සාක්ෂි අනුව ප්‍රකාශ කළේ ත්‍රිකුණාමල නාවික හමුදා කඳවුරේ තරුණයන් රඳවා තබා ගැනීම පිළිබඳව ඔහුට ලැබුණු තොරතුරු විමර්ශනය කිරීමට හැකි සෑම පියවරක්ම ඔහු ගත් බවත් සහ පැහැරගැනීම් ඇත්ත වශයෙන්ම ඔහුගේ අණ යටතේ සිටි ලුතිනන් කමාන්ඩර් සම්පත් මුනසිංහ සහ තවත් අය විසින් සිදු කරන ලද්දක් බව තහවුරු කළේය. ඔහු මෙම</td>
<td>පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන්නේ අද්මිරාල් වසන්ත කරන්නාගොඩ, රියර් අද්මිරාල් ඩී.කේ.පී. දසනායක සහ අනෙක් චූදිතයන්ට එරෙහිව පුද්ගලයන් 11 දෙනෙකු පැහැරගෙන ගොස් අතුරුදහන් කිරීම සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩුවේ සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවටයි. එලෙසම, අංක 1448/2020 යටතේ ඔවුන්ට එරෙහිව නීතිපති විසින් කොළඹ ත්‍රිපුද්ගල නිත්‍ය මහාධිකරණයෙහි ගොනු කර ඇති අධිචෝදනා ඉල්ලා අස්කර ගැනීමට ද වාර්තාව මගින් නිර්දේශ කරනු ලබයි.<br><br>මීට අමතරව, අදාල විමර්ශනය සහ නඩු පැවරීමට සම්බන්ධයෙන් කටයුතු කළ විමර්ශකයින්, නීතිඥයින් සහ වෙනත් අයට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ ව්‍යාජ සාක්ෂි සැකසීම හා දූෂණ වැරදි සඳහා නඩු පැවරිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.</td>
<td>මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ ස්වාධීනත්වය හා නීතියේ ආධිපත්‍යය අඩපණ වනු ඇත. විමර්ශනය සිදු කළ විමර්ශකයින්ගේ ස්වාධීනත්වයට ද එය බාධා පමුණුවන අතර අනාගතයේදී දේශපාලනික වශයෙන් සංවේදී වන සිදුවීම් වලදී එවන් නිලධාරීන් විසින් අපක්ෂපාතී ආකාරයට විමර්ශන කටයුතු කිරීම සම්බන්ධයෙන් ද අහිතකර ලෙස බලපානු ඇත.<br><br>එපමණක් නොව, එය නීතිපතිවරයාගේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නඩු පැවරීමේ නිලධාරීන්ගේ ස්වාධීනත්වයට අහිතකර ලෙස බලපානු ඇති අතර, දේශපාලනික වශයෙන් සංවේදී වන සිදුවීම් වලදී අපක්ෂපාතී පියවර ගැනීම ද වළක්වනු ඇත.<br><br>පරීක්ෂණ කොමිෂන් සභාව පත් කළ විගසම මෙම නඩුවේ විභාගය අත්හිටුවන ලෙසට නීතිපතිවරයාට උපදෙස් දෙන ලදි. මෙම</td></tr>
</table>

| | | |
|---|---|---|
| තොරතුරු පොලිසියට වාර්තා කර තිබූ අතර මුනසිංහව අනිවාර්ය නිවාඩු යවා තිබුණි.<br><br>සාක්ෂි ලබා දුන් විත්තිකරුවන් කිහිප දෙනෙකු ප්‍රකාශ කළේ පසුගිය ආණ්ඩුව සතුටු කිරීම උදෙසා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් කුමන්ත්‍රණය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඔවුන් අත්අඩංගුවට ගෙන ඇති බවයි.<br><br>අද්මිරාල් කරන්නගොඩ ඇතුළු පිරිස මෙම නඩුවේදී "හිටපු රජයේ සාමාජිකයින්ගේ දේශපාලන අභිලාෂයන් ඉටු කිරීම සහ ඩයස්පෝරාව සහ අනෙකුත් ජාත්‍යන්තර ක්‍රියාකාරීන් තෘප්තිමත් කිරීම" සඳහා නොකළ වරදකට හසුකර ඇති ඇති බව වාර්තාවේ සඳහන් වේ. | | නිලධාරීන් විසින් කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නිර්දේශ ජනාධිපතිවරයාට භාර දෙන තෙක් නීතිපතිවරයාගේ හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සාක්ෂි ලබා ගැනීම හෝ පැමිණිලිකරුවන්ට එරෙහිව නඩු පැවරීම මෙකී කොමිෂන් සභාව විසින් වළක්වන ලදි. අධිකරණය ඉදිරියේ ඇති නඩු සම්බන්ධයෙන් නීතිපතිවරයාට උපදෙස් දීමට මෙම කොමිෂන් සභාවට නීතිමය බලයක් නොමැති බව නීතිපතිවරයා විසින් මෙම කොමිසමට පවසා ඇත.[32] |

[32] 'කරන්නාගොඩ, දසනායකට එරෙහි පැහැරගැනීම් පිළිබඳ නඩු කටයුතු නවත්වන ලෙස නීතිපතිවරයා පැවසීය' (ඩේලි නිවුස්, 2020 ජනවාරි 28), යොමුව <http://www.dailynews.lk/2020/01/28/local/209735/%E2%80%98ag-told-halt-abduction-cases-against-karannagodadasanayake%E2%80%99?page=6> වර්ෂ 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය
'ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට හිස නැමීම නීතිපති ප්‍රතික්ෂේප කරයි' (කොළඹ ගැසට්, 2020 ජනවාරි 28), යොමුව <https://colombogazette.com/2020/01/28/agrefuses-to-bow-down-to-pcoi-instructions/> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය
'කොමිසමට නියෝග දීමට අයිතියක් නැත, නීතිපතිවරයා දැනුම් දෙයි!' (ශ්‍රී ලංකා මිරර්, 2020 ජනවාරි 29), යොමුව <https://srilankamirror.com/news/16927commission-has-no-right-to-give-orders-ag-notifies> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය

| 3. පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් ඝාතනය සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 80/2020, 55/2020 සහ 107/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>ලුතිනන් කර්නල් ප්‍රසාද් හෙට්ටිආරච්චි<br><br>නාවික බුද්ධි නිලධාරි ගාමිණී සෙනෙවිරත්න<br><br>බුද්ධි අංශ නිලධාරී ප්‍රදීප් චමින්ද | | |
|---|---|---|
| මෙම නඩුව 2006 දී පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් සහ ඔහුගේ ආරක්ෂක නිලධාරියා ඝාතනය කිරීම සම්බන්ධයෙනි. ඔහුගේ මරණය ශ්‍රී ලංකාවේ මධ්‍යස්ථ මතධාරීන්ට පසුබෑමක් ලෙස සලකනු ලැබූ අතර ඝාතනයට විරෝධය පළ කරමින් දහස් සංඛ්‍යාත පිරිසක් කොළඹට පාගමනින් ගියහ. | පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් ඝාතනය කිරීමේ නඩුවේ විත්තිකරුවන් සියලු චෝදනාවලින් නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුවේ අධිචෝදනාව නීතිපති විසින් ඉල්ලා අස්කර ගන්නා ලෙසට ද එමඟින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අදාළ නඩුවේ සාක්ෂිකරුවන් බිය ගැන්වීමට හා හිරිහැර කිරීමට පාත්‍ර වීම සිදුවනු ඇත.<br><br>තවද එමඟින් අධිකරණයේ සහ විමර්ශකයින්ගේ ස්වාධීනත්වය බරපතල ලෙස අඩපණ කිරීමට ද හේතු වනු ඇත. |
| 2016 දී නඩු විභාගය පැවැත්වෙන අවස්ථාවේ දී නාවික හා හමුදා අණ දෙන නිලධාරීන් අධිකරණයට කැඳවා ඇති බවට එවකට ජනාධිපති සිරිසේන ස්වකීය කනස්සල්ල පළ කරන ලදි. මාසයක් පුරා පැවති නඩු විභාගයේදී ඒකමතිකව ගත් තීන්දුවකට අනුව චූදිතයන් නිදොස් කොට නිදහස් කරන ලද ජූරි සභා තීරණය මධ්‍යම රාත්‍රියේ ප්‍රකාශයට පත් කරන ලදි. මෙම තීරණය අභියාචනයට ලක් කර ඇත. | මීට අමතරව, අදාල විමර්ශනය සහ නඩු පැවරීමට සම්බන්ධයෙන් කටයුතු කළ විමර්ශකයින්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ ව්‍යාජ සාක්ෂි සැකසීම හා දූෂණ වැරදි සඳහා නඩු පැවරිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | |

**4. දිවි නැගුම දෙපාර්තමේන්තුව යටතේ විවිධ ව්‍යාපෘතිවල සිදුවූ බවට චෝදනා ලද මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව විමර්ශනය කිරීම් වලට එරෙහි පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 344/2020, 205/2020, 289/2020 සහ 316/2020**

**පැමිණිලිකරුවන්:**

ධම්මික අනිල් මාපා

නිහාල් ජයතිලක

අමිත් කිත්සිරි රණවක

බන්දුල තිලකසිරි

| | | |
|---|---|---|
| දූෂණ විරෝධී ලේකම් කාර්යාලය විසින් කරන ලද පැමිණිල්ලකට අනුව මෙම මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ පරීක්ෂණ සිදු කරන ලදි. පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා පවසන ලද්දේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට පටහැනිව හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් දූෂණ විරෝධී කමිටුවක් ස්ථාපිත කර ඇති බවය.[33]<br><br>හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ ජනාධිපති විමර්ෂණ කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ දූෂණ විරෝධී කමිටුව පිහිටුවා ඇත්තේ පැමිණිලි ඉදිරිපත් කිරීමට | කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති දිවි නැගුම දෙපාර්තමේන්තුව යටතේ විවිධ ව්‍යාපෘතිවල මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින චූදිතයන් සියලු චෝදනා වලින් නිදහස් විය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.<br>කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුවේ අධිචෝදනාවන් නීතිපති විසින් ඉල්ලා අස්කර ගන්නා ලෙස ද එමගින් නිර්දේශ කරනු ලබයි.<br><br>මීට අමතරව, අදාළ විමර්ශනය සහ නඩු පැවරීමට සම්බන්ධයෙන් කටයුතු කළ විමර්ශකයින්ට, නීතිඥයන්ට, සිවිල් ක්‍රියාකාරීන්ට | දිවි නැගුම නඩුවේ විත්තිකරුවන් 2020 නොවැම්බර් 30 වන දින කොළඹ මහාධිකරණය විසින් සියලු චෝදනාවලින් නිදොස් කොට නිදහස් කරන ලදි. වරදවල් සිදුකර ඇති බවට තහවුරු කිරීමට පැමිණිල්ලේ සාක්ෂි අසමත් වීම නිසා විත්තියේ ඉල්ලීම පරිදි මෙම නියෝගය ලබා දී තිබේ.[36]<br><br>දූෂණ විරෝධී කමිටුවට එරෙහි පැමිණිලිවල වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කිරීම හා දඬුවම් පැනවීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවන ලෙසට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>ඒ අනුව, වර්ෂ 2021 ජනවාරි 29 දිනැති අංක 2212/53 ගැසට් පත්‍රය මගින් විශේෂ ජනාධිපති |

[33] ෆාදීලා තසිම්, 'පසුගිය පාලන සමයේ දේශපාලන පළිගැනීම්: රනිල්ගේ දූෂණ විරෝධී ලේකම් කාර්යාලය ව්‍යවස්ථා විරෝධී - ජනාධිපති පරීක්ෂණ කොමිසමෙහි සභාපති (සිලෝන් ටුඩේ, 2020 ජූලි 14), යොමුව <https://ceylontoday.lk/news/political-victimisation-during-previous-regime-ranil-s-anti-corruption-secretariat-unconstitutional-pcoi-chair> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය

[36] ලක්මාල් සූරියගොඩ, 'බැසිල්, තවත් තිදෙනෙක් දිවි නැගුම නඩුවෙන් නිදොස් කොට නිදහස් කර ඇත' (ඩේලි නිවුස්, 2020 දෙසැම්බර් 1), යොමුව http://dailynews.lk/2020/12/01/law-order/234916/basil-three-others-acquitted-divi-neguma-case 2021 පෙබරවාරි මස 3 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| නොව පැමිණිලි ලබා ගැනීමට හා ඒවා අදාළ බලධාරීන් වෙත යොමු කිරීමට පමණක් බවය.<br><br>කැබිනට් සංදේශයක් මත දූෂණ විරෝධී කමිටුව පිහිටුවීමට තීරණය කරන ලද්දේ 'ජාතික විධායක සභාව' බවත් එකී කමිටුව දේශපාලන සන්ධානයක් බවත් එයට දේශපාලන සංවිධානයන්හි සාමාජිකයින් ඇතුළත් බවත් වික්‍රමසිංහ පැවසීය.[34]<br><br>එම ප්‍රකාශයෙන් පසුව, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ විසින් පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුවේ නිලධරයන්ට වැටුප් ගෙවා තිබේද යන්න පිළිබඳව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් අග්‍රාමාත්‍ය ලේකම් ගාමිණී සේදර සෙනරත් වෙත කොමිසම ඉදිරියේ සාක්ෂි දෙන ලෙස නොතීසි නිකුත් කළේය. ගෙවීම් කර ඇති පුද්ගලයින්ගේ නම් සහ ඒවාට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව ඔහුගෙන් ඉල්ලා සිටින ලදි.[35] | සහ සාක්ෂිකරුවන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ ව්‍යාජ සාක්ෂි සැකසීම හා දූෂණ වැරදි සඳහා නඩු පැවරිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | පරීක්ෂණ කොමිෂන් සභාවක් ස්ථාපිත කරන ලදි. දූෂණ විරෝධී කමිටුවෙහි සාමාජිකයන් වූත් පරීක්ෂණ කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිලි වල වගඋත්තරකරුවන් වූත් තැනැත්තන් පිළිබඳව වැඩිදුර විමර්ශනය කර වාර්තා කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත බලය පවරා ඇති අතර ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව යම් පුද්ගලයෙකු ප්‍රජා අශක්නුතාවයකට ලක්විය යුතුද යන්න නිර්දේශ කිරීමට හැකියාව එකී බලතල මඟින් ලබා දුනි.<br><br>පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ පෙනී සිටීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමින් හිටපු අමාත්‍ය මංගල සමරවීර කියා සිටියේ ජනාධිපති කොමිසම හමුවේ පෙනී සිටින අය දේශපාලන පළිගැනීමට පාත්‍ර වූ අය බවයි. රාජපක්ෂ පාලන සමයේ සිදු වූ වංචා සහ දූෂණ විමර්ශනය කිරීමට සහ අවශ්‍ය දඬුවම් පැනවීමට 2015 දී රජයට ජනවරම ලබා දී තිබූ බව ඔහු පැවසීය.[37] |

[34] රොෂාන් තුෂාර සහ දිල්ෂාන් තාරක, 'දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම ඉදිරියේ රනිල් සාක්ෂි දෙයි' (ඩේලි නිවුස්, 2020 සැප්තැම්බර් 4), යොමුව <http://www.dailynews.lk/2020/09/04/local/227861/ranil-testifies-pcoi-political-victimization> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය

[35] රොෂාන් තුෂාර සහ දිල්ෂාන් තාරක, 'දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම ඉදිරියේ රනිල් සාක්ෂි දෙයි' (ඩේලි නිවුස්, 2020 සැප්තැම්බර් 4), යොමුව <http://www.dailynews.lk/2020/09/04/local/227861/ranil-testifies-pcoi-political-victimization> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය

[37] සුල්ෆික් ෆර්සාන්, 'මංගල පවසන්නේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට කැඳවුම් ලද අය දේශපාලන පළිගැනීමට ගොදුරු වූවන් බවයි' (නිව්ස්ෆර්ස්ට්, 2020 සැප්තැම්බර්), යොමුව <https://www.newsfirst.lk/2020/08/21/mangala-says-those-noticed-by-pcoi-are-the-victims-of-political-victimization/amp/> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය

**5. සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 88/2020, 319/2020 සහ 816/2020**

**පැමිණිලිකරුවන්:**

සතරසිංහගේ ජයවීර
ඩබ්ලිව්. විමලසේන
ගුණරත්න භාශ්වර සේනාංක

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හිටපු සභාපති භාෂ්වර ගුණරත්න සහ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී. එස්. ජයවීර යන අය වර්ෂ 2016 දී කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් රිමාන්ඩ් කරනු ලැබීය.<br><br>පසුගිය රජය තුළ සංචාරක ප්‍රවර්ධන කටයුතු වලදී රුපියල් මිලියන 5.8 ක මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ගොනු කර ඇති නඩුවක් සම්බන්ධයෙන් අධිකරණය හමුවේ පෙනී සිටීමෙන් පසු ඔවුන් රිමාන්ඩ් භාරයට පත් කරන ලෙසට නියෝග කෙරිණි. | සංචාරක සංවර්ධන අධිකාරිය තුළ විවිධ ව්‍යාපෘති හා වෙනත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මූල්‍ය අක්‍රමිකතා සහ පොදු දේපළ අයථා ලෙස පරිහරණය කළ බවට චෝදනා ලැබූ කිහිප දෙනෙකු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදහස් කළ යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. එපමණක් නොව, ඔවුන්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩු වල අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුය. චූදිතයන් අතර සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, සභාපති සහ වැඩබලන මූල්‍ය අධ්‍යක්ෂවරයා ඇතුළත් වේ.<br><br>පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විමර්ශකයින්, රජයේ නිලධාරීන් සහ නීතඥයින් (වගඋත්තරකරුවන්ගේ ලැයිස්තුවේ නම්කර ඇති) යන අයට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ පිළිවෙලින් ව්‍යාජ සාක්ෂි සැකසීමේ සහ දූෂණ වැරදි සඳහා චෝදනා ගොනු කළ යුතු යැයි පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ සහ විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට හානි වනු ඇත. |

| **6. පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිලාට එරෙහි චෝදනා විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 545/2020**<br><br>**පැමිණිලිකරු:**<br><br>*උදය ප්‍රභාත් ගම්මන්පිල* | | |
|---|---|---|
| 2016 දී අමාත්‍ය ගම්මන්පිල විසින් ඩිජිටල් නොමිනීස් හි කොටස් ධම්මික පෙරේරා නම් ව්‍යාපාරිකයෙකුට විකුණන විට රුපියල් මිලියන 20 ක් වංචා කර ඇති බවට සහ දෙවන චූදිතයා වන සිඩ්නි ජයසිංහ සමඟ තවත් රුපියල් මිලියන 21 ක් අයථා ලෙස පරිහරණය කර ඇති බවට චෝදනාවන්ට ලක්විය.<br><br>හිටපු නීතිපති ජයන්ත ජයසූරිය විසින් චෝදනා කරන ලද්දේ ඕස්ට්‍රේලියානු ව්‍යාපාරික බ්‍රයන් ෂැඩික් ට අයත් කොටස් විකිණීම සඳහා වංචනික ඇටර්නි බලපත්‍රයක් යොදා ගනිමින් මෙම ව්‍යාපාරික ගනුදෙනුව සිදු කර ඇති බවයි.[38] | පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිලට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිසම නිර්දේශ කරනු ලබයි. ඒ හා සමානව කොළඹ මහාධිකරණයේ ඇති නඩුවේ අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතු බවට නිර්දේශ කරනු ලබයි.<br><br>මීට අමතරව, අදාළ විමර්ශනය සහ නඩු පැවරීමට සම්බන්ධයෙන් කටයුතු කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, විමර්ශකයින්ට සහ සාක්ෂිකරුවන්ට (අදාළ ආයෝජක හා ඔහුගේ වෛවාහක පාර්ශවය ද ඇතුළුව) එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ ව්‍යාජ සාක්ෂි සැකසීම හා දූෂණ වැරදි සඳහා නඩු පැවරිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ සහ විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට හානි වනු ඇත. |

[38] ඉමේෂ් රණසිංහ,'අපරාධකරුවන් නිදහස් කිරීමේ දේශපාලන පළිගැනීම් පරීක්ෂණ කොමිසම - විජිත හේරත්' (ඉකොනොමි නෙක්ස්ට්, 2021 ජනවාරි 27), යොමුව <https://economynext.com/political-victimization-commission-releasing-criminals-vijitha-herath-78257/> 2021 පෙබරවාරි මස 17 වන දින ප්‍රවේශ විය

| **7. කාල්ටන් ක්‍රීඩා ජාලය (සී. එස්. එන්) දියත් කිරීමේදී පොදු දේපල අයථා ලෙස පරිහරණය කිරීම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 1963/2020 සහ 1964/2020**<br><br>**පැමිණිලිකරු:**<br><br>යෝෂිත රාජපක්ෂ<br><br>රොහාන් වැලිවිට | | |
|---|---|---|
| කාල්ටන් ක්‍රීඩා ජාලය විසින් මූල්‍ය අක්‍රමිකතා සහ පොදු දේපළ අයථා ලෙස පරිහරණය කර ඇති බවට වූ බොරු චෝදනා පදනම් කරගෙන තමා අත්අඩංගුවට ගෙන දින 45 ක් රිමාන්ඩ් කරනු ලැබූ බව පැමිණිලිකරු පැවසීය. ඔහු කියා සිටියේ ඔහු සී. එස්. එන් කටයුතුවලට සම්බන්ධ නොවූවත් දූෂණ විරෝධී කමිටුව විසින් කරන ලද පැමිණිල්ලකට අනුව මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් ඔහුව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගත් බවයි.<br><br>මහින්ද රාජපක්ෂගේ දේශපාලන ගමන අඩාල කිරීමේ සාමූහික අරමුණ ඇතිව අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂගේ දෙවන පුත්‍රයා වන යෝෂිත රාජපක්ෂ මහතා 2016 නිදහස් දිනයට පෙර අත්අඩංගුවට ගැනීමට හිටපු අමාත්‍ය පාඨලී චම්පික රණවක සහ තවත් කිහිප දෙනෙකු පොලිස් දෙපාර්තමේන්තුවට බලපෑම් කළ බවට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස | කාල්ටන් ක්‍රීඩා ජාලය (සී. එස්. එන්) නාලිකාව දියත් කිරීමේදී මූල්‍ය වංචා සහ පොදු දේපළ අයථා ලෙස පරිහරණය කිරීම යන චෝදනා සම්බන්ධයෙන් චෝදනා ලැබූ කිහිප දෙනෙකු ඔවුන්ට එරෙහිව ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිසම නිර්දේශ කරනු ලබයි.<br><br>ඒ අනුව, පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන්නේ යෝෂිත රාජපක්ෂ මහතාට එරෙහිව කඩුවෙල සහ ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණවල ගොනු කර ඇති චෝදනා වලින් ඔහු නිදහස් කළ යුතු බවයි. ඒ හා සමානව කොළඹ මහාධිකරණයේ ඇති නඩුවේ අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුයැයි නිර්දේශ කරනු ලබයි.<br><br>ඒ හා සමානව, හිටපු ජනාධිපති මාධ්‍ය ලේකම් වරයාට (සී. එස්. එන්) නාලිකාවේ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කළ) එරෙහිව කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කළ යුතු බවත්, අධිචෝදනා | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ විමර්ශකයින්ගේ අපක්ෂපාතීත්වය අඩපණ වනු ඇත. |

| | | |
|---|---|---|
| රාජපක්ෂ පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලදි.[39] | පත්‍ර ගොනුකර ඇති කොළඹ මහාධිකරණයේ නඩුව ඉල්ලා අස්කර ගත යුතු බවත්ය.<br>දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි ගොනු කිරීම හා දූෂණ සම්බන්ධයෙන් වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරිය යුතු බවට පරීක්ෂණ කොමිසම නිර්දේශ කරයි. මෙම නඩුවට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට ද වැරදි ලෙස සිරගත කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතුයැයි නිර්දේශ කරනු ලබයි. | |
| **8. තාරුණ්‍යට හෙටක් සංවිධානය වෙනුවෙන් වෙන් කර ඇති අරමුදල් අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් වූ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 432/2020 සහ 433/2020**<br><br>**පැමිණිලිකරු:**<br><br>නාලක ගොඩහේවා<br><br>ධම්මික පෙරේරා | | |
| සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් තාරුණ්‍යට හෙටක් සංවිධානයට අනුග්‍රාහකත්වයක් ලෙස රුපියල් මිලියන 5 ක් ලබා දී තිබීම පිළිබඳ පැමිණිලිකරුවන්ට එරෙහිව මෙම පැමිණිල්ල ඉදිරිපත් වී තිබුණි. | කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ අදාළ පුද්ගලයන් දෙදෙනාට එරෙහිව ගොනු කර ඇති චෝදනා වලින් නිදොස් කොට නිදහස් කිරීම සහ ඔවුන්ට එරෙහිව කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුවේ අධිචෝදනා ඉවත් කර ගන්නා ලෙසට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>මෙම නඩුවට සම්බන්ධ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පොලිස් / මූල්‍ය අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන්ට එරෙහිව හානි කිරීමේ අභිප්‍රාය හා දූෂණ චේතනාවෙන් ව්‍යාජ චෝදනා ගොනු කිරීම සම්බන්ධයෙන් දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ කටයුතු කළ යුතු බවට කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ විමර්ශකයින්ගේ අපක්ෂපාතීත්වය අවතක්සේරු වනු ඇත. |

[39] ඩබ්ලිව්. කේ. ප්‍රසාද් මංජු, 'යෝෂිතව අත්අඩංගුවට ගැනීමට චම්පික කුමන්ත්‍රණය කළේය - විජයදාස' (සිලෝන් ටුඩේ, 2020 ජූනි 11), යොමුව <https://ceylontoday.lk/news/champika-conspired-to-get-yoshitha-arrested-wijeyadasa> 2021 පෙබරවාරි මස 17 වන දින ප්‍රවේශ විය

**9. සමුපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) විසින් ක්‍රීඩා උපකරණ ආනයනය කිරීම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 619/2020 සහ 375/2020**

**පැමිණිලිකරුවන්:**

නිශාන්ත අසිරි ප්‍රනාන්දු

කමින්ද හර්ෂජිත්

| | | |
|---|---|---|
| සමුපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ක්‍රීඩා භාණ්ඩ ආනයනය කිරීමේදී සිදු වූ බවට චෝදනා ලද මූල්‍ය වංචාවන් සම්බන්ධයෙන් මෙම චෝදනා අදාළ වේ. | කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ ඔවුන්ට එරෙහිව ගොනු කර ඇති චෝදනා සම්බන්ධයෙන් පැමිණිලිකරුවන් දෙදෙනෙකු නිදොස් කොට නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි. මහින්දානන්ද අළුත්ගමගේ සහ නලින් ප්‍රනාන්දුට එරෙහිව කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුවේ අධිචෝදනා ඉල්ලා අස්කර ගැනීමට ද පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.<br><br>මෙම නඩු කටයුත්ත හා සම්බන්ධව ක්‍රියා කළ රජයේ නිලධාරීන් සහ විමර්ශකයින්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ පිළිවෙලින් ව්‍යාජ සාක්ෂි සැකසීමේ සහ දූෂණ වැරදි සඳහා චෝදනා ගොනු කළ යුතු යැයි පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.<br><br>අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂකවරයා සහ අදාළ නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ වැරදිකරුවෙකුට රැකවරණය ලබා දීමේ වරදට වැරදිකරුවන් වේ. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ආධිපත්‍යය සහ විමර්ශකයින්ගේ අපක්ෂපාතීත්වය අවතක්සේරුවට ලක් වනු ඇත. |

| 10. අලියෙකු වංචනික ලෙස ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 04/2020<br><br>පැමිණිලිකරු:<br><br>තිලිණ ගමගේ | | |
|---|---|---|
| බලපත්‍රයක් නොමැතිව අලි පැටවෙකු සන්තකයේ තබා ගැනීම, ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කිරීමට කුමන්ත්‍රණය කිරීම සහ ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කරමින් අදාළ අලි පැටවා ලියාපදිංචි කිරීම ඇතුළු කරුණු 25 ක් යටතේ "සකුරා" නම් අලි පැටවා නීතිවිරෝධී ලෙස ළඟ තබා ගැනීම පිළිබඳව පැමිණිලිකරුට එරෙහිව පැවති චෝදනා සම්බන්ධයෙන් මෙකී පැමිණිල්ල ඉදිරිපත්ව තිබුණි.<br><br>වන සත්ව හා වෘක්ෂලතා ආඥාපනතෙහි සහ පොදු දේපල පනතෙහි විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් චෝදනා ගොනු කරන ලදි.<br><br>එවකට අදාළ විෂය අමාත්‍ය වසන්ත සේනානායක විසින් සිදු කරන ලද පැමිණිල්ලක් මත මෙම නඩුව විභාගයට ගැනිණි. පසුව අලි පැටවා මහේස්ත්‍රාත්වරයා සන්තකයේ සිට අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව භාරයට ගන්නා ලදි.[40] | පැමිණිලිකරුට (හිටපු මහේස්ත්‍රාත්වරයා) එරෙහිව නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලුම චෝදනා වලින් නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>ඒ හා සමානව, කොළඹ මහාධිකරණයේ ඇති නඩුවේ අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුයැයි නිර්දේශ කරන ලදි.<br><br>මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි ගොනු කිරීම හා දූෂණ වංචා කිරීමේ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, පවතින නීතිමය කටයුතුවලට බාධා ඇති වන අතර අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යයට ද අගතිගාමී ප්‍රතිවිපාක අති කරනු ලබයි. |

[40] 'මහේස්ත්‍රාත් තිලිණ ගමගේ සහ තවත් හතර දෙනෙකුට එරෙහිව අධිචෝදනා ගොනු කරන ලදි' (නිව්ස්ෆර්ස්ට්, 2019 ජූලි 20), යොමුව <https://www.newsfirst.lk/2019/07/20/indictments-filed-against-magistrate-thilina-gamage-and-four-others/> 2021 පෙබරවාරි මස 16 වන දින ප්‍රවේශ විය

**11. දුමින්ද සිල්වාගේ සිරගත කිරීමට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 1969/2020**

**පැමිණිලිකරු:**

දුමින්ද සිල්වා වෙනුවෙන් වින්සන්ට් ප්‍රේමලාල් සිල්වා

| | | |
|---|---|---|
| හිටපු ජනාධිපති උපදේශක භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනය සම්බන්ධයෙන් පැමිණිලිකරුට එරෙහිව නඩු පවරා තිබේ. විශේෂයෙන්ම හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා මහතා වෙනුවෙන් කරන ලද පැමිණිල්ලක් විභාග කිරීම සඳහා මෙම කොමිෂන් සභාවෙහි කාල සීමාව දින 16 කින් දීර්ඝ කරමින් ජනාධිපතිවරයා විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදි. | පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද නව සාක්ෂි සැලකිල්ලට ගනිමින් පැමිණිලිකරු දුමින්ද සිල්වා මහතාට එරෙහිව කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුව සම්බන්ධයෙන් වරදකරු කරන ලද තීන්දුව සහ මරණ දඬුවම සමාලෝචනය කිරීම සඳහා නීතිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ වැඩි විනිසුරුවරුන් සංඛ්‍යාවකගෙන් යුත් විනිසුරු මඬුල්ලක් ඉල්ලා සිටිය යුතු බව පරීක්ෂණ කොමිසම නිර්දේශ කරනු ලබයි.<br><br>මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි ගොනු කිරීම හා දූෂණ වංචා කිරීමේ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. මෙම නඩුවට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට ද වැරදි ලෙස සිරගත කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතුයැයි කොමිසම විසින් නිර්දේශ කරනු ලබයි. | භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනය පිළිබඳ නඩුව පිළිබඳ තීරණය කරනු ලැබුවේ ත්‍රිපුද්ගල මහාධිකරණයක[41] පැවති නඩු විභාගයකින් පසුව වන අතර වර්ෂ 2018 ඔක්තෝබර් 11 වන දින ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය වන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දුව තහවුරු කිරීම ප්‍රකාශයට පත් කරන ලදි. මෙම තත්වයන් යටතේ එය ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් වෙත යොමු කළ හැකිද යන්න සැක සහිතය.<br><br>ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය විසින් ලබා දුන් තීන්දු විමර්ශනය කිරීම, ඉවත් කිරීම හෝ අවලංගු කිරීම සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවකට හැකියාව පවතී ද යන්න සම්බන්ධයෙන් පූර්වාදර්ශයක් නොමැත.<br><br>පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කරන්නේ නම්, මේ සම්බන්ධයෙන් අධිකරණයේ ස්වාධීනත්වයට හා නීතියේ |

[41] නඩු අංක HC 8331/16

| | | |
|---|---|---|
| | | ආධිපත්‍යයට බරපතල ලෙස අභියෝග කරනු ඇත.<br><br>තවද, කොමිෂන් සභාවෙහි බලතල වල විෂය පථය ඔස්සේ ආවරණය වන්නේ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් හෝ රාජ්‍ය නිලධාරීන් - එනම් රජයේ සේවකයින් සහ ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් විසින් කරනු ලබන පැමිණිලි වලට පමණි. දුමින්ද සිල්වා යනු ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයෙක් හෝ රජයේ සේවකයෙක් නොවේ. (සිල්වාගේ පැමිණිල්ල ගොනු කරනු ලැබුවේ ඔහුගේ පියා ලාල් සිල්වා විසිනි.)[42] |

[42] Medialk'com,'දුමින්ද සිල්වාට නිදහසඃ ජනාධිපති කොමිසම විනිසුරුවරුන් හත්දෙනෙකුගේ තීන්දුව නිෂ්ප්‍රභ කරයි', යොමුව <https://medialk.com/english/2021/01/07/freedom-to-duminda-silva-presidential-commission-dismisses-a-seven-judge-ruling/>

| 12. විද්‍යා ඝාතන නඩුවේ ප්‍රධාන සැකකරුට පලායාමට ආධාර කිරීමේ චෝදනාව මත උතුරු පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ රාජකාරී අත්හිටුවීමට එරෙහිව පැමිණිල්ල - පැමිණිලි අංකය 115/2020<br><br>**පැමිණිලිකරු:**<br><br>නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ | | |
|---|---|---|
| මෙම පැමිණිල්ල උතුරු පළාතේ හිටපු නියෝජ්‍ය පොලිස්පති ලලිත් අනුරුද්ධ ජයසිංහ විසින් දේශපාලන පළිගැනීම් සඳහා ස්වකීය සේවා කටයුතු අත්හිටුවා ඇති බවට ගොනු කර ඇත. යාපනයේ පාසල් දැරියක් වූ විද්‍යා පැහැරගෙන යාම, දූෂණය කිරීම සහ ඝාතනය කිරීමේ ප්‍රධාන සැකකරු වන මහලිංගම් සෂිකුමාර් නොහොත් ස්විස්කුමාර්ගේ පලායාමට ආධාර කිරීම සහ අනුබල දීම මෙන්ම වරදකරුවකු සඟවා තබා ගැනීම යන චෝදනා මත ඔහුගේ සේවය අත්හිටුවා තිබේ.<br><br>සබරගමුව පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ධූරය දැරූ කාලය තුළ ඔහු | පැමිණිලිකරු වන ලලිත් අනුරුද්ධ ජයසිංහ මහතාට එරෙහිව පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලුම චෝදනා වලින් නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br>ඒ හා සමානව, ඔහුට එරෙහිව කොළඹ මහාධිකරණයේ ගොනු කර ඇති අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුයැයි කොමිසම විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි ගොනු කිරීම හා දූෂණ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.<br><br>හිඟ වැටුප් ගෙවීමත් සමඟ නියෝජ්‍ය පොලිස්පති | ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු උපාලි අබේරත්න මහතා කියා සිටියේ ලලිත් අනුරුද්ධ ජයසිංහ නැවත සේවයේ පිහිටුවීමට කිසිදු බාධාවක් නොමැති බව පෙනී යන බවයි. [43] පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු අවසන් කිරීමට පෙර 2020 අගෝස්තු මාසයේදී සභාපතිවරයා මෙම නිරීක්ෂණය සිදු කළේය. ඒ පිළිබඳව සලකා බලා එහි නීත්‍යානුකූලභාවය එදිනම සඳහන් කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන ලදි.<br><br>කෙසේ වෙතත්, ඔහු නැවත සේවයේ පිහිටුවීමට නීතිමය බාධාවන් පවතින බව අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය පැවසීය. කොමිෂන් සභාවේ සභාපතිවරයා කියා |

[43] සුල්ෆික් ෆර්සාන්, 'වැඩ තහනම් කරන ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් අනුරුද්ධ නැවත සේවයෙහි ස්ථාපනය කිරීමේ ගැටලුවක් නොමැත; දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පවසයි' (NewsFirst.lk, 2020 අගෝස්තු 29), යොමුව < https://www.newsfirst.lk/2020/08/29/no-issue-in-re-instating-interdicted-sdig-lalith-anuruddha-says-pcoi-on-politicalvictimization/> වර්ෂ 2021 අප්‍රේල් මස 2 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| පක්ෂග්‍රාහී හා දූෂිත ලෙස හැසිරීමේ චෝදනාව මත ඔහුගේ සේවය අත්හිටුවන ලදි. 2015 මැතිවරණයට සම්බන්ධ සිදුවීම් කිහිපයකට අදාළ චෝදනා සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රේමලාල් ජයසේකර (කහවත්ත වෙඩි තැබීමේ සිද්ධියේ සැකකරුවෙකු වන) අත්අඩංගුවට ගැනීම චෝදනා අතර විය. | ජයසිංහ වහාම සේවයේ පිහිටුවීමට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | සිටියේ, සේවය අත්හිටවූ නියොමාල් රංගජීව මහතාගේ ඉල්ලීම සහ ඔහු නැවත සේවයේ පිහිටුවීම පිළිබඳව සලකා බලන කල, මෙහිදී ලලිත් ජයසිංහ සම්බන්ධයෙන් එවැනි ක්‍රියාමාර්ගයක් නොගැනීම ගැටළු සහගත වන බවයි.<br><br>සභාපතිවරයාගේ මෙම ප්‍රකාශයන් විමර්ශන කොමිෂන් සභාවට ඒ වන විටත් ලබා දී තිබූ පුළුල් බලතල තවදුරටත් ඉක්මවා යාමක් පෙන්නුම් කෙරේ. එකී නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් එය අධිකරණයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වයට හානි කරනු ලබයි. |

<table>
<tr><td colspan="3">13. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ රියදුරු පැහැරගෙන යාම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම. 238/2020<br><br>පැමිණිලිකරු:<br><br>හමුදා බුද්ධි නිලධාරි ප්‍රේමා ආනන්ද උදලාගම</td></tr>
<tr><td>පැමිණිලිකරුට එරෙහි චෝදනා සම්බන්ධ වන්නේ ලසන්ත වික්‍රමතුංග ඝාතන නඩුවේ සාක්ෂිකරුවෙකු වන ලසන්ත වික්‍රමතුංග ගේ රියදුරු පැහැරගෙන යාම සම්බන්ධයෙනි.<br><br>පැමිණිලිකරු වැඩිදුරටත් කියා සිටියේ ගෝඨාභය රාජපක්ෂගේ උපදෙස් පරිදි බුද්ධි අංශ විසින් මාධ්‍යවේදීන්ට පහර දුන් බවට පිළිගත්තා ලෙසට විමර්ශනය අතරතුර පොලිස් පරීක්ෂක නිශාන්ත සිල්වා විසින් යෝජනා කළ බවයි.[44]</td><td>පැමිණිලිකරුට (හමුදා බුද්ධි අංශ නිලධාරි උදලාගම) එරෙහිව ගල්කිස්ස සහ ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණවල ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. එලෙසම, ඔහුට එරෙහිව ගම්පහ මහාධිකරණයේ ගොනු කර ඇති නඩුවේ අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුයැයි නිර්දේශ කරන ලදි.<br><br>මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි ගොනු කිරීම හා දූෂණ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.</td><td>මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, දීර්ඝ කාලයක් ප්‍රමාද වූ විමර්ශනයකට සහ නීතිමය ක්‍රියාමාර්ගයකට පසුබෑමක් ඇති වන අතර, දේශපාලනික වශයෙන් සංවේදී යැයි සැලකෙන සිද්ධීන් සම්බන්ධයෙන් අනාගතයේ දී පොලීසිය සහ නීති නිලධාරීන් පියවර ගැනීම වළක්වනු ලැබීමට ද එය හේතු වනු ඇත.</td></tr>
</table>

[44] සුල්ෆික් ෆර්සාන්, 'අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය සම්බන්ධයෙන් අධිකරණය නොමඟ යවා තිබේ; හිටපු බුද්ධි අංශ නිලධාරී' (නිව්ස්ෆර්ස්ට්, 2020 ඔක්තෝබර් 28), යොමුව <https://www.newsfirst.lk/2020/10/28/cid-misled-court-over-lasantha-wickrematunge-killing-ex-intelligence-officer/> වර්ෂ 2021 පෙබරවාරි මස 17 වන දින ප්‍රවේශ විය

**14. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරාරාජසිංගම් ඝාතනය සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 885/2020**

**පැමිණිලිකරු:**

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලයාන්

| | | |
|---|---|---|
| පාර්ලිමේන්තු මන්ත්‍රී සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් නොහොත් පිල්ලයාන් වන පැමිණිලිකරුට එරෙහි චෝදනාව වූයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරාරාසිංගම්ගේ ඝාතනය සම්බන්ධයෙන් විය.<br><br>මඩකලපුවේ මහාධිකරණයෙන් ඉදිරිපත් වූ අභියාචනය සම්බන්ධයෙන් අභියාචනාධිකරණය තීන්දු කරන ලද්දේ ප්‍රධාන සැකකරුවන් දෙදෙනාගේ පාපොච්චාරණය අනුමත කළ නොහැකි බවයි. පිල්ලයාන්ට එරෙහි නඩුව ඉවත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුව තීරණය කළ අතර සියලු සැකකරුවන් නිදොස් කොට නිදහස් කරන ලදි. | පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරන ලද්දේ පැමිණිලිකරුට එරෙහිව මඩකලපුවේ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් ඔහු නිදොස් කොට නිදහස් කරන ලෙසයි. ඒ හා සමානව ඔහුට එරෙහිව මඩකලපුවේ මහාධිකරණයේ ගොනු කර ඇති අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුයැයි නිර්දේශ කරන ලදි.<br><br>මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි ගොනු කිරීම හා දූෂණ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. මෙම නඩුවට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට ද වැරදි ලෙස සිරගත කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතුයැයි නිර්දේශ කරන ලදි. | ඝාතනය පිළිබඳ විමර්ශනයේදී මන්ත්‍රීවරයා ඝාතනය කිරීම පිළිබඳ පොලිස් පරීක්ෂණ සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකි බව කලින් ජනාධිපති කොමිසමක් පෙන්වා දී තිබුණි. එහි සඳහන් වූයේ "පොලීසිය සොල්දාදුවන් දෙදෙනෙකුට එරෙහිව චෝදනා ගොනු කළ නමුත් පසුව ඔවුන් සතුව සාක්ෂි නොමැති බව පවසන ලදි" යනුවෙනි.[45]<br><br>දේශපාලනික වශයෙන් සංවේදී කරුණු පිළිබඳ විමර්ශනවලදී පොලීසියට දේශපාලන බලපෑමක් සිදු වීම ශ්‍රී ලංකාව තුළ නිරන්තරයෙන් දක්නට ලැබේ. විමර්ශකයින් ඔවුන්ගේ රාජකාරිවල යෙදීම සහ ඔවුන්ට එරෙහිව අපරාධ චෝදනා ගොනු කිරීමට ඔවුන්ව ඉලක්ක කර ගැනීම විමර්ශකයින්ගේ ස්වාධීනත්වයට තවදුරටත් බාධාවක් වනු ඇත. |

45 'මන්ත්‍රී මිනීමැරුම් විමර්ශනය 'ප්‍රමාණවත් නොවේ' (බීබීසී සිංහල, 2009 ජූනි 16), යොමුව <https://www.bbc.com/sinhala/news/story/2009/06/090616_probe_pararajasingham> වර්ෂ 2021 පෙබරවාරි මස 18 වන දින ප්‍රවේශ විය

| 15. එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට වෙන් කරන ලදැයි කියන අරමුදල් අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 1116/2020<br><br>**පැමිණිලිකරු:**<br><br>ජාලිය වික්‍රමසූරිය | | |
| --- | --- | --- |
| පැමිණිලිකරුට එරෙහි චෝදනාව වූයේ එක්සත් ජනපදයේ ශ්‍රී ලාංකික තානාපති කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන්ය. | කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිලිකරුට (ජාලිය වික්‍රමසූරිය මහතා) එරෙහිව ගොනු කර ඇති සියලුම චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිසම නිර්දේශ කරනු ලබයි.<br><br>මීට අමතරව, එක්සත් ජනපදය විසින් පැමිණිලිකරුට පනවා ඇති සංචාරක තහනම ඉවත් කරන ලෙස ඉල්ලා සිටීමට රජය විසින් අවශ්‍ය පියවර ගන්නා ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.<br><br>දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි සැකසීම හා දූෂණ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට ද පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නීතිමය කටයුතුවලට බාධා ඇති වන අතර අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය අවතක්සේරුවට ලක් කරනු ඇත. |

**16. ස්වයං රැකියා සම්මේලනයේ මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 28/2020**

**පැමිණිලිකරු:**

මහින්ද කහඳගමගේ

| | | |
|---|---|---|
| පැමිණිලිකරු වූ මහින්ද කහඳගමගේට එරෙහිව තිබූ චෝදනා වූයේ ස්වයං රැකියා සම්මේලනයේ මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන්ය. | පැමිණිලිකරු වන මහින්ද කහඳගමගේට එරෙහිව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදහස් කරවන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි සැකසීම හා දූෂණ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට ද පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, පවතින නීතිමය කටයුතුවලට බාධා ඇති වන අතර අධිකරණයේ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය අවතක්සේරුවට ලක් කරනු ඇත. |

| 17. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව (එස්එල්බීසී) / රූපවාහිනී සංස්ථාව (එස්එල්ආර්සී) හි සේවකයින් කිහිප දෙනෙකුට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ට එරෙහිව පැමිණිලි - පැමිණිලි අංක. 1091/2020, 1092/2020, 1131/2020, 141/2020<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>චන්ද්‍රපාල ලියනගේ<br><br>සනත් ප්‍රියන්ත දලුවත්ත<br><br>විමලසේන රූබසිංහ | | |
|---|---|---|
| පැමිණිලිකරුවන් අතරට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන චන්ද්‍රපාල ලියනගේ මහතා, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපති විමලසේන රූබසිංහ සහ තවත් කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකු ඇතුළත් වේ.<br><br>පැමිණිලි කරුවන්ට එරෙහිව මූල්‍ය හා වෙනත් වැරදි සම්බන්ධයෙන් චෝදනා එල්ල වී තිබේ. | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (එස්එල්බීසී) / රූපවාහිනී සංස්ථාව හා සම්බන්ධ පුද්ගලයින් කිහිප දෙනෙකුගේ පැමිණිලි සම්බන්ධයෙන් ගත් කල මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව අල්ලස් පනත යටතේ දූෂණ චෝදනාව සම්බන්ධයෙන් නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කර තිබේ. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් අල්ලස් හෝ දූෂණ විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමට සම්බන්ධ වූ තැනැත්තන්ව බිය ගැන්වීමේ බලපෑමක් ඇති කළ හැකිය. |

| **18. ඇවන්ට් ගාඩ් මතභේදය පිළිබඳ විමර්ශන අංශයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 402/2020, 206/2020 සහ 50/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>සමන්සිරි දිසානායක<br><br>දමයන්ති ජයරත්න<br><br>නිශ්ශංක සේනාධිපති | | |
|---|---|---|
| යහපාලන රජය විසින් ගනු ලැබූ අත්තනෝමතික හා දේශපාලනික වශයෙන් ගත් තීරණ හේතුවෙන් තම සමාගම් සමූහයට විශාල අලාභයක් සිදුවී ඇති බව පවසමින් ඇවන්ට් ගාඩ් මැරිටයිම් සර්විසස් ලිමිටඩ් හි සභාපති මේජර් (විශ්‍රාමික) නිශ්ශංක සේනාධිපති විසින් මෙම පැමිණිල්ල ගොනු කරන ලදි.[46]<br><br>විමර්ශන කොමිෂන් සභාවේ සභාපති උපාලි අබේරත්න තහවුරු කරන ලද්දේ ඇවන්ට් ගාඩ් සභාපති මේජර් (විශ්‍රාමික) නිශ්ශංක සේනාධිපති රජයේ නිලධාරියෙකු නොවුනත් ඇවන්ට් ගාඩ් සභාපතිගේ පැමිණිල්ල එකී කොමිෂන් සභාවෙහි බලතල සීමාව තුළ පවතින බවට විමර්ශන | එම්වී ඇවන්ට් ගාඩ් නෞකාව පවරා ගැනීමේ සිද්ධියට අදාළව කැරැල්ලට අනුබල දුන් වරදට නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධනට එරෙහිව නඩු පැවරිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව තහවුරු කරන ලදි.<br><br>ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩු වලදී ඔවුන්ට එරෙහිව ඇති සියලුම චෝදනා වලින් නිශ්ශංක සේනාධිපති (ඇවන්ට් ගාඩ් හි සභාපති) ඇතුළු පැමිණිලි කරුවන් කිහිප දෙනෙකු නිදොස් කොට නිදහස් කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. ඒ හා සමානව, කොළඹ මහාධිකරණයෙහි නඩු වල ගොනු කර ඇති අධිචෝදනා ද ඉල්ලා අස්කර ගත යුතුයැයි නිර්දේශ කරන ලදි. | පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර දේශපාලන පළිගැනීම් පිළිබඳ විමර්ශන කොමිෂන් සභාවෙහි නොතීසි අවලංගු කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණයට රිට් පෙත්සම් දෙකක් ගොනු කරන ලදි. එහිදී ඔවුන් ප්‍රකාශ කරන ලද්දේ විමර්ශන කොමිෂන් සභාවට පවරා ඇත්තේ පසුගිය රජය සමයේ දී දේශපාලන පළිගැනීම් වලට ලක්වූ සිද්ධීන් සම්බන්ධයෙන් රජයේ සේවකයින් විසින් කරන ලද පැමිණිලි විමර්ශනය කිරීමේ බලතල පමණක් ඇති බවයි.[50]<br><br>ඇවන්ට් ගාඩ් සභාපති විසින් කරන ලද පැමිණිල්ල සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර යන අය කොමිසමට |

[46] ස්කන්ධ ගුණසේකර, 'දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසම: විජයදාස යහපාලන ඇමතිවරුන් හෙළි කරයි'(ද මෝර්නිං, 2020 ජූනි 18), යොමුව
< http://www.themorning.lk/presidential-commission-on-political-victimisation-wijeyadasa-exposes-yahapalana-ministers/ > වර්ෂ 2021 පෙබරවාරි මස 18 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| කොමිෂන් සභාව තීරණය කර තිබේ යනුවෙනි.[47]<br><br>පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ<br><br>සාක්ෂි දෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී විජයදාස රාජපක්ෂ විසින් චෝදනා කරන ලද්දේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාජපක්ෂවරුන් ට එරෙහිව දේශපාලන තරහ පිරිමැසීම සඳහා ද මෙම කුමන්ත්‍රණයෙහි කොටසක් වී ඇති බවට.[48]<br><br>මෙහිදී රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥ ජනක බණ්ඩාර වගඋත්තරකරුවෙකු ලෙස නම් කරන ලදි. පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව නීතිපතිවරයා මෙම විරෝධතා මතු කළ අතර ජනාධිපති විමර්ශන කොමිෂන් | මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට (හිටපු අද්මිරාල් රවින්ද්‍ර විජේගුණරත්න, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර, පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක පිරිස ඇතුළුව) දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි සැකසීම හා යටතේ දූෂණ වංචා කිරීමේ වැරදි සම්බන්ධයෙන් නඩු පැවරිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. මෙම නඩුවට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට ද වැරදි ලෙස සිරගත කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතුයැයි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි. | නැවත කැඳවීමට කටයුතු නොකරන බවට අභියාචනාධිකරණයට තහවුරු කිරීමක් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දෙන ලදි. රිට් පෙත්සම් සම්බන්ධයෙන් අභියාචනාධිකරණය සුදුසු නියෝගයක් ලබා දෙන තෙක් මෙම තහවුරු කිරීම වලංගුව ක්‍රියාත්මක වේ.[51] මෙම පැමිණිල්ල සලකා බැලීමේදී විමර්ශන කොමිෂන් සභාව ස්වකීය නීතිමය බලතල රාමුව ඉක්මවා කටයුතු කර තිබිය හැකිය. නීතිපතිවරයා මීට පෙර සඳහන් කර ඇති පරිදි විමර්ශන කොමිෂන් සභාව පත් කරන ලද්දේ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථා වල සේවකයින්, ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සහ පොලීසිය යන ව්‍යුහයන්හි දේශපාලන වශයෙන් පළිගැනීම් පිළිබඳව සොයා බැලීමට බැවින්, සභාපති මේජර් (විශ්‍රාමික) නිශ්ශංක සේනාධිපතිට මෙම පරීක්ෂණ |

50 සුල්ෆික් ෆර්සාන්, 'ඇවන්ට්-ගාඩ් පැමිණිල්ල විභාග කිරීමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට බලයක් නැතැයි ඒ.කේ.ඩී. සහ ශානි ඒ පවසයි' (නිව්ස් ෆස්ට්, 2020 ජූලි 13) , යොමුව http://www.newsfirst.lk/2020/07/13/pcoi-has-no-power-to-examine-avant-garde-complaint-says-akd-and-shani-a/ වර්ෂ 2021 පෙබරවාරි මස 18 වන දින ප්‍රවේශ විය

47 ස්කන්ධ ගුණසේකර, 'දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පවසන්නේ නිශ්ශංකගේ පැමිණිල්ල කොමිසමේ බලතල රාමුව තුළ ඇති බවය' (ද මෝනිං, 2020 ජූනි 24), යොමුව <http://www.themorning.lk/pcoi-on-political-victimisation-says-nissankas-complaint-within-mandate/> වර්ෂ 2021 පෙබරවාරි මස 18 වන දින ප්‍රවේශ විය

48 ස්කන්ධ ගුණසේකර,'දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසමඃ විජයදාස විසින් යහපාලන ඇමතිවරුන් හෙළි කරයි' (ද මෝනිං, 2020 ජූනි 18), යොමුව < http://www.themorning.lk/presidential-commission-on-political-victimisation-wijeyadasa-exposes-yahapalana-ministers/> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

51 සුල්ෆික් ෆර්සාන්, 'පෙත්සම් විභාග වන තෙක් සාක්ෂිකරුවන් තිදෙනෙකු නොකැඳවීමට ජනාධිපති පරීක්ෂණ කොමිසම එකඟ වේ' (නිව්ස් ෆස්ට්, 2020 ජූලි 27), යොමුව <https://www.newsfirst.lk/2020/07/27/pcoi-agrees-not-to-summon-three-witnesses-until-petitions-are-heard/>

| | | |
|---|---|---|
| සභාවට නීතිපතිවරයාගේ ඕනෑම තීරණයක් සමාලෝචනය කිරීමට බලය නොමැති බව සහ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ පෙනී සිටින ලෙස ඔහුගේ නිලධාරීන්ට පෙනී සිටින ලෙසට නොතීසි නිකුත් කිරීම නීතියට පටහැනි බව ප්‍රකාශ කරන ලදි.<br><br>නීතිපතිවරයා සිය ලිපියේ සඳහන් කර ඇත්තේ රාජ්‍ය නිලධාරීන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයින් සහ පොලීසියට දේශපාලන වශයෙන් හිංසා පීඩා කිරීම සම්බන්ධයෙන් සොයා බැලීමට ජනාධිපති පරීක්ෂණ කොමිසමක් පත් කළ බවයි. පැමිණිල්ලක් සිදු කළ ඇවන්ට් ගාඩ් සභාපති නිශ්ශංක යාපා සේනාධිපතිට එවන් නීතිමය ස්ථාවරයක් නොමැති බව නීතිපතිවරයා තවදුරටත් පැවසීය.[49] | | කොමිෂන් සභාව ඉදිරියේ නීතිමය ස්ථාවරයක් නොමැත.[52]<br><br>පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ මෙන්ම විමර්ශකයින්ගේ ස්වාධීනත්වයට එමඟින් හානි වනු ඇත. |

[49] දිල්ෂාන් තාරකා, 'නීතිපති දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් සහභාගී නොවනු ඇත' (ඩේලි නිවුස්, 2020 ජූනි 23), යොමුව http://www.dailynews.lk/2020/06/23/local/221355/ag%E2%80%99s-officials-will-not-participate වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[52] සුල්ෆික් ෆර්සාන්, 'ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට නීතිපතිවරයා හෝ ඔහුගේ නිලධාරීන් විමර්ශනය කළ නොහැකː නීතිපති දෙපාර්තමේන්තුව' (නිවුස් ෆස්ට්, 2020 ජූනි 22), යොමුව https://www.newsfirst.lk/2020/06/22/pcoi-cannot-investigate-attorney-general-or-his-officers-ags-department/> වර්ෂ 2021 අප්‍රේල් මස 2 වන දින ප්‍රවේශ විය

<table>
<tr><th colspan="3">19. රක්නා අරක්ෂා ලංකා සමාගම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 1807/2020 සහ 431/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>විශ්‍රාමික මේජර් ජෙනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු<br><br>වික්ටර් සමරවීර</th></tr>
<tr><td>රක්නා අරක්ෂා ලංකා සමාගමට අදාළව පැමිණිලිකරුවන් පිළිබඳව විමර්ශනය කරන ලදි. ඇවන්ට් ගාඩ් මැරිටයිම් සර්විසස් ලිමිටඩ් විසින් රක්නා අරක්ෂා ලංකා සමාගමේ සම්පත් අනිසි ලෙස භාවිතා කර ඇති බව පරීක්ෂණයෙන් හෙළි විය. වර්ෂ 2019 සැප්තැම්බර් මාසයේදී කොළඹ මහාධිකරණය විසින් විශ්‍රාමික මේජර් ජෙනරාල්ට එරෙහිව නිකුත් කළ වරෙන්තුව නැවත කැඳවන ලද අතර විදේශ ගමන් බලපත්‍ර ඇපකරුවන්ට නිදහස් කරන ලදි.[53]</td>
<td>හිටපු සභාපතිවරුන් වන විශ්‍රාමික මේජර් ජෙනරාල් පාලිත පියසිරි ප්‍රනාන්දු සහ වික්ටර් සමරවීර ඇතුළු රක්නා ලංකා ආයතනයට සම්බන්ධ පුද්ගලයින් කිහිප දෙනෙකුගේ පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබන්නේ මෙම නඩු වලට සම්බන්ධ වගඋත්තරකරුවන්ට දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම හා දූෂණ වරදට නඩු පැවරිය යුතු බවයි.<br><br>පැමිණිලිකරු වික්ටර් සමරවීරට එරෙහිව ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදහස් කරවන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව තවදුරටත් නිර්දේශ කරනු ලබයි.</td>
<td>වර්ෂ 2020 ජනවාරි මාසයේදී ඇවන්ට් ගාඩ් නඩුවට අදාළව විශ්‍රාමලත් මේජර් ජෙනරාල් ප්‍රනාන්දු සහ තවත් සිව්දෙනෙකු කොළඹ නිත්‍ය මහාධිකරණය විසින් නිදහස් කරන ලදි. වික්ටර් සමරවීර ඇතුළු අනෙකුත් විත්තිකරුවන් 8 දෙනෙකුට එරෙහි නඩුව ඉදිරියට ගෙන යන්නේ දැයි සලකා බැලීමට නීතිපතිවරයාට දන්වන ලදි.[54]</td></tr>
</table>

53 ටී ෆාරුක් තාජුඩීන්, 'පාලිත ප්‍රනාන්දු අත්අඩංගුවට ගැනීම සඳහා නිකුත් කළ වරෙන්තුව මහාධිකරණය නැවත කැඳවයි' (ඩේලි මිරර්, 2019 සැප්තැම්බර් 5), යොමුව <http://www.dailymirror.lk/news/High-Court-recalls-the-warrant-issued-to-arrest-Palitha-Fernando/239-174037> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

54 'ඇවන්ට් ගාඩ් නඩුවෙන් 5 දෙනකු නිදහස් කරයි' (නිව්ස් ෆස්ට්, 2020 ජනවාරි 17), යොමුව <https://www.newsfirst.lk/2020/01/17/5-released-from-theavant-garde-case/ > වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

<table>
<tr><td colspan="3">20. හිටපු අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම විසින් මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 184/2020<br><br>පැමිණිලිකරු:<br><br>රෝහිත බෝගොල්ලාගම</td></tr>
<tr>
<td>අල්ලස් කොමිෂන් සභාව විසින් හිටපු ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රෝහිත බෝගොල්ලාගමට එරෙහිව සීමාව ඉක්මවා වියදම් කිරීම සම්බන්ධ දූෂණ චෝදනා සම්බන්ධයෙන් වර්ෂ 2006 දී කොළඹ මහාධිකරණයේ අධිචෝදනා ගොනු කරන ලදි.<br><br>ලන්ඩනයේ පැවති ආයෝජන ප්‍රවර්ධන ප්‍රදර්ශනයක් සඳහා හෝටල් නවාතැන් වියදම් ලෙස රුපියල් 1,170,444 ක් නිදහස් කිරීමට නීති විරෝධී ලෙස අනුමැතිය ලබා දීම සහ ප්‍රදර්ශනය සඳහා රු. 414,000 නිදහස් කිරීම සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා බලපෑම් කිරීම මෙම චෝදනාවට අදාල විය.[55]</td>
<td>හිටපු අමාත්‍ය රෝහිත බෝගොල්ලාගමට එරෙහිව ගොනු කර තිබූ අධිචෝදනා ඉල්ලා අස්කර ගන්නා ලෙසත්, නඩුවේ කරුණු ස්වාධීන කොමිසමක් විසින් නැවත සලකා බලන ලෙසත් පරීක්ෂණ කොමිසම නිර්දේශ කරනු ලබයි. එපමණක් නොව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හිටපු සොලිසිටර් ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.</td>
<td>මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, වර්තමානයෙහි සිදුවෙමින් පවතින නීතිමය කටයුතුවලට බාධා ඇති වන අතර අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට එමඟින් හානි වනු ඇත. තවත් විමර්ශන කොමිෂන් සභාවක් පත් කිරීමට නිර්දේශ කිරීම වූ කලී අදාළ විමර්ශන කටයුතු ප්‍රමාද කිරීමේ උපක්‍රමයක් බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හඳුනාගනු ලබන අතර, එවන් තත්වයක් ඔස්සේ ස්වාධීන ක්‍රියාවලියකට මග පෑදිය නොහැකි අතර පෙර පරීක්ෂණ කොමිෂන් සභාවලට එරෙහි විවේචන සැලකිල්ලට භාජනය කරනු ලබන කල්හි මෙවැනි පියවරක් මඟින් ප්‍රතිඵල ලබාගත නොහැකි වනු ඇත.<br><br>වර්ෂ 2021 පෙබරවාරි මාසයේ දී හිටපු සොලිසිටර් ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ විසින් ඇයව නැවත සේවයේ පිහිටුවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝග කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කළේය.[56]</td>
</tr>
</table>

[55] ලක්මාල් සූරියගොඩ, 'බෝගොල්ලාගම 2006 දී අධික වියදම් සඳහා අධිචෝදනා ලැබ සිටී' (ඩේලි නිවුස්, 2020 පෙබරවාරි 26), යොමුව <https://www.dailynews.lk/2020/02/26/law-order/212615/bogollagama-indicted-excessive-spending-2006> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[56] ලක්මාල් සූරියගොඩ, 'දිල්රුක්ෂි ඩයස් සොලිසිටර් ජනරාල් ලෙස නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා රිට් පෙත්සමක් ගොනු කරයි' (ඩේලි නිවුස්, 20 පෙබරවාරි 2021), යොමුව < http://www.dailynews.lk/2021/02/25/law-order/242518/dilrukshi-dias-files-writ-petition-calling-reinstatement-solicitor> වර්ෂ 2021 අප්‍රේල් මස 6 වන දින ප්‍රවේශ විය

**21. වැලිකඩ බන්ධනාගාර සමූහ මිනිස් ඝාතනය පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 07/2020 සහ 12/2020**

**පැමිණිලිකරුවන්:**

මෝසස් නියොමාල් රංගජීව ලමාහේවගේ
එමිල් රන්ජන්

| | | |
|---|---|---|
| මෙම නඩුවේ දී වැලිකඩ බන්ධනාගාරයේ සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් ගත් කල සිරකරුවන් 27 දෙනෙකු මිය ගිය අතර 43 දෙනෙකු තුවාල ලැබූහ. හඳුනාගත් ඇතැම් සිරකරුවන් තුරන් කිරීම උදෙසා මෙකී ප්‍රචණ්ඩ ක්‍රියාව සම්බන්ධීකරණයෙන් යුක්තව සිදු කළ මෙහෙයුමක් බව පසුව අනාවරණය විය. එකී මනුෂ්‍ය ඝාතනයන් පිළිබඳ පෙර පැවති විමර්ශන වලට දේශපාලන බලපෑම් හේතුවෙන් බාධා එල්ල විය.<br><br>ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු කිරීම සිදුවිය. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ ඉල්ලීම මත ශ්‍රී ලංකාවේ මානව | වර්ෂ 2012 වැලිකඩ බන්ධනාගාර මනුෂ්‍ය ඝාතනයන් පිළිබඳව මෝසස් නියොමාල් රංගජීව සහ එමිල් රන්ජන්ට එරෙහිව මහාධිකරණයේ ගොනු කර ඇති චෝදනා දේශපාලන පළිගැනීමේ ප්‍රතිඵලයක් බව විමර්ශන කොමිසම ප්‍රකාශ කරනු ලබයි. එබැවින් පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබන්නේ නීතිපතිවරයා කොමිෂන් වාර්තාවේ සොයා ගැනීම් සලකා බලා දැනට පැවැත්වෙන එකී නඩු කටයුත්ත ඉදිරියට යාම සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු බවයි.<br><br>විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරනුයේ පැමිණිලිකරුවන්ට හිමි සියලුම උසස්වීම් සමඟ නැවත සේවයේ පිහිටුවන ලෙසයි. සාක්ෂි ගොතන ලද වගඋත්තරකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග | වර්ෂ 2018 අග භාගයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය අතරතුර එවකට පොලිස්පතිවරයාගේ නියෝගයකට අනුව පොලිස් පරීක්ෂක රංගජීව නැවත සේවයේ පිහිටුවන ලදි. ඔහු නැවත සේවයේ පිහිටුවීමෙන් පසුව, වැලිකඩ බන්ධනාගාර සංහාර නඩුවේ සාක්ෂිකරුවන් ඉලක්ක කර ගනිමින් ඔහු විසින් සමාජ මාධ්‍යවල තර්ජනාත්මක පණිවිඩ පළ කර තිබේ. සිරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුව ප්‍රකාශ කළේ පොලිස් පරීක්ෂක රංගජීව නැවත සේවයේ පිහිටුවීමට එරෙහිව ජාතික පොලිස් කොමිෂන් සභාවට පෙත්සමක් ගොනු කිරීමට අදහස් කරනු ලබන බවයි.[58]<br><br>වින්දිතයින්ගේ ඥාතීන්වද බොරු චෝදනා මත සිරගත කිරීම ඇතුළුව වින්දිතයින් සහ |

[58] මනේෂ්කා බෝර්හැම්, 'පොලිස් පරීක්ෂක රංගජීව නැවත සේවයෙහි පිහිටුවීම:සිරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ කමිටුව පෙත්සමක් ගොනු කිරීමට යයි' (සන්ඩේ ඔබ්සර්වර්, 2018 නොවැම්බර් 25)

| | | |
|---|---|---|
| හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය අත්හිටුවා ඇති බව වර්ෂ 2012 දී එවකට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සභාපතිවරයා මාධ්‍යයට ප්‍රකාශ කරන ලදි.<br><br>එවකට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය චන්ද්‍රසිරි ගජදීර සහ එවකට බන්ධනාගාර කොමසාරිස් පී. ඩබ්ලිව්. කොඩිප්පිලි විසින් කොමිෂන් සභා පත් කරනු ලැබීය. මෙම කොමිෂන් සභාවන්හි වාර්තා ප්‍රසිද්ධ කර නොමැත. පාර්ලිමේන්තුවේදී මෙම විමර්ශනවල ස්වාධීනත්වය පිළිබඳව විපක්ෂ මන්ත්‍රීවරු කනස්සල්ල පළ කළ අතර, පොලීසිය සහ ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම විධායක බලපෑම යටතේ සිටියදී මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්විය නොහැකි බව අවධාරණය කරන ලදි.[57] | ගැනීමට ද පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | සාක්ෂිකරුවන් පුළුල් ලෙස බිය ගැන්වීමක් මෙම නඩුව ඔස්සේ සනිටුහන් කර තිබේ. විමර්ශන කොමිෂන් සභාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, මෙම වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට තවදුරටත් අනතුරක් විය හැකිය.<br><br>එය නීතියේ ආධිපත්‍යය හා අධිකරණයේ ස්වාධීනත්වය අඩපණ කරන අතර මෙකී සමූල ඝාතනය සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් හා නඩු පැවරීමට ඇති එකම අවස්ථාවට ද බාධා පමුණුවනු ඇත. |

[57] ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, හැන්සාඩ් වාර්තා 2012.12.19, යොමුව https://www.parliament.lk/uploads/documents/hansard/PUBDOC4234_document.pdf, 104 පිටුව

**22. රුසියාවේ හිටපු තානාපතිවරයාගේ කන්ටේනරයක් පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක 1081/2020**

**පැමිණිලිකරුවන්:**

උදයංග වීරතුංග

| | | |
|---|---|---|
| හිටපු රුසියානු තානාපති උදයංග වීරතුංගට අයත් භාණ්ඩ කන්ටේනරයක් විමර්ශනය සඳහා මූල්‍ය අපරාධ විමර්ශන අංශයට භාර දෙන ලදි. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රකාශක සඳහන් කරන ලද්දේ අදාළ කන්ටේනරය හිටපු තානාපතිවරයා විසින් තමන්ට අයත් බවට ප්‍රකාශ කර නොමැති බවත් සහ ඔහු වෙනුවෙන් ඒ සඳහා ඉදිරිපත් වීමට ද කිසිවෙකුට අවසර දී නොමැති බවත්ය.[59] හිටපු තානාපතිවරයා සිය රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය අමාත්‍යාංශයට භාර දෙන තුරු භාණ්ඩ නිදහස් කළ නොහැකි බව ඇය තවදුරටත් ප්‍රකාශ කළාය.[60] | පිළිවෙළින් රුසියාවේ හිටපු තානාපතිවරයාගේ පවුලට අයත් ගෘහ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ ව්‍යාජ තොරතුරු කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීම යන කරුණු සම්බන්ධයෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් චිත්‍රාංගනී වාගිස්වර සහ හිටපු ජ්‍යෙෂ්ඨ විධායක ජෙනරාල් සී. ඒ. එච්. එම්. විජේරත්න යන තැනැත්තන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කළ යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>කොළඹ වරායේ ඇති කන්ටේනරය මුදා හැරිය යුතු යැයි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් තවදුරටත් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් මූල්‍ය අපරාධ විමර්ශන අංශය (FCID) විසින් කරන ලද විමර්ශනය[61] ඉදිරියට යාමට එය බාධාවක් වනු ඇත. |

59 'යාවත්කාලීන කිරීම: හිටපු රුසියානු තානාපති උදයංග වීරතුංගට අයත් බහාලුම් පරීක්ෂා කිරීමට අධිකරණ නියෝගයක්' (HiruNews'lk, 2015 ජූලි 6), යොමුව <https://www.hirunews.lk/english/112724/update-court-order-to-inspect-container-belonging-former-russian-ambassadorudayanga-weerathunga> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

60 ලක්නා පරණමාන්න, 'උදයංග ගේ බහාලුම විදේශ ගමන් බලපත්‍රය නොමැතිව සිරවී ඇත: එම්එෆ්ඒ' (ඩේලි මිරර්, 6 ජූලි 2015), යොමුව <http://www.dailymirror.lk/Breaking-News/udayanga-s-container-stuck-without-passport-mfa/108-78533 > වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

61 'යාවත්කාලීන කිරීම: හිටපු රුසියානු තානාපති උදයංග වීරතුංගට අයත් බහාලුම් පරීක්ෂා කිරීමට අධිකරණ නියෝගයක්' (HiruNews'lk, 2015 ජූලි 6), යොමුව <https://www.hirunews.lk/english/112724/update-court-order-to-inspect-container-belonging-former-russian-ambassadorudayanga-weerathunga> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| කන්ටේනරය ලබා ගැනීමට තම වෛවාහක පාර්ශවයට බලය පවරන ලියකියවිලි අමාත්‍යාංශයට යවා ඇති බව පවසමින් හිටපු තානාපතිවරයා කොමිසමට සාක්ෂි ඉදිරිපත් කර තිබුණි. එපමණක් නොව, ඔහුගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය අවලංගු කිරීමෙන් පසු ඔහුට නව විදේශ ගමන් බලපත්‍රයක් ලැබී තිබුණි.<br><br>වර්ෂ 2017 ජුනි මාසයේදී කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඔහුගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය සහ තවත් විදේශ ගමන් බලපත්‍රයක් අත්හිටුවීමට නියෝග කරන ලද්දේ ඔහු මිග් යානා ගනුදෙනුව [62] සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණයට සම්බන්ධව තිබූ තත්වයක් හේතුවෙනි. පසුව ඔහු ඩුබායිහිදී අත්අඩංගුවට ගෙන, ශ්‍රී ලංකාවට ආපසු පිටුවහල් කිරීමෙන් පසුව රිමාන්ඩ් කරනු ලැබීය. වර්ෂ 2020 අප්‍රේල් මාසයේදී | | |

[62] 'උදයංග වීරතුංගගේ විදේශ ගමන් බලපත්‍ර අත්හිටුවා ඇත' (ශ්‍රී ලංකා මිරර්, 2017 ජුනි 30), යොමුව https://srilankamirror.com/news/3719-udayanga-weeratunga-s-passports-suspended වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| කොටුව මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඔහුට ඇප ලබා දෙන ලදි.[63] රුසියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ මාණ්ඩලික නිලධාරියෙකු වන නොයෙල් රණවීර මහතාගේ මරණයට සම්බන්ධ බව ඔහු විසින් ප්‍රතික්ෂේප කරන ලදි. නව රුසියානු තානාපති කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදී ශ්‍රී ලංකාවේ රුසියානු තානාපති ඇලෙක්සැන්ඩර් කර්චාවා ප්‍රකාශ කළේ මෙම ඝාතනය සම්බන්ධයෙන් රුසියානු පුරවැසියෙකු වැරදිකරු වී ඇති බවත් ඔහු දැනට සිර දඬුවමක් විඳින බවත්ය.[64] | | |

[63] 'උදයංග වීරතුංගට ඇප ලැබුණි' (නිව්ස් ෆස්ට්, 2020 අප්‍රේල් 3), යොමුව https://www.newsfirst.lk/2020/04/03/udayanga-weerathunga-granted-bail/ වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[64] චතුරි දිසානායක, 'රුසියාව ශ්‍රී ලංකාව සමග සබඳතා ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ' (ඩේලි එෆ්ටී, 2016 දෙසැම්බර් 6), යොමුව <http://www.ft.lk/article/584251/Russia-looking-to-strengthen-relations-with-Sri-Lanka> වර්ෂ 2021 අප්‍රේල් මස 2 වන දින ප්‍රවේශ විය

| 23. යුක්රේනය සමඟ මිග් ගුවන් යානා ගනුදෙනුව සම්බන්ධයෙන් විමර්ශනයන්ට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක 1080/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>උදයංග වීරතුංග | | |
|---|---|---|
| හිටපු තානාපතිවරයා සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් විමර්ශන සිදු කරන ලදි. යුක්රේනයෙන් මිග් ගුවන් යානා මිලදී ගැනීමේ දී මූල්‍ය වංචා කිරීමේ චෝදනාව මත ඔහුව ඩුබායිහිදී අත්අඩංගුවට ගෙන ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු රිමාන්ඩ් කරනු ලැබීය. ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා ඉන්ටර්පෝල් රතු දැන්වීමක් නිකුත් කර ඇති අතර ඔහුගේ නමින් ඇති බැංකු ගිණුම් අත්හිටුවා ඇත.<br><br>වර්ෂ 2020 අප්‍රේල් මාසයේ දී කොටුව මහේස්ත්‍රාත් අධිකරණය මඟින් ඔහුට ඇප ලැබුණි.[65] | මිග් ගනුදෙනුවේ මූල්‍ය අක්‍රමිකතා (ගුවන් හමුදාව සඳහා මිග් ගුවන් යානා මිලදී ගැනීම) සම්බන්ධයෙන් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩුව ඉදිරියට ගෙන යාම නීතිපතිවරයා මැදිහත් වී අත්හිටුවන ලෙසට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. හිටපු තානාපති උදයංග වීරතුංග ගේ බැංකු ගිණුම් අත්හිටුවීම සඳහා වූ අධිකරණ නියෝගය ඉල්ලා අස්කර ගැනීමට පරීක්ෂණ කොමිසම තවදුරටත් නිර්දේශ කරයි.<br><br>හිටපු තානාපතිවරයාට එරෙහිව බොරු චෝදනා ඉදිරිපත් කරමින් ඉන්ටර්පෝල් රතු දැන්වීම ලබා ගැනීමේ කාර්යභාරය සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂක නිහාල් ෆ්‍රැන්සිස්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ද පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් එය අධිකරණයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ විමර්ශකයින්ගේ ස්වාධීනත්වයට හානි කරනු ඇත. |

[65] 'උදයංග වීරතුංගට ඇප ලැබුණි' (නිව්ස් ෆස්ට්, 2020 අප්‍රේල් 3), යොමුව https://www.newsfirst.lk/2020/04/03/udayanga-weerathunga-granted-bail/ වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| **24. චුන්නාකම් පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවෙකුගේ මරණය සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 650/2020, 34 / 2020,269 / 2020 සහ 403/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>ඥානලිංගම් ධනේශ්වරී (ඥානලිංගම් මයුරන් වෙනුවෙන්) සහ තවත් අය | | |
| 1994 අංක 22 දරණ වධහිංසා සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ නින්දිත ප්‍රතිකාර හෝ දඬුවම් පිළිබඳ සම්මුතිය පනත යටතේ සැකකරුවන්ට වධහිංසා පමුණුවාලීමේ චෝදනාව මත කොස්තාපල් ඥානලිංගම් මයුරන් සහ **චුන්නාකම්** පොලිසියේ තවත් පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු වසර 10 ක් දක්වා යාපනයේ මහාධිකරණය විසින් වර්ෂ 2017 දී සිරගත කරන ලදි.<br><br>මංකොල්ලයක් සම්බන්ධයෙන් **චුන්නාකම්** පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන පලායෑමට තැත් කිරීමේ දී පුද්ගලයෙකු දියේ ගිල්වා තැබීම සම්බන්ධයෙන් කළ විමර්ශනයක් සම්බන්ධයෙන් වර්ෂ 2017 දී මයුරන්ව අත්අඩංගුවට ගෙන තිබුණි.[66] | යාපනයේ මහාධිකරණයෙන් වරදකරු කරමින් ලබාදුන් තීන්දුව සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ ගොනු කර ඇති අභියාචනයේ කටයුතු කඩිනම් කළ යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>නඩුවේ නෛතික තත්ත්වය නැවත සලකා බැලීමට හෝ නඩුව වෙනත් මහාධිකරණයකට මාරු කිරීමට ද පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. සැලකිය යුතු ප්‍රමාදයකින් පසු දෙවන වරටත් එකම සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා ගොනු කර ඇති බැවින් අගතියක් වීමට ඉඩ ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සටහන් කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ සහ විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට එමඟින් හානි වනු ඇත. |

[66] ෆාදීලා තාසිම්, 'ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා විමර්ෂණයෙහි දී ස්විස්කුමාර්ට සහාය වූ විජයකාල වීඩියෝවක් ඉදිරිපත් කිරීම' (සිලෝන් ටුඩේ, 2020 සැප්තැම්බර් 18) , යොමුව < https://ceylontoday.lk/news/video-on-vijayakala-assisting-swiss-kumar-played-at-pcoi-hearing> වර්ෂ 2021 අප්‍රේල් මස 2 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපති උපාලි අබේරත්න විසින් තහවුරු කරන ලද්දේ අත්අඩංගුවට ගත් තැනැත්තාගේ මරණය සිදුව ඇත්තේ පොලිස් නිලධාරීන්ගේ අමානුෂික පහරදීමක ප්‍රතිඵලයක් හේතුවෙන් බව මල්ලකම් මහේස්ත්‍රාත් අධිකරණය තීන්දු කළද, පශ්චාත් මරණ පරීක්ෂණයෙන් හෙළි වූයේ දියේ ගිලීම හේතුවෙන් අදාල මරණය සිදුවී ඇති අතර අත්අඩංගුවට ගත් තැනැත්තාට සුළු තුවාල පමණක් සිදුවී ඇති බවයි. මෙම පරස්පරතාවයන් පිළිබඳව සොයා බැලීමේ වගකීම නීතිපතිවරයාට ඇති බව සභාපතිවරයා තවදුරටත් කියා සිටියේය.[67]<br>මෙම චෝදනා හිටපු රාජ්‍ය අමාත්‍ය විජයකලා මහේෂ්වරන් සහ කුමාරන් සර්වානන්ද විසින් පොලිස් පරීක්ෂක චින්තක බන්ඩාර සහ කොස්තාපල් මයුරන්ට එරෙහි දේශපාලන පළිගැනීමේ ප්‍රතිඵලයක් බව පැමිණිලිකරු කියා සිටියේය. | | |

[67] ෆාදීලා තාසිම්, 'ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා විමර්ශනයෙහි දී ස්විස්කුමාර්ට සහාය වූ විජයකාල වීඩියෝවක් ඉදිරිපත් කිරීම' (සිලෝන් ටුඩේ, 2020 සැප්තැම්බර් 18), යොමුව < https://ceylontoday.lk/news/video-on-vijayakala-assisting-swiss-kumar-played-at-pcoi-hearing> වර්ෂ 2021 අප්‍රේල් මස 2 වන දින ප්‍රවේශ විය

**25. ලලිත් සේපාල රත්නායක මහතා පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක 1842/2020**

**පැමිණිලිකරුවන්:**

ලලිත් සේපාල රත්නායක

| | | |
|---|---|---|
| සේපාල රත්නායක මහතා ලන්ඩනයේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ අමාත්‍ය ධුරයක් දරා ඇති අතර රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු ලෙස කටයුතු කළ අතර ජනාධිපතිවරයාගේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ධුරය ද දැරීය. හේතු දැක්වීමකින් තොරව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපියක් මගින් තම රාජ්‍ය තාන්ත්‍රික ධූර කාලය නිමා වීමට පෙර අවසන් කළ බවට ඔහු විසින් සාක්ෂි ඉදිරිපත් කර තිබේ.<br><br>ළමා හා කාන්තා කාර්යාංශය විසින් විමර්ශනය කරන ලද පොලොන්නරුවේ ගෘහස්ථ ආරවුලක සිදුවීමකට සම්බන්ධ කිරීම මගින් ඔහුට එරෙහිව දේශපාලන පළිගැනීම් සිදු කිරීමේ ක්‍රියාවක් කර ඇති බව ඔහු තවදුරටත් කියා සිටී. පනවා තිබූ සංචාරක තහනම සහ රත්නායක මහතාට එරෙහිව අත්අඩංගුවට ගැනීමේ වරෙන්තුවට අමතරව මෙම සිදුවීම සම්බන්ධයෙන් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙහි ගොනු කර ඇති නඩුව පසුව ඉල්ලා අස්කර ගන්නා ලදි. | විනය ක්‍රියාමාර්ග ගැනීම පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි. විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එස්. එම්. වික්‍රමසිංහ සහ ඔහුගේ කණ්ඩායම විසින් සේපාල රත්නායක සහ තවත් අයගෙන් දේශපාලන පළිගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත්වරයාට අසත්‍ය කරුණු වාර්තා කිරීම සම්බන්ධව විනය පරීක්ෂණයක් සිදුකර පියවර ගතයුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදි.<br><br>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාවෙහි විධිවිධානවලට අනුව සේපාල රත්නායක රජයේ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු ලෙස ස්ථාපිත කළ යුතු බවට ද පරීක්ෂණ කොමිෂන් සභාව ද නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් පොලිස් පරීක්ෂණ අඩපණ වන අතර අනාගතයේදී එවැනි ක්‍රියාදාමයන්ට බලපෑම් සිදුවනු ඇත. |

| | | |
|---|---|---|
| **26. ලංකා ධීවර වරාය සංස්ථාවේ සේවකයෙකු පිළිබඳ විමර්ශනයන්ට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක 427/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>කුමුදුමාල් පැල්පිටිය | | |
| මීගමුව කලපු සංවර්ධන ව්‍යාපෘතියේ ගැටළු සහ දිනපොත මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් (ලංකාවේ ධීවර වරාය සංස්ථාවේ සේවකයෙකු ලෙස කටයුතු කළ) කුමුදුමාල් පැල්පිටියට එරෙහිව රහස් පොලීසියට පැමිණිල්ලක් ගොනු කරන ලදි. | අධිචෝදනාව පදනම් වූයේ හිටපු ජනාධිපතිවරයා විසින් පත් කරන ලද විමර්ශන කොමිෂන් සභාවක් විසින් මෙහෙයවන ලද පරීක්ෂණයක් මත නිසාවෙන්, එකී කරුණු සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීමට වර්තමාන පරීක්ෂණ කොමිෂන් සභාවට අධිකාරීත්වයක් නොමැති බවට සඳහන් කරන ලදි. | මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කර නොමැති බැවින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඒ පිළිබඳ වැඩිදුර අදහස් දක්වනු නොලැබේ. |
| **27. වසීම් තාජුඩීන්ගේ මරණය සහ රජයේ වාහන අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳ විමර්ශන චෝදනාවට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක 1070/2020**<br>**පැමිණිලිකරුවන්:**<br><br>කපිතාන් තිස්ස විමලසේන | | |
| කපිතාන් විමලසේන හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂක නිලධාරියෙකි. වසීම් තාජුඩීන් ඝාතනය සහ රජයේ වාහන අනිසි ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් විවිධ අවස්ථා වලදී ඔහුගෙන් ප්‍රශ්න කර ඇති අතර රහස් පොලීසිය විසින් විමර්ශනය කරන ලදි. මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් ඔහුව වර්ෂ 2017 ජූනි මාසයේදී අත්අඩංගුවට ගනු ලැබීය.[68] | තිස්ස විමලසේනට එරෙහිව ගොනු කර ඇති නඩුවේ කටයුතු තවදුරටත් ඉදිරියට ගෙන නොයායුතු බවට නීතිපතිවරයා මැදිහත් වී කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයට වාර්තා කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>පැමිණිලිකරුට එරෙහිව සාක්ෂි ගොතනලද ව්‍යාජ ප්‍රකාශ ලබා ගැනීමට තැත් කිරීම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂක ප්‍රේමතිලකට සහ තවත් පොලිස් නිලධාරියකුට එරෙහිව ජාතික පොලිස් සේවා කොමිෂන් සභාව විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතු බව | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, පවතින නඩුවක විමර්ශන සහ නීතිමය කටයුතු වලට බාධා ඇති වේ. එම නිසා එමඟින් අධිකරණයේ ස්වාධීනත්වයට අගතිදායක වන්නා සේම විමර්ශන කටයුතු වලට ද අහිතකර බලපෑම් ඇති කරනු ලබයි. |

[68] 'මූල්‍ය අපරාධ විමර්ශන අංශය මහින්ද රාජපක්ෂගේ රියදුරු කපිතාන් තිස්ස අත්අඩංගුවට ගනී' (කොළඹ ටෙලිග්‍රාෆ්, 2017 ජූනි 14), යොමුව <https://www.colombotelegraph.com/index.php/fcid-arrests-mahinda-rajapaksas-driver-captain-tissa/ > වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| | පරීක්ෂණ කොමිෂන් සභාව විසින් තවදුරටත් නිර්දේශ කරනු ලබයි. | |
| **28. ඇඩ්කෝර් ක්‍රියේටිව් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ කුමාර ජයකාන්ත පිළිබඳ විමර්ශනය සම්බන්ධයෙන් පැමිණිලි කිරීම - පැමිණිලි අංක .1940 / 2020**<br>**පැමිණිලිකරුවන්:**<br><br>කුමාර ජයකාන්ත | | |
| කුමාර ජයකාන්ත විසින් සමුපකාර තොග වෙළඳාම, පොල්ගොල්ල ව්‍යාපෘතිය සහ මහපොළ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වෙළඳ ප්‍රචාරණ සේවා ලබා දී ඇත. ඔහුගේ පැමිණිල්ලේ සඳහන් වූයේ 2015 දී පත් වූ රජය විසින් ඔහුගේ සේවය වෙනුවෙන් ඔහුට ගෙවීම් ලබා දී නොමැති බවයි. පැමිණිලිකරුට සහ ඔහුගේ කලත්‍රයාට එරෙහිව එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ගෙවීමට අපොහොසත් වීම නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත.<br><br>මූල්‍ය අපරාධ විමර්ශන අංශයට සහ අල්ලස් කොමිෂන් සභාවට ප්‍රකාශ ලබා දීමට තමා කැඳවූ බවටත් එහි දී අසත්‍ය ප්‍රකාශ සිදු කරන ලෙසට ඉල්ලා සිටි බවටත් පැමිණිලිකරු චෝදනා කරයි. | සීමාසහිත ඇඩ්කෝර් ක්‍රියේටිව් පුද්ගලික සමාගමෙහි අධ්‍යක්ෂ කුමාර ජයකාන්ත මහතා සමුපකාර තොග වෙළඳාම, පොල්ගොල්ල ව්‍යාපෘතිය සහ මහපොළ ව්‍යාපෘතියට අදාළව සිදුකරන වෙළඳ දැන්වීම් සේවා සඳහා අදාල ගෙවීම් කටයුතු සිදු කිරීමට භාණ්ඩාගාරය විසින් පියවර ගත යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කනු ලබයි. | පෞද්ගලික පුරවැසියෙකු වන පැමිණිලිකරු ඇතුළත් කිරීම සඳහා විමර්ශන කොමිෂන් සභාව ස්වකීය බලතල රාමුව ඉතා ලිහිල් ලෙස අර්ථකථනය කර ඇත. |

| **29. අල්ලස් කොමිෂන් සභාවෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක තිස්ස පිලපිටිය මාරු කිරීමට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිල්ල අංක 77/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>ප්‍රධාන පොලිස් පරීක්ෂක තිස්ස පිලපිටිය | | |
|---|---|---|
| අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීම පිළිබඳ කොමිෂන් සභාවෙන් ඔහුව මාරු කිරීමට හේතුව ඇවන්ට් ගාඩ් නඩුවේ විමර්ශනය අතරතුර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට එරෙහිව අසත්‍ය සාක්ෂි සැකසීම සඳහා ඔහු සහයෝගය නොදැක්වීම බවට ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා විසින් චෝදනා කරනු ලබයි. | පැමිණිලිකාර ප්‍රධාන පොලිස් පරීක්ෂක පිලපිටියගේ සේවා කාලය සම්බන්ධයෙන් සලකා බලා නිසි පරිදි උසස් කිරීමට පොලිස් සේවා කොමිෂන් සභාවට නිර්දේශ කිරීම පිළිබඳව පොලිස්පතිවරයා සලකා බැලිය යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට එරෙහිව දූෂණ චෝදනා ඉදිරිපත් කිරීම සඳහා අසත්‍ය සාක්ෂි සැකසීම පිණිස පොලිස් නිලධාරීන්ට අනුබල දුන් බවට දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මියට (අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ ජෙනරාල්) එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට අගතිගාමී ලෙස බලපානු ඇත.<br><br>වර්ෂ 2021 පෙබරවාරි මාසයේදී හිටපු සොලිසිටර් ජනරාල් දිල්රුක්ෂි ඩයස් වික්‍රමසිංහ විසින් ඇයව නැවත සේවයේ පිහිටුවීමට අවැසි ක්‍රියා මාර්ගයන් ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නියෝග කරන ලෙස ඉල්ලා අභියාචනාධිකරණයට රිට් පෙත්සමක් ගොනු කරන ලදි.[69] |

[69] ලක්මාල් සූරියගොඩ, 'දිල්රුක්ෂි ඩයස් සොලිසිටර් ජනරාල් ලෙස නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා රිට් පෙත්සමක් ගොනු කරයි' (ඩේලි නිවුස්, 20 පෙබරවාරි 2021), යොමුව < http://www.dailynews.lk/2021/02/25/law-order/242518/dilrukshi-dias-files-writ-petition-calling-reinstatement-solicitor> වර්ෂ 2021 අප්‍රේල් මස 6 වන දින ප්‍රවේශ විය

| 30. **සේවක භාර අරමුදල් මණ්ඩලයේ හිටපු සේවකයෙකු සම්බන්ධයෙන් වන විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක 18/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>මාලනි කුමාරි | | |
|---|---|---|
| පැමිණිලිකරු සේවක භාර අරමුදල් මණ්ඩලයේ සේවකයෙකු වූ අතර පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 වන ව්‍යවස්ථාව යටතේ (2013 අග සිට - 2015) ජනාධිපති කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු බවට පත්විය. ඇයට එරෙහි චෝදනාවන් වන්නේ සේවක භාර අරමුදල් මණ්ඩලයෙන් දේපළ/අරමුදල් වංක ලෙස අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන්ය. | පැමිණිලිකරුට එරෙහිව අධිචෝදනා පත්‍රයේ කටයුතු දිගටම කරගෙන යා යුතුද යන්න සලකා බලන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නීතිපතිවරයාට නිර්දේශ කරනු ලබයි. සේවක භාර අරමුදල් මණ්ඩලයට මාලනි කුමාරි පත් කිරීම හා උසස් කිරීම් ලබා දීම පරීක්ෂණ කොමිෂන් සභාව විසින් තවදුරටත් නිර්දේශ කරනු ලබයි.<br><br>පැමිණිලිකරු සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේදී අනවශ්‍ය ලෙස බලපෑම් කිරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස් පරීක්ෂක බන්ඩාරට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට පරීක්ෂණ කොමිසම නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් එය අධිකරණයේ සහ රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට හානි කරනු ඇත. |

| 31. ජාතික ලොතරැයි මණ්ඩලයේ (එන්එල්බී) සභාපති පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිල්ල අංක 1941/2020:<br><br>පැමිණිලිකරුවන්:<br><br>චමින්ද පුෂ්පකුමාර ඇතුලුවගේ | | |
|---|---|---|
| ජනාධිපති අපේක්ෂකයෙකුට වාසිදායක වන දැන්වීම් පුවරු (විකුණුම් ප්‍රවර්ධනය සඳහා) ස්ථාපිත කිරීමට ඔහු ගත් තීරණය සම්බන්ධයෙන් ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයාට එරෙහි සාපරාධී ලෙස අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීම සහ විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් චෝදනා පැවතුණි. විමර්ශන කොමිෂන් සභාව කියා සිටියේ මෙම චෝදනාව දේශපාලන පළිගැනීම මත සිදුව ඇති බවයි. | ජාතික ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා වන චමින්ද පුෂ්පකුමාර ඇතුලුවගේට එරෙහිව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති නඩුවෙහි වැඩිදුර ක්‍රියාමාර්ග නොගැනීම පිළිබඳව සලකා බැලීමට නීතිපතිවරයා මැදිහත් විය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් එය අධිකරණයේ ස්වාධීනත්වයට අගතිගාමී තත්වයක් ඇති කරන අතර නීතිපතිවරයාගේ කාර්ය කර්තව්‍යයන් කෙරෙහි අයතා බලපෑමක් ඇති කරයි. |

| 32. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයෙකුගේ සේවය අත්හිටුවීමට එරෙහිව වන පැමිණිල්ල - පැමිණිලි අංක 317/2020<br><br>පැමිණිලිකරු:<br><br>චමින්ද සමරකෝන් | | |
|---|---|---|
| වර්ෂ 2015 දී නව රජය බලයට පත්වීමෙන් පසු ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2/3 ශ්‍රේණියේ (සිල්ලර) විකුණුම් කළමණාකරු තනතුරෙන් ඔහුගේ සේවය අත්හිටුවා ඇති බව පැමිණිලිකරු සඳහන් කළේය. දූෂණ චෝදනා, ජනාධිපතිවරණ මැතිවරණ ව්‍යාපාරයට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අරමුදල් අනිසි ලෙස භාවිතා කිරීම සහ සුපිරි මෝටර් ක්‍රොස් තරඟාවලියකට දැන්වීම් ලබා දීම යන චෝදනා ඔහුට එරෙහිව එල්ල වී තිබුණි.[70]<br><br>අමාත්‍ය පාඨලී චම්පික රණවක සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නිලධාරීන් කිහිප දෙනෙකුට එරෙහිව අක්‍රමිකතා පිළිබඳ චෝදනා කිහිපයක් ද ඔහු විසින් ඉදිරිපත් කරන ලදී. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2/3 ශ්‍රේණියේ (සිල්ලර) විකුණුම් කළමණාකරු තනතුරට පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. සේවය අත්හිටුවීම සහ නැවත සේවයේ පිහිටුවීම අතර කාල සීමාව තුළ ඔහුට හිමි උසස්වීම් සඳහා ඔහු සුදුසුකම් ලැබිය යුතුයැයි ද පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට අගතිගාමී වනු ඇත. |

[70] 'ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය විකුණුම් කළමනාකරුවකුගේ සේවය අත්හිටුවයි' (ශ්‍රී ලංකා මිරර්, 2017 ජනවාරි 11), යොමුව <https://srilankamirror.com/news/1369-cpc-suspends-itssales-manager> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

| 33. **සේවා ස්ථාන මාරුවීම් හා විශ්‍රාම ගැනීම සම්බන්ධයෙන් හිටපු පාසල් ප්‍රාථමික විදුහල්පති උපාලි ගුණසේකර විසින් කරන ලද පැමිණිල්ල - පැමිණිලි අංක. 856/2020 පැමිණිලිකරුවන්:**<br><br>උපාලි ගුණසේකර | | |
|---|---|---|
| රාජකීය විද්‍යාලයේ විදුහල්පති ධුරයෙන් ඔහු මාරු කිරීම තමාට එරෙහි දේශපාලන පළිගැනීමේ ප්‍රතිඵලයක් බව විශ්‍රාමික විදුහල්පති උපාලි ගුණසේකර චෝදනා කරයි.<br><br>ඔහුගේ පැමිණිල්ලේ වගඋත්තරකරු ලෙස හිටපු අධ්‍යාපනය අමාත්‍ය අකිල විරාජ් කාරියාවසම්ව නම් කර ඇත. | වයස අවුරුදු 55 දී ඔහු කලින් විශ්‍රාම ගැනීම දේශපාලන පළිගැනීමේ ප්‍රතිඵලයක් වූ බැවින්, උපාලි ගුණසේකර රාජකීය විද්‍යාලයේ විදුහල්පති ධූරයට අවම වශයෙන් වසර දෙකක කාලයක් කොන්ත්‍රාත් පදනම මත නැවත පත් කළ යුතු බවට **පරීක්ෂණ** කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට එමඟින් අගතිගාමී තත්වයක් ඇති කරනු ලැබේ. |

**34. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හම්බන්තොට කම්ටු රැස්වීමට ගිනි අවියක් රැගෙන යාමේ චෝදනාවට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 893/2020**

**පැමිණිලිකරුවන්:**

එම්.එස්.පී. මල්ලවගේ

| | | |
|---|---|---|
| පැමිණිලිකරුට එරෙහි චෝදනාව වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂගේ ආරක්ෂක කණ්ඩායමේ සාමාජිකයෙකු වූ කෝප්‍රල් රුවන් සේනකට ගිනි අවියක් රැගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හම්බන්තොට කම්ටු රැස්වීමකට ඇතුළුවීමට ඉඩ දීමයි. මෙම රැස්වීමට හිටපු ජනාධිපතිවරයා වන මෛත්‍රීපාල සිරිසේන සහභාගී විය. | අතිරේක සොලිසිටර් ජනරාල් විසින් කොමිෂන් සභාවට දන්වා ඇත්තේ පැමිණිලිකරුට එරෙහිව අඟුණකොළපැලැස්ස මහේස්ත්‍රාත් අධිකරණයෙහි පැවති නඩු විභාගය අවසන් කර ඇති බවයි. නඩුව ඉදිරියට ගෙනයාම පිළිබඳව නැවත සලකා බලන ලෙස නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටි නිර්දේශය දැනටමත් අනුගමනය කර ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව සටහන් කරනු ලබයි.<br><br>පරීක්ෂණ කොමිෂන් සභාව විසින් තහවුරු කර සිටින්නේ කෝප්‍රල් ගිනි අවියක් රැගෙන නොගිය බැවින් එකී චෝදනාව පදනම් විරහිත බවත් එය දේශපාලන පළිගැනීමේ ප්‍රතිඵලයක් බවත් ය.<br><br>මීට අමතරව, මෙම නඩුවට සම්බන්ධ විමර්ශකයින්ට අසත්‍ය සාක්ෂි සකස් කිරීමේ වරද සම්බන්ධයෙන් චෝදනා ගොනු කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට අහිතකර බලපෑම් එල්ල කරනු ඇත. |

<table>
<tr><td colspan="3">35. රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ නිලධාරියා මාරු කිරීමට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 22/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>කපිල ආරියවන්ස</td></tr>
<tr><td>දිවි නැගුම ව්‍යාපෘතිය පිළිබඳ ලේඛන මුද්‍රණය කිරීමේ කටයුතුවල නියැළී සිටි හෙයින් රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවෙන් ඔහු මාරුවීම දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ බවටත්, මූල්‍ය අපරාධ පිළිබඳ විමර්ශනයකදී බැසිල් රාජපක්ෂ මහතාට එරෙහිව අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එකී තත්වයට මුහුණ දීමට සිදු වූ බවටත් කපිල ආරියවන්ස චෝදනා කරනු ලබයි.</td><td>කපිල ආරියවන්ස මහතා රජයේ තොරතුරු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අධ්‍යක්ෂ ධුරයේ නැවත සේවයේ පිහිටුවීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබන අතර ඔහුට ලැබිය යුතු සේවා හිමිකම් ලබා දිය යුතුයැයි ද නිර්දේශ කරනු ලබයි.</td><td>මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට එමඟින් හානි වනු ඇත. විමර්ශන නිර්දේශ කොමිෂන් සභාව විසින් රාජ්‍ය සේවකයින් මාරු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ස්ථාපිත කරන ලද යාන්ත්‍රණයන් මඟ හැර කටයුතු කිරීමක් සිදුවිය හැකිය.</td></tr>
<tr><td colspan="3">36. වසීම් තාජුඩීන්ගේ මරණය පිළිබඳ විමර්ශනයට සම්බන්ධ පොලිස් ස්ථානාධිපති සුමිත් පෙරේරා සේවයෙන් පහ කිරීමට එරෙහිව පැමිණිල්ල - පැමිණිලි අංක. 615/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>සුමිත් පෙරේරා</td></tr>
<tr><td>වසීම් තාජුඩීන් ඝාතනය පිළිබඳ විමර්ශනයේදී සාක්ෂි සඟවා තැබීමේ චෝදනාව මත පොලිස් ස්ථානාධිපති පෙරේරා අත්අඩංගුවේ පසුවිය. පසුව ඔහු</td><td>හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ පවුලේ සාමාජිකයින්ට එරෙහිව පසුගිය රජය විසින් සිදුකරන ලද දේශපාලන පළිගැනීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වසීම් තාජුඩීන් ඝාතනය සම්බන්ධයෙන් වූ විමර්ශනය</td><td>මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, ක්‍රියාත්මකව පවතින නඩුවක විමර්ශන සහ නීතිමය කටයුතු වලට බාධා උද්ගත වේ.</td></tr>
</table>

| | | |
|---|---|---|
| සියලු චෝදනා වලින් නිදහස් විය.[71]<br><br>රහස් පොලිසියේ විමර්ශනය අතරතුරදී හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ යන දෙදෙනා විමර්ශනයට මැදිහත් වූ බවට ව්‍යාජ ප්‍රකාශ නිකුත් කරන ලෙස නිලධාරීන් කිහිප දෙනෙකුගෙන් ඉල්ලා සිටි බවට ඔහු විසින් චෝදනා කරන ලදි. | මෙහෙයවා ඇති බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් තරයේ ප්‍රකාශ කරන ලදි.<br>වසීම් තාජුඩීන් මත්පැන් පානය කර රිය පැදවීම හේතුවෙන් රිය අනතුරක් සිදුව එකී මරණය සිදුව ඇති බව පැවසේ.<br>එකී චෝදනා ලද ඝාතනය සම්බන්ධයෙන් වන විමර්ශන වලට සම්බන්ධ වීම හේතුවෙන් අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයේ පසුවන (සහ සේවයෙන් නෙරපා හරින ලද) ස්ථානාධිපති සුමිත් පෙරේරා නැවත සේවයේ පිහිටුවීමට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. මෙකී පැමිණිල්ලේ වගඋත්තරකරුවන්ට (හිටපු පොලිස් පරීක්ෂක පූජිත් ජයසුන්දර සහ හිටපු රහස් පොලිසියේ අධ්‍යක්ෂ නාගහමුල්ල) එරෙහිව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පරීක්ෂණ කොමිෂන් සභාව තවදුරටත් නිර්දේශ කරනු ලබන අතර අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම සම්බන්ධයෙන් වන චෝදනාව සඳහා ඔවුන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ගයන් ගතයුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින වැඩි දුරටත් නිර්දේශ කරනු ලබයි. | එබැවින් එය අධිකරණයේ මෙන්ම විමර්ශකයින්ගේ ස්වාධීනත්වයට හානි කරනු ඇත. විමර්ශන කොමිෂන් සභාවේ සොයාගැනීම් දෙවන පශ්චාත් මරණ පරීක්ෂණයේ සොයා ගැනීම් සමඟ නොගැලපෙන අතර, අමානුෂික පහරදීමකින් තාජුඩීන් තුවාල ලබා ඇති බව එකී දෙවන පශ්චාත් මරණ පරීක්ෂණයේ දී අනාවරණය විය.[72]<br><br>තවද මෙම නිර්දේශයන් හරහා පළිගැනීමේ තත්වයක් ඇති වේ යැයි බියෙන් විමර්ශකයින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් වැලකීමේ තත්වයක් ද උද්ගත විය හැකිය. |

71 අවුරගි සිං සහ ආන්යා විපුලසේන, 'තජුඩීන් පුරාවෘත්තය: ඝාතනය වසන් කිරීමේ නඩු විභාගය ඔක්තෝම්බර් මාසයේ ආරම්භ වීමට නියමිතය', යොමුව <http://www.sundayobserver.lk/2019/07/21/thajudeen-saga-murder-cover-trial-set-begin-october>

72 වෙරිටේ රිසර්ච්, 'තජුඩීන් පුරාවෘත්තය: ඝාතනය වසන් කිරීමේ නඩු විභාගය ඔක්තෝම්බර් මාසයේ ආරම්භ වීමට නියමිතය', යොමුව <https://www.veriteresearch.org/2019/07/22/wasim-thajudeen-murder/>

| **37. වර්ෂ 2012 දී වැලිකඩ බන්ධනාගාර කෝලාහලයට සම්බන්ධ බන්ධනාගාර නිලධාරී ඉන්දික සම්පත් ඉවත් කිරීමට එරෙහිව පැමිණිල්ල - පැමිණිලි අංක. 43/2020**<br>**පැමිණිලිකරුවන්:**<br><br>ඉන්දික සම්පත් | | |
|---|---|---|
| වර්ෂ 2012 දී සිදු වූ වැලිකඩ බන්ධනාගාර කෝලාහලයෙන් සිරකරුවන් 27 දෙනෙකු මිය ගිය අතර තවත් සිරකරුවන් 43 දෙනෙකු තුවාල ලැබූහ. පසුව හෙළි වූ පරිදි එකී සිදුවීම වූ කලීහඳුනාගත් ඇතැම් සිරකරුවන් තුරන් කිරීම සඳහා සම්බන්ධීකරණයක් සහිතව සිදු වූ මෙහෙයුමක් වශයෙන් හඳුනා ගැණුනි. දේශපාලන බලපෑම් හේතුවෙන් එකී ජන සංහාරය පිළිබඳ පෙර පැවති විමර්ශනවලට බාධාවන් එල්ල විය. මෝසස් රංගජීව, ලමාහේවගේ එමිල් රාජන් සහ ඉන්දිකා සම්පත් යන අයට එරෙහිව නීතිපතිවරයා විසින් අධිචෝදනා ගොනු කරන ලදි.<br><br>බන්ධනාගාර නිලධාරී ඉන්දික සම්පත් අධිකරණ නඩු විභාගය පැවැත්වෙන අතරතුර පලාගොස් ඇති අතර,[73] ප්‍රමාණවත් සාක්ෂි නොමැති නිසා කොළඹ මහාධිකරණය විසින් ඔහුව නිදොස් කොට නිදහස් කරන ලදි.[74] | බන්ධනාගාර නිලධාරී ඉන්දික සම්පත් නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කරන ලෙසට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | බොරු චෝදනා මත වින්දිතයන්ගේ ඥාතීන් සිරගත කිරීම ද ඇතුළුව වින්දිතයින් සහ සාක්ෂිකරුවන් විශාල ලෙස බිය ගැන්වීම සිදු වූ නඩුවක් වශයෙන් මෙය සනිටුහන් කර තිබේ. විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් මෙම වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට තවදුරටත් අනතුරුදායක තත්වයකට මුහුණ පෑමට සිදුවිය හැකිය.<br><br>තවද එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඔස්සේ නීතියේ ආධිපත්‍යයට අගතිදායක වන අතර ස්වාධීන විමර්ශනයකට සහ සමූල ඝාතනය සම්බන්ධයෙන් නඩු පැවරීමට ඇති එකම අවස්ථාවට ද එමඟින් බාධා පැමිණෙනු ඇත. |

[73] ෆාරුක් තාජුඩීන්, 'වැලිකඩ බන්ධනාගාර සංහාරය පිළිබඳ අධිචෝදනා පත්‍රය භාර දී විත්තිකරුවන්ට ඇප මත මුදා හරින ලදි' (ඩේලි එෆ්ටී, 2019 ජූලි 19), යොමුව <http://www.ft.lk/News/Welikada-Prison-Massacre-Indictment-served-and-accused-released-on-bail/56-682259 > වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[74] දිල්ෂාන් තාරකා, 'කොළඹ මහාධිකරණ නඩු විභාගය, වැලිකඩ බන්ධනාගාර කෝලාහල සම්බන්ධයෙන් තුන්වන විත්තිකරු නිදොස් කොට නිදහස් කරයි' (ඩේලි නිවුස්, 2020 ජූලි 16), යොමුව <http://www.dailynews.lk/2020/07/16/law-order/223448/colombo-hc-trial-bar-acquits-third-accused-welikada-prison-riots > වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

<table>
<tr><td colspan="3">38. නාවික හමුදාවට මුදා හරින ලද ජාවාරම් කරන ලද රත්‍රන් පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම. 325/2020 සහ 326/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>ජගත් ප්‍රේමලාල් විජේවීර<br><br>තාරක සෙනෙවිරත්න</td></tr>
<tr><td>යුද ස්මාරකයක (සඳහිරු මහා සෑය) කොටසක් ලෙස රන් පිළිමයක් ඉදිකිරීම සඳහා නීතිවිරෝධී ලෙස රත්‍රං කිලෝග්‍රෑම් 8 ක් නාවික හමුදාවට මුදා හැරීම සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්ට (හිටපු රේගු අධ්‍යක්ෂ ජනරාල් ජගත් විජේවීර සහ හිටපු රේගු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තාරක සෙනෙවිරත්න) සාපරාධී විශ්වාසය කඩ කිරීමේ චෝදනා ලැබ තිබේ.[75]</td><td>පැමිණිලිකරුවන් වන තාරක සෙනෙවිරත්න සහ ජගත් ප්‍රේමලාල් විජේවීර යන දෙදෙනාට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති චෝදනා වලින් නිදහස් කළ යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. මීට අමතරව, දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම හා දූෂණ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. මෙම නඩුවට සම්බන්ධ පොලිස් නිලධාරීන්ට ද වැරදි ලෙස සිරගත කිරීම සම්බන්ධයෙන් නඩු පැවරිය යුතුය. සිවිල් අශක්නුතාවයන් නිර්දේශ කළ හැකි අදාළ දේශපාලඥයන් සහ දූෂණ විරෝධී කමිටුවේ නිලධාරීන් පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට කොමිෂන් සභාව තවදුරටත් නිර්දේශ කරනු ලබයි.</td><td>මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් අධිකරණයේ හා විමර්ශනයන්හි ස්වාධීනත්වය අවතක්සේරුවට ලක් වනු ඇත.<br><br>දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ [76] නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් 1978 අංක 07 දරණ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ වර්ෂ 2021 ජනවාරි 29 වන දින පත් කිරීම. වරදකරුවන් වශයෙන් හඳුනාගත් තැනැත්තන් මත ප්‍රජා අශක්නුතාවයන් පැනවීම සඳහා නිර්දේශ කිරීමට බලතල මෙම කොමිෂන් සභාවට ලබා දී ඇත.[77]</td></tr>
</table>

[75] 'හිටපු රේගු අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තවදුරටත් රිමාන්ඩ් කරයි' (ඩේලි නිවුස්, 2019 ඔක්තෝබර් 9, යොමුව <http://www.dailynews.lk/2019/10/09/local/199338/former-customs-dg-adg-further-remanded> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[76] අංක 2212/53 දරන අති විශේෂ ගැසට් නිවේදනය, යොමුව < http://www.documents.gov.lk/files/egz/2021/1/2212-53_E.pdf >

[77] චාන්දනී කිරින්දේ, 'අලුතින් පත් කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මඟින් වරදකරුවන් බවට පත් වුවහොත් පෙර රජයේ සාමාජිකයන්ට සිවිල් අශක්නුතාවන්ට මුහුණ දීමට සිදු වේ' (ඩේලි එෆ්ටී, 2021 පෙබරවාරි 1), යොමුව < http://www.ft.lk/front-page/Members-of-previous-Govt-may-face-civil-disability-if-found-guilty-by-newlyappointed-Special-Presidential-CoI/44-712430 > වර්ෂ 2021 පෙබරවාරි මස 1 වන දින ප්‍රවේශ විය

**39. ලිට්‍රෝ ගෑස් නඩුවේ මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීමේ චෝදනාවලට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 414/2020**

**පැමිණිලිකරුවන්:**

පියදස කුඩාබාලගේ

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිටපු කළමණාකාර අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ පියදාස කුඩාබාලගේ සම්බන්ධයෙන් දූෂණ විරෝධී කමිටුව කළ නිර්දේශය මත මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීම සහ සාපරාධී විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කරන ලදි.<br><br>පැමිණිලිකරුට (ගාමිණී සේනරත් සහ නීල් හපුහින්න සමඟ) ලිට්‍රෝ ගෑස් වෙතින් රුපියල් මිලියන 500 ක් අයථා ලෙස පරිහරණය කළ බවට චෝදනා එල්ල වූ අතර පසුව කොළඹ නිත්‍ය මහාධිකරණය විසින් එකී චෝදනා වලින් නිදහස් කරන ලදි.[78] | දේශපාලන පළිගැනීම් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරුවන් වුවහොත් වසර 7 ක ප්‍රජා අශක්නුතාවන් හෝ වෙනත් ක්‍රියාමාර්ග පැනවීම නිර්දේශ කිරීම සඳහා මෙහි වගඋත්තරකරුවන් විසින් පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුව පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කළ යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>පැමිණිලිකරු වන පියදාස කුඩාබාලගේ (ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හිටපු කළමණාකාර අධ්‍යක්ෂ) කළමනාකරණ උපදේශකවරයකු ලෙස දේශීය හෝ ජාත්‍යන්තර තනතුරක ස්ථාපිත කළ යුතු බවට විමර්ශන කොමිෂන් සභාව විසින් තවදුරටත් නිර්දේශ කරනු ලබයි. එසේම, පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබන්නේ ලසන්ත බණ්ඩාර මහතා ඔහුගේ අත්දැකීම් වලට ගැළපෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ තනතුරකට පත් කළ යුතු බවයි. | දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ [79] නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් 1978 අංක 07 දරණ විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ 2021 ජනවාරි 29 වන දින පත් කිරීම.<br><br>වරදකරුවන් වශයෙන් හඳුනාගත් තැනැත්තන් මත ප්‍රජා අශක්නුතාවයන් පැනවීම සඳහා නිර්දේශ කිරීමට බලතල මෙම කොමිෂන් සභාවට ලබා දී ඇත.[80] |

[78] 'ගාමිණී සේනරත් ලිට්රෝ ගෑස් නඩුවෙන් නිදොස් කොට නිදහස් කරයි' (ඉකොනොමි නෙක්ස්ට්, 2019 අගෝස්තු 8), යොමුව <https://economynext.com/gamini-senarathacquitted-in-litro-gas-case-43987/> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[79] අංක 2212/53 දරන අති විශේෂ ගැසට් නිවේදනය, යොමුව < http://www.documents.gov.lk/files/egz/2021/1/2212-53_E.pdf >

| | | |
|---|---|---|
| | ඊට අමතරව, අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමේ වැරදි සම්බන්ධයෙන් පැමිණිල්ලට සම්බන්ධ වගඋත්තරකරුවන්ට (දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයින්ට) දණ්ඩ නීති සංග්‍රහය යටතේ චෝදනා ගොනු කරන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | |
| **40. ලිට්‍රෝ ගෑස් නඩුවේ මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීමේ චෝදනාවන්ට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 416/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>ලසන්ත බන්ඩාර | | |
| ලිට්‍රෝ ගෑස් අරමුදල්වලින් රුපියල් මිලියන 500 ක් අයථා ලෙස පරිහරණය කිරීමට අනුබල දීම සම්බන්ධයෙන් චෝදනා කරමින් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන විමර්ශනය කරන ලදි. වර්ෂ 2019 අගෝස්තු මස ත්‍රිපුද්ගල නිත්‍ය මහාධිකරණය විසින් ඔහු නිදොස් කොට නිදහස් කරන ලදි.[81] | වගඋත්තරකාර දේශපාලඥයින් සහ නීතිඥයින් (දූෂණ විරෝධී කමිටුවේ සාමාජිකයන්, ජේ. සී. වැලිඅමුණ, ජයම්පති වික්‍රමරත්න සහ වෙනත් අය) සම්බන්ධයෙන් ව්‍යාජ සාක්ෂි නිර්මාණය කිරීමේ වැරදි සම්බන්ධයෙන් චෝදනා ගොනු කළ යුතු බවට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>දේශපාලන පළිගැනීම් සිදු කිරීම සම්බන්ධයෙන් වරදකරුවන් වුවහොත් වසර 7 ක ප්‍රජා අශක්නුතාවන් | දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ [82] නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් 1978 අංක 07 දරණ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ 2021 ජනවාරි 29 වන දින පත් කිරීම. |

[80] චාන්දනී කිරින්දේ, 'අලුතින් පත් කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මගින් වරදකරුවන් බවට පත් වුවහොත් පෙර රජයේ සාමාජිකයන්ට සිවිල් අශක්නුතාවන්ට මුහුණ දීමට සිදු වේ' (ඩේලි එෆ්ටී, 2021 පෙබරවාරි 1), යොමුව < http://www.ft.lk/front-page/Members-of-previous-Govt-may-face-civil-disability-if-found-guilty-by-newlyappointed-Special-Presidential-CoI/44-712430 > වර්ෂ 2021 පෙබරවාරි මස 1 වන දින ප්‍රවේශ විය

[81] 'ගාමිණී සේනරත් සහ තවත් දෙදෙනෙකු ලිට්‍රෝ ගෑස් නඩුව සම්බන්ධයෙන් නිදොස් කොට නිදහස් කරයි' (අද දෙරණ, 2019 අගෝස්තු 8), යොමුව <http://adaderana.lk/news/56947/gamini-senarath-and-2-others-acquitted-over-litro-gas-case> වර්ෂ 2021 පෙබරවාරි මස 1 වන දින ප්‍රවේශ විය

[82] අංක 2212/53 දරන අති විශේෂ ගැසට් නිවේදනය, යොමුව < http://www.documents.gov.lk/files/egz/2021/1/2212-53_S.pdf>

| | | |
|---|---|---|
| | හෝ වෙනත් ක්‍රියාමාර්ග පැනවීම නිර්දේශ කිරීම සඳහා මෙහි වගඋත්තරකරුවන් විසින් පිහිටුවන ලද දූෂණ විරෝධී කමිටුව පිළිබඳව විමර්ශනය කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කළ යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>වගඋත්තරකරුගේ සේවය අවසන් කිරීම දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ හෙයින්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඔහුගේ අත්දැකීම්වලට ගැළපෙන තනතුරකට ඔහුව පත් කිරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. | වරදකරුවන් වශයෙන් හඳුනාගත් තැනැත්තන් මත ප්‍රජා අශක්නුතාවයන් පැනවීම සඳහා නිර්දේශ කිරීමට බලතල මෙම කොමිෂන් සභාවට ලබා දී ඇත.[83] |

[83] චාන්දනී කිරින්දේ, 'අලුතින් පත් කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මගින් වරදකරුවන් බවට පත් වුවහොත් පෙර රජයේ සාමාජිකයන්ට සිවිල් අශක්නුතාවන්ට මුහුණ දීමට සිදු වේ' (ඩේලි එෆ්ටී, 2021 පෙබරවාරි 1), යොමුව < http://www.ft.lk/front-page/Members-of-previous-Govt-may-face-civil-disability-if-found-guilty-by-newlyappointed-Special-Presidential-CoI/44-712430 > වර්ෂ 2021 පෙබරවාරි මස 1 වන දින ප්‍රවේශ විය

| **41. ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය සම්බන්ධයෙන් විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම. 415/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>ප්‍රසන්න නනායක්කාර | | |
|---|---|---|
| ලසන්ත වික්‍රමතුංග ඝාතනයට අදාළ විමර්ශනයෙහි සාක්ෂි වසන් කිරීමේ චෝදනාව මත හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසන්න නානායක්කාර අත්අඩංගුවට ගෙන පසුව ඔහුට ඇප ලැබුණි.[84] | පැමිණිලිකරු වන ප්‍රසන්න නානායක්කාරට එරෙහිව ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලුම චෝදනා වලින් නිදහස් කරවන ලෙසට පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br><br>වගඋත්තරකරුවන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ඔවුන් විසින් සිදු කරන ලද වැරදිවලට දඬුවම් කිරීම තීරණය කිරීම සඳහා පරීක්ෂණයක් පැවැත්විය යුතුයැයි කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. දණ්ඩ නීති සංග්‍රහය සහ අල්ලස් පනත යටතේ අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම හා දූෂණ කිරීමේ වරදට මෙම නඩුවට සම්බන්ධ වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, දීර්ඝ වශයෙන් ප්‍රමාද වූ විමර්ශනයකට සහ නීතිමය ක්‍රියාමාර්ගවලට පසුබෑමක් ඇති වන අතර, දේශපාලනික වශයෙන් සංවේදී යැයි සැලකෙන නඩු සම්බන්ධයෙන් අනාගතයේ දී පියවර ගැනීම සම්බන්ධයෙන් පොලිස් සහ නීති නිලධාරීන් වළක්වනු ඇත.<br><br>මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ පවුලේ අය විසින් වර්ෂ 2021 ජනවාරි මාසයේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට පැමිණිල්ලක් ගොනු කළහ.[85] ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරන ආයතන විසින් අභාවප්‍රාප්ත මාධ්‍යවේදියාගේ ඝාතනය සම්බන්ධයෙන් විශ්වසනීය පරීක්ෂණයක් පැවැත්වීමට ගත් උත්සාහයන් අසාර්ථක වී හෝ එකී විමර්ශන සම්බන්ධයෙන් මැදිහත් වී ඇති බව පැමිණිල්ලේ සඳහන් වේ.[86] |

[84] ඒෂියන් මිරර්, 'ලසන්ත වික්‍රමතුංග ඝාතන නඩුව: හිටපු නියෝජ්‍ය පොලිස්පති ප්‍රසන්න නානායක්කාර සහ පොලිස් පරීක්ෂක. සුගතදාස ඇප මත මුදා හරී', යොමුව <https://asianmirror.com/news/item/27825-lasantha-wickramatunga-murder-case-former-dig-prasanna-nanayakkara-and-si-sugathadasareleased-on-bail>

[85] ග්ලෝබ් ඇන්ඩ් මේල්, 'ඝාතනයට ලක්වූ ශ්‍රී ලංකා මාධ්‍යවේදියාගේ දියණිය එක්සත් ජාතීන්ගේ අයිතිවාසිකම් කමිටුවට පැමිණිලි කරයි', යොමුව <http://theglobeandmail.com/world/article-daughter-of-slain-sri-lankan-journalist-files-complaint-with-un-rights/>

[86] 'ඝාතනය කරන ලද ශ්‍රී ලාංකික මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ දියණිය එක්සත් ජාතීන්ට පැමිණිල්ල ගොනු කරයි' (ද හින්දු, 2021 ජනවාරි 8), යොමුව https://www.thehindu.com/news/international/slain-sri-lankan-journalist-lasantha-wickrematunges-daughter-files-uncomplaint/article33530770.ece> වර්ෂ 2021 අප්‍රේල් මස 6 වන දින ප්‍රවේශ විය

| **42. හයට් රීජන්සි නඩුවට අදාළ අරමුදල් වංචනික ලෙස මාරු කළ බවට චෝදනා කිරීමට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 352/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>නීල් හපුහින්න | | |
|---|---|---|
| හයට් රීජන්සි දේපල සීමා සහිත සිනොලන්කා පුද්ගලික සමාගමට විකිණීමේ දී මුදල් වංචා කිරීම සහ ලිට්‍රෝ ගෑස් සමාගමෙන් අරමුදල් අයථා ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකාර නීල් හපුහින්නට චෝදනා එල්ල විය.<br><br>සිංගප්පූරුවේ බේරුම්කරණ විනිශ්චය සභාවක් විසින් කොන්ත්‍රාත්තුව නීති විරෝධී ලෙස අවසන් කිරීම වෙනුවෙන් සිනොලන්කාට එරෙහිව වර්ෂ 2017 ඔක්තෝබර් 6 වන දින විධිමත් තීන්දුවක් ප්‍රදානය කරන ලද අතර ඉන්ටර්නා කොන්ට්‍රැක්ට් ස්පා (බේරුම්කරණය සඳහා ගොනු කළ) වෙත යූරෝ 7,432,062.72 ගෙවන ලෙසට දැන්වීය.[87] | දණ්ඩ නීති සංග්‍රහය යටතේ අසත්‍ය සාක්ෂි නිර්මාණය කරන ලද වරදට වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරිය යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. අවශ්‍ය විමර්ශනයන් සිදු කිරීමෙන් අනතුරුව වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති පොලිස් නිලධාරීන්ට එරෙහිව ද සුදුසු විනය ක්‍රියාමාර්ග ගත යුතුයැයි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශය ක්‍රියාවට නංවන්නේ නම්, විමර්ශකයින්ගේ ස්වාධීනත්වය අඩපණ කරන අතර මහා පරිමාණ දූෂණ ක්‍රියාවන්ට දඬුවම් නොලැබේ. |

[87] ඩේලි මිරර්, 'ග්‍රෑන්ඩ් හයට් හෝටල් ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත්තුව අවසන් කිරීම නිසා රජයට විශාල පාඩුවක් සිදු වේ', යොමුව <http://www.dailymirror.lk/expose/Grant-Hyatt-Hotel-Project-Govt-suffers-mammoth-loss-due-to-termination-of-contract/333-150691>

<table>
<tr><td colspan="3">43. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැර ගැනීම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 24/2020, 200/2020, 198/2020, 196/2020, 194/2020, 197/2020, 199/2020, 195/2020, 104/2020, 239/2020, 31/2020, 231/2020, 1052/2020 සහ 347/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>කර්නල් ෂම්මි අර්ජුන කුමාරරත්න<br>ප්‍රියන්ත කුමාර රාජපක්ෂ නොහොත් නාදන්<br>විනී ප්‍රියන්ත දිලන්ජන් උපසේන නොහොත් සුරේෂ්<br>රවීන්ද්‍ර රූපසේන නොහොත් රංජි<br>චමින්ද කුමාර අබේරත්න<br>කනිෂ්ක ගුණරත්න<br>අයියා සාමි බාලසුබ්‍රමනියම්<br>තරංග ප්‍රසාද් ගමගේ<br>ටී ඊ ආර් පීරිස්<br>කර්නල් ප්‍රබෝධ සිරිවර්ධන ඇතුළු පිරිස</td></tr>
<tr><td>මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ පැහැරගෙන ගොස් ඝාතනය කිරීමේ [88] කුමන්ත්‍රණය සම්බන්ධයෙන් අධිචෝදනා ලැබ සිටි පුද්ගලයන් අතුරෙන් කිහිප දෙනෙකු මෙහි පැමිණිලිකරුවන් වේ. සාක්ෂි රඳවා ගැනීමට උත්සාහ කිරීම සහ සාක්ෂිකරුවන් බිය ගැන්වීම හේතුවෙන් විමර්ශන කටයුතු ප්‍රමාද වී තිබුණි.[89]</td><td>මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වන වගඋත්තරකරුවන් කිහිප දෙනෙකුට (හිටපු අමාත්‍ය මංගල සමරවීර, රහස් පොලිසියේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර සහ තවත් අය ඇතුළුව) අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීම, ව්‍යාජ ලේඛන සැකසීම සහ වැරදි ලෙස සිරගත කිරීම යන චෝදනා යටතේ චෝදනා ගොනු කළ යුතු බව පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.</td><td>මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, දීර්ඝ ලෙස ප්‍රමාද වූ විමර්ශනයකට සහ නීතිමය ක්‍රියාමාර්ගවලට පසුබෑමක් ඇති වන අතර අධිකරණයේ සහ විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට අගතිදායක වනු ඇත. සාක්ෂි රඳවා තබා ගැනීමට උත්සාහ කිරීම සහ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් බිය ගැන්වීම සම්බන්ධයෙන් මෙම විමර්ශනය ඉතා වැදගත්</td></tr>
</table>

88 ඩේලි මිරර්, 'ප්‍රගීත් එක්නැලිගොඩ නඩුව: හමුදා නිලධාරීන් නවදෙනෙකුට අධිචෝදනා ගොනු කර තිබේ', යොමුව <http://www.dailymirror.lk/breaking_news/Prageeth-Ekneligoda-case-Nine-army-officials-indicted/108-178597>

89 සන්ඩේ ඔබ්සර්වර්, ප්‍රගීත්: ''දේශපාලනික වශයෙන් අභිප්‍රේරිත අපරාධයක්'', යොමුව <http://www.sundayobserver.lk/2019/01/20/newsfeatures/prageeth-%E2%80%9C-politically-motivated-crime%E2%80%9D>

| | | |
|---|---|---|
| විමර්ශන කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි කර්නල් සිරිවර්ධන චෝදනා කරන ලද්දේ මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩව ලේකම් ගෝඨාභය රාජපක්ෂගේ උපදෙස් මත පැහැරගෙන ගොස් ඇති බව සඳහන් කිරීමට රහස් පොලීසියේ නිලධාරීන් තමාට බලපෑම් කළ බවයි.[90] | හෝමගම මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලුම චෝදනා වලින් පැමිණිලිකරුවන් නිදොස් කොට නිදහස් කරන ලෙස විමර්ශන කොමිෂන් සභාව තවදුරටත් නිර්දේශ කරනු ලබයි. එසේම, පැමිණිලිකරුවන් කිහිප දෙනෙකුට එරෙහිව මහාධිකරණයේ ගොනු කර ඇති නඩුවේ අධිචෝදනා ඉල්ලා අස්කර ගත යුතුයැයි ද පරීක්ෂණ කොමිෂන් සභාව සඳහන් කරනු ලබයි.<br><br>කර්නල් ෂම්මි අර්ජුන් කුමාරරත්න මහතාට අහිමි වූ විදේශ සේවයේ තනතුර ලබා දෙන ලෙස විමර්ශන කොමිසම නිර්දේශ කරයි. පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරන්නේ පොලිස් සේවයේ වගඋත්තරකරුවන් කිහිප දෙනෙකුට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර ඒ අනුව විනය ක්‍රියාමාර්ග ගත යුතු බවයි.<br><br>දූෂණ විරෝධී කමිටුව විසින් නිශ්චිත පිරිසක් ඉලක්ක කර ගත් බව පරීක්ෂණ කොමිසම තරයේ කියා සිටී. එබැවින්, එවන් යාන්ත්‍රණ නැවත ඇති නොවීම සහතික කිරීම සඳහා නෛතික විධිවිධාන හඳුන්වාදීම විමර්ශන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | සන්ධිස්ථානයක් සලකුණු කරයි. |

90 සුල්ෆික් ෆර්සාන්, 'ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සාක්ෂිකරුවකු කියා සිටින්නේ එක්නැලිගොඩ ගැන ප්‍රකාශයක් කිරීමට සීඅයිඩී නිලධාරීන් ඔහුට බලපෑම් කළ බවයි', යොමුව <https://www.newsfirst.lk/2020/08/25/pcoi-witness-claims-cid-officers-pressured-him-to-make-statement-on-ekneligoda/>

| **44. කීත් නොයාර් පැහැර ගැනීම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිලි අංක. 232/2020, 353/2020, 297/2020, 257/2020, 253/2020, 241/2020, 242/2020, 204/2020, 239/2020, 203/2020 සහ 296/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br>විශ්‍රාමික මේජර් ජෙනරාල් අමල් කරුණාසේකර<br>බණ්ඩාරා දිසානායක බුලත්වත්ත<br>නිශාන්ත ජයතිලක<br>චාමික සුමිත්<br>කෝප්‍රල් නිශාන්ත කුමාර ඇතුළු පිරිස | | |
|---|---|---|
| කීත් නොයාර් පැහැර ගැනීම පිළිබඳ විමර්ශනය පිළිබඳව පැමිණිලිකරුවන් සම්බන්ධ වේ. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා දීර්ඝ ප්‍රමාදයක් ඇති බව විමර්ශනය තුළින් පෙණුනි.[91] විමර්ශනයට සම්බන්ධ පුද්ගලයින් කිහිප දෙනෙකු පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ අසත්‍ය ප්‍රකාශ[92] ලබා දීමට සහ සාක්ෂිකරුවන් ලෙස පෙනී සිටීමට අපරාධ විමර්ශන | ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිලිකරුවන්ට එරෙහිව ගොනු කර ඇති සියලුම චෝදනා වලින් නිදහස් කරවන ලෙස පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි. මීට අමතරව, වගඋත්තරකරුවන් ( අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ශානි අබේසේකර, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු පරීක්ෂක නිශාන්ත සිල්වා මෙම නඩුවට සම්බන්ධ පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක ඇතුළු) පිරිසට දණ්ඩ නීති සංග්‍රහය යටතේ අසත්‍ය සාක්ෂි නිර්මාණය කිරීමේ වැරදි සම්බන්ධයෙන් චෝදනා ගොනු කිරීමට පියවර ගතයුතු බවට විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරනු ලබයි.<br>විමර්ශනයට සම්බන්ධ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු නිලධාරීන්ට දණ්ඩ නීති සංග්‍රහයේ 338 | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, දීර්ඝ කාලයක් ප්‍රමාද වූ විමර්ශනයකට සහ නීතිමය ක්‍රියාමාර්ගවලට පසුබෑමක් ඇති වන අතර, විමර්ශනවලට සම්බන්ධ නිලධාරීන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමෙන් වලක්වනු ඇත.<br><br>නිලධාරීන් විසින් ඔවුන්ගේ රාජකාරි ඉටු කිරීමේ දී පළිගැනීම පිළිබඳ භීතියකින් පසුවන අතර, පළිගැනීමේ බියෙන් එවැනි නිලධාරීන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් වලක්වනු ඇත. |

[91] මනේෂ්කා බෝරාම්, 'දුරකථන වාර්තා මගින් කීත් නොයාර් පැහැර ගැනීමේ නඩුවේදී සීඅයිඩී විසින් විශාල අත්අඩංගුවට ගැනීමකට සැරසේ', යොමුව <http://www.sundayobserver.lk/2018/04/15/news-feature/phone-records-lead-cid-big-arrest-keith-noyahr-abduction-case>

[92] සුල්ෆික් ෆර්සාන්, 'අපරාධ විමර්ශන දෙපාර්තමේන්තු ලසන්ත වික්‍රමතුංග ඝාතනය සම්බන්ධයෙන් අධිකරණය නොමඟ යවයි; හිටපු බුද්ධි අංශ නිලධාරී', යොමුව <https://www.newsfirst.lk/2020/10/28/cid-misled-court-over-lasantha-wickrematunge-killing-ex-intelligence-officer/>

| | | |
|---|---|---|
| දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් විසින් තමන්ට බලපෑම් කර පෙළඹ වූ බවයි.[93] | වන වගන්තිය යටතේ වැරදි ලෙස සිරගත කිරීම සම්බන්ධයෙන් චෝදනා ගොනු කරනු ලැබිය යුතුය. විනය පරීක්ෂණයක් පවත්වා පොලිස් සේවයේ වගඋත්තරකරුවන්ට එරෙහිව පියවර ගත යුතුය. එසේම, පොලිස් කාලය තුළ මහජන මුදල් අනිසි ලෙස භාවිතා කිරීම සිදුවී ඇත්දැයි පොලිස්පතිවරයා විසින් විමසා බැලිය යුතුය. | |
| **45. ඉඩමක් මිලදී ගැනීම පිළිබඳ විමර්ශනයට එරෙහිව පැමිණිල්ල ඩී.ඒ. රාජපක්ෂ පදනම- පැමිණිලි අංකය. 1885/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>විලියම් විජේසිංහ ගමගේ | | |
| මෙම නඩුව ඩී. ඒ. රාජපක්ෂ පදනම විසින් ගම්පහ දිස්ත්‍රික්කයේ ඉඩමක් මිලදී ගැනීමට පැමිණිලිකරුගේ මැදිහත්වීම හා සම්බන්ධය.<br>ඉඩම මිලදී ගැනීම සඳහා හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ අරමුදල් ලබා ගත් ආකාරය පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් විමර්ශනය කරන ලදී.[94] ඉඩම විකිණීම හා පැවරීම නැවැත්වීමට ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණය නියෝග කරන ලදී.[95] | පැමිණිලිකරු වන විලියම් විජේසිංහ ගමගේට (වර්ෂ 2010 දී හිටපු අමාත්‍ය බැසිල් රාජපක්ෂගේ පාර්ලිමේන්තු මැතිවරණ ව්‍යාපාරයේ සාමාජිකයකු වූ) එරෙහිව ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනු කර ඇති සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කර ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදු කළ පොලිස් නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුයැයි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත්, දීර්ඝ කාලයක් ප්‍රමාද වූ විමර්ශනයකට සහ නීතිමය ක්‍රියාමාර්ගවලට පසුබෑමක් ඇති වන අතර, විමර්ශනවලට සම්බන්ධ නිලධාරීන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමෙන් වලක්වනු ඇත. |

93 සිලෝන් ටුඩේ, 'මාධ්‍යවේදී කීත් නොයාර් පැහැර ගැනීමේ නඩුව: රජයේ සාක්ෂිකරුවෙකු ලෙස පෙනී සිටීමට බල කෙරුණි - විශ්‍රාමික සැරයන් සෝමසූරිය', යොමුව <https://ceylontoday.lk/news/journalist-keith-noyahr-abduction-case-was-coerced-into-appearing-as-state-witness-rtd-sgt-somasuriya>

94 ඩේලි මිරර්, 'මූල්‍ය අපරාධ විමර්ශන අංශය බැසිල්ගේ කාර්යාලය සම්බන්ධයෙන් නියෝගයක් ලබා ගනී', යොමුව <https://www.pressreader.com/sri-lanka/daily-mirror-srilanka/20151125/281500750162135>

95 ඉහත එම

| 46. මල්වාන ප්‍රදේශයෙහි අක්කර 16 ක ඉඩම පිළිබඳ විමර්ශනයන්ට එරෙහිව පැමිණිලි කිරීම. 1968/2020<br><br>පැමිණිලිකරුවන්:<br><br>තිරුකුමාර් නඩේසන් | | |
|---|---|---|
| මල්වාන ප්‍රදේශයෙහි අක්කර 16 ක ඉඩමක විමර්ශනය සම්බන්ධයෙන් පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර පසුව ඔහු ඇප මත මුදා හරින ලදි.[96]<br><br>මෙම ඉඩම හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ විසින් මහජන මුදල් යොදවා මිලදී ගත් බවට විශ්වාස කෙරේ. හිටපු ඇමතිවරයා ඉඩමේ අයිතිය ප්‍රතික්ෂේප කර තිබුණි. හිටපු අමාත්‍යවරයාට එරෙහිව මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් මුදල් විශුද්ධිකරණ පනත යටතේ ගොනු කර ඇති නඩුවට සම්බන්ධ මෙම ඉඩම වෙන්දේසි කරන ලෙස පූගොඩ මහේස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු නියෝග කරන ලදි.[97] | මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ බැසිල් රාජපක්ෂට එරෙහිව අසත්‍ය පැමිණිල්ලක් ගොනු කිරීම සම්බන්ධයෙන් උපුල් කුමාර රාමවික්‍රමට එරෙහිව පියවර ගන්නා ලෙස විමර්ශන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. එකී අසත්‍ය චෝදනාව පදනම් කරගෙන පූගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ චෝදනා ගොනු කළ පොලිස් නිලධාරීන් දෙදෙනාට එරෙහිව ද විනය ක්‍රියාමාර්ග ගත යුතුයැයි පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.<br>ගම්පහ මහාධිකරණයේ ගොනු කර ඇති අධිචෝදනාව ඉල්ලා අස්කර ගැනීමට කටයුතු කරන ලෙසට ද පරීක්ෂණ කොමිෂන් සභාව තවදුරටත් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ හොත් එය අධිකරණයේ, නීතිපති දෙපාර්තමේන්තුවේ කටයුතු වලට බාධාවක් වන අතර විමර්ශකයින්ගේ ස්වාධීනත්වය අවතක්සේරුවට කලක් කිරීමක් ද වේ. |

[96] මහානාම විතානගේ, 'තිරුකුමාර් නඩේසන් අත්අඩංගුවට ගෙන ඇප ලබා දෙන ලදි' (ඩේලි නිවුස්, 2016 ඔක්තෝබර් 18), යොමුව <http://www.dailynews.lk/2016/10/18/local/96297 > වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

[97] 'මූල්‍ය අපරාධ විමර්ශන අංශය විසින් නිරූපමා රාජපක්ෂගේ සැමියා අත්අඩංගුවට ගනී' (ඩේලි මිරර්, 2016 ඔක්තෝබර් 17), යොමුව <http://www.dailymirror.lk/117555/www.hsbc.lk> වර්ෂ 2021 පෙබරවාරි මස 18 වන දින ප්‍රවේශ විය

| | | |
|---|---|---|
| **47. කොළඹ මහ නගර සභාවේ කොමසාරිස්වරයාට එරෙහිව මහජන මුදල් අයථා ලෙස පරිහරණය කිරීමේ චෝදනාවලට සම්බන්ධ පැමිණිලි කිරීම - පැමිණිලි අංක. 956/2020**<br><br>**පැමිණිලිකරුවන්:**<br><br>හද්‍රානි ජයවර්ධන | | |
| පැමිණිලිකාරිය කොළඹ මහ නගර සභාවේ කොමසාරිස්වරිය ලෙස සිටියදී මැතිවරණ ව්‍යාපාර සඳහා රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කිරීමේ චෝදනාව මත පැමිණිලිකාරියට මීට පෙර සේවයට වාර්තා කිරීම අවශ්‍ය නොවන බවට දන්වා තිබුණි. කොළඹ නගරාධිපති ඒ. ජේ. එම්. මුසම්මිල් ද ප්‍රකාශ කර තිබුණේ කොමසාරිස්වරිය විසින් කොළඹ මහ නගර සභාවේ සේවකයින් දෙපාර්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුවට මාරු කිරීම මගින් මැතිවරණ නීති උල්ලංඝනය කර ඇති බවය.[98] | පැමිණිලිකාර හද්‍රානි ජයවර්ධනට කොළඹ මහ නගර සභාවේ සේවයට වාර්තා කිරීමට අවසර දෙන ලෙසත්, ඇයගේ විශ්‍රාම ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කරන ලෙසත් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශය ක්‍රියාත්මක වුවහොත් රාජ්‍ය සේවයේ ස්වාධීනත්වයට එමගින් අගතිගාමී ප්‍රතිවිපාක උද්ගත කරනු ඇත. |

[98] යොහාන් පෙරේරා සහ ජෙහාන් ගුණසේකර, 'මුසම්මිල් පූර්ව මැතිවරණ යුද මාවතේ' (ඩේලි මිරර්, 2014 දෙසැම්බර් 23), යොමුව <https://www.pressreader.com/sri-lanka/daily-mirror-sri-lanka/20141223/281672548296648> වර්ෂ 2021 පෙබරවාරි මස 19 වන දින ප්‍රවේශ විය

| **48. විවිධ චෝදනා හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනෙකු ඉවත් කිරීමට එරෙහිව පැමිණිලි - පැමිණිලි අංක. 571/2020, 434/2020, 1871/2020, 950/2020, 1140/2020, 1141/2020, 60/2020, 555/2020, 551/2020, 554/2020, 274/2020, 1320/2020, 610/2020 සහ 567/2020**<br>**පැමිණිලිකරුවන්:**<br>රෝහන ප්‍රදීප් ජයසූරිය<br>නිමල්සිරි ලක්ෂ්මන්<br>අජිත් පුෂ්පකුමාර<br>ප්‍රියන්ත ගුණතිලක බණ්ඩාර සහ වෙනත් අය | | |
|---|---|---|
| රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම, දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ ක්‍රියාමාර්ගයන්හි යෙදීම සහ මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ චෝදනා හේතුවෙන් මීට පෙර සේවයෙන් ඉවත් කළ රාජ්‍ය හෝ පොලිස් සේවයේ නිලධාරීන් කිහිප දෙනෙකු මෙහි පැමිණිලිකරුවන් වශයෙන් ඇතුළත් වේ. | රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම, දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ ක්‍රියාමාර්ග සහ මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ චෝදනා හේතුවෙන් මීට පෙර සේවයෙන් ඉවත් කළ රාජ්‍ය හෝ පොලිස් සේවයේ නිලධාරීන් කිහිප දෙනෙකු නැවත සේවයේ පිහිටුවීම හා වන්දි ගෙවීම සඳහා අවැසි කටයුතු කරන මෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි. | මෙම නිර්දේශ ක්‍රියාත්මක වුවහොත් රාජ්‍ය සේවයේ සහ විමර්ශකයන්ගේ ස්වාධීනත්වයට හානිදායක තත්වයක් උද්ගත වනු ඇත. |

# පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් වන ගමනමාර්ගයන් සහ අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර

පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරනු ලැබුවහොත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පුද්ගල අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමේ රාජ්‍ය වගකීම සහ සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිවාසිකම් උල්ලංඝණය වීමට එය හේතු වන අතර අධිකරණය, නීතිපති දෙපාර්තමේන්තුව සහ වෙනත් ආයතන කිහිපයක ස්වාධීනත්වය ද එමගින් අවතක්සේරුවට ලක් කරනු ඇත. තවද, පළිගැනීමට ලක්වීමේ බිය හේතුවෙන් සාක්ෂිකරුවන් ඉදිරියට පැමිණීම අධෛර්යමත් කිරීමට අමතරව, දේශපාලනික වශයෙන් සංවේදී යැයි සැලකෙන නඩු විභාග කිරීම් සහ නඩු පැවරීම් සඳහා අවශ්‍ය පියවර ගැනීමෙන් අදාල නිලධාරීන්ව වළක්වාලීමට මෙම නිර්දේශයන් පූර්වාදර්ශයක් සපයනු ලබයි. පරීක්ෂණ කොමිෂන් සභාවේ ප්‍රතිඵල ඔස්සේ වර්තමානයෙහි සිදුවෙමින් පවතින වගවීමේ ක්‍රියාවලීන් කෙරෙහි දිගු කාලීන අහිතකර ප්‍රතිවිපාකයන් උද්ගත කළ හැකි අතර දීර්ඝ කාලීන ප්‍රමාදවීම් සහිත පරීක්ෂණ සහ නීතිමය කටයුතු සම්බන්ධයෙන් තවදුරටත් පසුබෑමක් ඇති කළ හැකි අතර එමගින් වරදවල් සම්බන්ධයෙන් දඬුවම් නොලැබ සිටීම පිළිබඳ ශ්‍රී ලංකාවෙහි පවතින තත්වය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසාන වාර්තාවෙහි අංක 09 සහ 10 යන අයිතමයන්හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරනු පිණිස අනුමැතිය ඉල්ලා අගමැති මහින්ද රාජපක්ෂ විසින් වර්ෂ 2021 අප්‍රේල් 9 වන දින පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. ඉහත වගුවේ සලකුණු කර ඇති දූෂණ හා මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධ සංකේතාත්මක නඩු කටයුතු කිහිපයක් සහ වර්තමානයෙහි සිදුමේින් පවතින විමර්ෂණයන් පිළිබඳ නිර්දේශයන් පෙරකී අංක 09 සහ 10 අයිතමයන්හි ඇතුළත් වේ. මෙම යෝජනාව මේ සතියේ අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ලැයිස්තුගත කර ඇත.

අයිතම අංක 09 හි සඳහන් පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ගනු ලැබූ තීරණ හා නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරයා සහ අමාත්‍යාංශයන්හි ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීමට පාර්ලිමේන්තුවේ අනුමැතිය මෙම යෝජනාව ඔස්සේ ඉල්ලා සිටිනු ලැබේ. තවද, එකී නඩු කටයුතු හා සම්බන්ධිත විමර්ශකයින්, නීතිඥයින්, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, සාක්ෂිකරුවන් සහ නඩු වලට සම්බන්ධ වෙනත් අයට එරෙහිව අපරාධ නඩු පැවරීම සඳහා අවැසි ක්‍රියාමාර්ගයන් ගැනීමට සහ වර්තමානයෙහි අධිකරණයෙහි විභාග වෙමින් පවතින නඩු කිහිපයක් නිෂ්ප්‍රභ කිරීමට ද එම යෝජනාව මඟින් අනුමැතිය ඉල්ලා සිටිනු ලැබේ. එකී යෝජනාව පාර්ලිමේන්තුවේදී සම්මත වුවහොත්, එය අධිකරණයේ ස්වාධීනත්වය හා නීතියේ ආධිපත්‍යය අවතක්සේරුවට ලක් කිරීමට හේතු වනු ඇත.

පුද්ගලයන් සහ ආයතන ඉලක්ක කර ගැනීම සඳහා සකස් කරන ලද යාන්ත්‍රණයක් සඳහා ආයතනික රාමුවක් සපයන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව පිහිටුවීම හරහා මෙම තත්වය තවදුරටත් උග්‍ර වී ඇත්තේ එමගින් එවැනි පුද්ගලයින්ට සහ ආයතනවලට නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමට ඇති හැකියාවට ද හානිදායක පසුබිමක් උද්ගත කරමිනි. මෙකී පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසාන වාර්තාවෙහි අයිතම අංක 08 යටතේ ලැයිස්තුගත කර ඇති දේශපාලන පළිගැනීම් සම්බන්ධයෙන් වැරදිකරුවන් වූවන් මත ප්‍රජා අශක්නුතාවයන් පැනවීමට නිර්දේශ කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට බලතල ලබා දී ඇත. පරීක්ෂණ සභාවක් යනු කරුණු සෙවීමේ ආයතනික ව්‍යුහයක් පමණක් වන අතර, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ බලතල පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් කෙරෙහි පුළුල්ව විහිදුනු අගතිගාමී බලපෑමක් ඇති කරනු ලබයි. විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වයන් පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පහත දැක්වෙන කරුණු සාකච්ඡාවට බඳුන් කරනු ලබයි.

## II වන කොටස - දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

මෙම II වන කොටස මගින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වල නෛතික රාමුව පෙන්වා දී ඇති අතර පුරවැසියන්ගේ මූලික මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ඔවුන්ගේ නිර්දේශයන්හි ගම්‍යාර්ථයන් නිරූපණය කිරීම සඳහා අතීතයේ පැවති විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන්හි කෙටි විස්තරයක් මීට අන්තර්ගත වේ. වර්ෂ 2021 අප්‍රේල් මාසයේ වලංගු කාලය දීර්ඝ කරන ලද වත්මන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ බලතල රාමුව පිළිබඳ දළ විශ්ලේෂණයක් ද මෙම කොටසට ඇතුළත් ය.

### නෛතික රාමුව සහ අදාළ ගැටළු

#### 1978 අංක 4 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත් කෙටුම්පත වර්ෂ 1978 ජනවාරි 30 වන දින ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර එය වර්ෂ 1978 පෙබරවාරි 2 වන දින සම්මත විය. පනත් කෙටුම්පතක් දින හතක කාලයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි තිබිය යුතු වීමේ ව්‍යවස්ථාමය අවශ්‍යතාවය ද මගහරිමින් මෙම පනත් කෙටුම්පත "ජාතික අවශ්‍යතා සඳහා හදිසි කාරණයක්" ලෙස

වර්ගීකරණය කර අනවශ්‍ය ලෙස කඩිනමින් සම්මත කරන ලද අතර එහි දී එකී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මහජනතාවට අදහස් දැක්වීමට ඇති අවස්ථාව ද අහිමි කරන ලදි.[99]

මෙම පනතේ 2 වන වගන්තියට අනුව, ඕනෑම රාජ්‍ය හෝ පළාත් පාලන ආයතනයක පරිපාලනය, ඕනෑම නීතියක් හෝ යුක්තිය පසිඳලීම හෝ ඔහුගේ මතය අනුව, කිසියම් කාරණයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් මඟින් තොරතුරු විමසා බලා ලබා ගැනීම මහජන යහපත, ආරක්ෂාව හෝ සුභසාධනය සඳහා අවශ්‍ය යැයි ජනාධිපතිවරයා සිතන සෑම අවස්ථාවකම, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීමේ හැකියාව ඇත.

මෙම පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක බලතල පනතේ 7 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව දක්වා ඇත.

(1) (අ) කොමිසම අවශ්‍ය යැයි සිතන පරිදි, සාක්ෂි ලබා ගැනීම සහ ඒ සඳහා කටයුතු සැලසීම සහ සාක්ෂිකරුවන් ලෙස පුද්ගලයන් පරීක්ෂා කිරීම

(ආ) කිසියම් සාක්ෂිකරුවෙකුගේ සාක්ෂි දිවුරුමකින් හෝ ප්‍රතිඥාවක් කිරීමකින් ලබා දෙන ලෙස ඉල්ලා සිටීම සහ එවැනි සෑම සාක්ෂිකරුවෙකුටම කොමිෂන් සභාව විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් ලබා දීම පරිපාලනය කරනු ලැබීම.

(ඇ) කොමිෂන් සභාවේ ඕනෑම රැස්වීමකට සාක්ෂි දීමට හෝ යම් තැනැත්තකු සන්තකයේ කිසියම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට කැඳවීම, ඔහු සාක්ෂිකරුවෙකු ලෙස විභාග කිරීම හෝ ඔහු සන්තකයේ ඇති ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටීම.

(ඈ) සාක්ෂි ආඥා පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන මඟින් කුමක් සඳහන් වුවද; සිවිල් හෝ අපරාධ නඩු කටයුතු වලදී ඕනෑම අධිකරණයක දී අනුමත කළ නොහැකි සාක්ෂි පිළිගැනීම

(ඉ) අවසර දීමෙහි අඩංගු ඕනෑම මඟපෙන්වීමකට යටත්ව, අදාල පරීක්ෂණ කටයුත්ත මහජනයාට සහ මාධ්‍යට විවෘත කිරීම හෝ ඉන් බැහැර කිරීමට

---

[99] ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, ඉක්මන් නීති සම්පාදනය සහ ජනතාවගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන නිවේදනය (1978 පෙබරවාරි 19)

(ඊ) මෙම නීතිය යටතේ විමර්ශනයට භාජනය වන හෝ විමර්ශනය කෙරෙන කාරණයකට සම්බන්ධ හෝ සැලකිලිමත් වන ඕනෑම පුද්ගලයෙකුට ඒ සම්බන්ධයෙන් දැරීමට වන පිරිවැය සහ වියදම් කොමිෂන් සභාවේ මතය අනුව එවැනි මුදලක් ප්‍රදානය කළ යුතු යැයි නිර්දේශ කිරීම.

(2) මෙම නීතිය යටතේ ස්ථාපිත කොමිෂන් සභාවක් සඳහා; එවන් කොමිෂන් සභාවක ඉල්ලීම මත, පහත සඳහන් සියළු හෝ ඕනෑම බලයක් බලතල සංශෝධනය කිරීමක් මගින් ජනාධිපතිවරයා විසින් ප්‍රදානය කළ හැකිය.

(අ) කොමිෂන් සභාව විසින් ඕනෑම පුද්ගලයෙකුගේ ක්‍රියාවක් විමර්ශනයට භාජනය කෙරෙමින් පවතින විට එකී තැනැත්තා විසින් ඕනෑම පුද්ගලයකු සමඟ යම් ගනුදෙනුවකට අදාළ සටහන් කිරීම් අඩංගු බැංකුවක හෝ ආයතනයක කිසියම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස ඕනෑම බැංකුවක හෝ ණය දෙන ආයතනයක කළමනාකරුවෙකුට හෝ ඕනෑම නිලධාරියෙකුට ලිඛිතව දැනුම් දීම.

(ආ) කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලබන ඕනෑම පුද්ගලයෙකුගේ කටයුතුවලට අදාළ අදාල නිලධාරියා සතුව ඇති සියලු තොරතුරු එම නිලධාරියා විසින් ලබා දිය යුතු බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ විනිමය පාලක හෝ වෙනත් අදාළ නිලධාරියෙකුට ලිඛිතව දැනුම් දීම.

(ඇ) සාධාරණ ලෙස මුදල් ආපසු ගැනීම ලිඛිතව අනුමත කර ඇති අවස්ථාවක හැර, ඕනෑම බැංකුවක කළමනාකරු විසින් එම බැංකුවේ ඇති ඕනෑම ගිණුමක ණය සඳහා ඇති අරමුදල් ආපසු ලබා ගැනීමට අවසර දීම හෝ ඉවත් කර ගැනීමට අවසර දීම හෝ කොමිෂන් සභාව අවශ්‍ය යැයි සලකන පරිදි නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි ලිඛිත නියෝගයකින් තහනම් කිරීම

(ඈ) ඕනෑම පරීක්ෂණයකදී සාක්ෂි හෝ පැමිණ සිටීම අවශ්‍ය විය හැකි පුද්ගලයෙකුගේ විදේශ ගමන් බලපත්‍රය සහ වෙනත් ගමන් ලියකියවිලි, එවැනි නියෝගයක් අවලංගු කරනු ලබන යම් කාලයක් දක්වා, ආගමන හා විගමන පාලකවරයා විසින් නියෝගයෙහි නියම කර ඇති පරිදි ලිඛිත තහනම් කළ යුතු බවට නියෝගයකින් ඉල්ලා සිටීම.

(ඉ) සාක්ෂි සඳහා හෝ කොමිසමෙහි පෙනී සිටීමේ අවශ්‍යතාවයක් ඇති බවට පවතින යම් නියෝගයක් අවලංගු කරන තෙක්, නිශ්චිතව දක්වා ඇති එවැනි පුද්ගලයින්ගෙන් කිසිවෙකු ශ්‍රී

ලංකාවෙන් පිටවීම වැළැක්වීම සඳහා පොලිස් නිලධාරියෙකු විසින් අවශ්‍ය සියලු පියවර ගැනීමට ලිඛිත නියෝගයකින් නියම කිරීම.

(ඊ) කොමිෂන් සභාව අවශ්‍ය යැයි සලකන ඕනෑම අධිකාරියක් සන්තකයේ ඇති ඕනෑම පණිවුඩයකට අදාළ ඕනෑම පොතක් හෝ ලේඛනයක් නිශ්චිතව දක්වා ඇති පරිදි එවැනි විදුලි සංදේශ අධිකාරියක් හෝ නිලධාරියෙකු විසින් ඉදිරිපත් කරන ලෙස ලිඛිත නියෝගයකින් ඉල්ලා සිටීම.

(3) කොමිෂන් සභාවට එහි විමර්ශන කොන්දේසිවල විෂය පථය තුළ ඇති කරුණු සම්බන්ධව මහජනතාවගෙන් නියෝජනයන් කැඳවීමට සහ එවැනි නියෝජනයන් පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට බලය ඇත.

(4) මෙම නීතිය යටතේ පිහිටුවා ඇති කොමිෂන් සභාවකට (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති ඕනෑම බලයක් ක්‍රියාත්මක කළ හැකි අතර, එම බලය ක්‍රියාත්මක කිරීමේදී කොමිෂන් සභාව විසින් යම් නියෝගයක් නිකුත් කරන ඕනෑම පුද්ගලයෙකු විසින් වෙනත් ඕනෑම නීතියකට පටහැනිව කුමක් සඳහන් වුවද අදාල නියෝගය ක්‍රියාත්මක කළ යුතුය.

පනතේ 9 වන වගන්තිය යටතේ, ඕනෑම අධිකරණයකට, විනිශ්චය සභාවකට හෝ මහජන ආයතනයකට හෝ ඕනෑම නීතියක පරිපාලනයට අදාළව දේශපාලන පළිගැනීම්, බලය අනිසි ලෙස භාවිතා කිරීම, දූෂණය කිරීම හෝ කිසියම් වංචනික ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයෙකු වැරදිකරු වී ඇති බව විමර්ශනයේදී සොයාගෙන ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට වාර්තා කරනු ලබන කල්හි ඒ සම්බන්ධයෙන් ප්‍රජා අශක්නුතාවයන් නිර්දේශ කිරීමට කොමිසමට බලය ඇත. එබැවින් ජනාධිපතිවරයා විසින් එවැනි සොයාගැනීම් ගැසට් පත්‍රයේ පළ කිරීමටත් එම වාර්තාව ප්‍රකාශයට පත් කිරීමටත් නියම කළ යුතුය.

සිවිල් අශක්නුතාවය යන්නට පුද්ගලයෙකු ඡන්දදායකයෙකු වීමෙන් සහ ඡන්දය දීමෙන් හෝ මැතිවරණවලදී අපේක්ෂකයෙකු ලෙස නම් කිරීමෙන් (ජනාධිපති, පාර්ලිමේන්තු සහ පළාත් පාලන

මැතිවරණ) සහ රාජ්‍ය නිලධාරියෙකු ලෙස සේවය කිරීම හෝ තනතුර දැරීමට නුසුදුස්සකු වීම ඇතුළත් වේ.[100]

පනත අනුව, කොමිෂන් සභාවක් විසින් නිකුත් කරනු ලබන ඕනෑම වාර්තාවක්, සොයා ගැනීමක් හෝ නිර්දේශයක් අවසානාත්මක සහ තීරණාත්මක වන අතර එය කිසිදු අධිකරණයක හෝ විනිශ්චය සභාවකදී ප්‍රශ්න කළ නොහැකිය.[101] කෙසේ වෙතත්, අතීතයේ දී පැවති විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන් කීපයක නිර්දේශයන් පසුකාලීනව අධිකරණය විසින් සමාලෝචනයට ලක් කරන ලද අවස්ථා කිහිපයක් ඇත.

## විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන්ට අදාල අතීත සිදුවීම්

### 1. එස්. බණ්ඩාරනායක මහත්මියගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මියට බලය අනිසි ලෙස භාවිතා කිරීම හා දූෂණය යන චෝදනා යටතේ චෝදනා එල්ල වූ අතර වර්ෂ 1978 දී පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් හමුවට කැඳවන ලදී.[102]

අභියාචනාධිකරණය විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට එරෙහිව තහනම් නියෝගයක් ලබා දෙමින් සඳහන් කරන ලද්දේ, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නීතිය අතීතයට බලපාන අයුරින් බලාත්මක නොවන බවත්, එබැවින් එය බලාත්මක කිරීමට පෙර කාල පරිච්ඡේදයක් විමර්ශනය කිරීම එහි බල සීමාවෙන් ඔබ්බට ගිය තත්වයක් බවත්ය. කෙසේ නමුත්, අතීතයට බලපාන පරිදි එකී නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා පසුබිම සැනසෙන සංශෝධනයන් ද්විත්වයක් ගෙන එමින්, අභියාචනාධිකරණයේ තීන්දුව අහෝසි වූ බව ප්‍රකාශ කිරීමට පාර්ලිමේන්තුව විසින් පෙර නොවූ විරූ පියවර ගනු ලැබීය. ඒ අනුව, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් චෝදනාවලට බන්ඩාරනායක මහත්මිය වැරදිකරු වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇයට එරෙහිව

100 9(3) වගන්තිය

101 9(2) වගන්තිය

102 ඩේලි නිවුස්, 'සිරිමාවෝගේ බලහත්කාරයෙන් පිටුවහල් කිරීම, යොමුව <https://www.dailynews.lk/2017/12/13/features/137180/sirimavo%E2%80%99s-enforced-exile>

ප්‍රජා අයිතිවාසිකම් අහෝසි කිරීමේ නියෝගයක් පැනවීම සහ වර්ෂ 1980 දී ඇයව පාර්ලිමේන්තුවෙන් නෙරපා හැරීම සිදු විය.[103]

ඇය නෙරපා හැරීමෙන් පසු දින, පාර්ලිමේන්තු මැතිවරණ පනතට සහ ජනාධිපතිවරණ මැතිවරණ පනතට හදිසි සංශෝධන දෙකක් සිදු කරන ලදී. මෙම සංශෝධන මගින් "...යෝජනාවකින් නුසුදුස්සකු වන ඕනෑම පුද්ගලයෙක් පාර්ලිමේන්තු (සහ ජනාධිපති) මැතිවරණයකදී එකී ප්‍රජා අශක්නුතාවය බලපැවැත්වෙන කාල සීමාව තුළ කිසියම් ආකාරයකින් සහභාගී වන..." සහ එවන් වූ තහනමකට පටහැනිව කටයුතු කිරීම මාස හයක් දක්වා සිර දඬුවම් ලැබිය හැකි හෝ රුපියල් දහසක් දක්වා දඩයක් හෝ ඒ දෙආකාරයෙන්ම දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කරන බවට පෙන්වා දී තිබුණි.[104]

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා ප්‍රකාශ කරක ලද්දේ, "පුරවැසියා ප්‍රජා අශක්නුතා වලට යටත් කිරීම, එනම් ඔහුගේ ප්‍රජා අයිතිය අහිමි වීම, ඔහුට දේශපාලන මරණ දඬුවම නියම කිරීම" වශයෙනුත් සහ අධිකරණය සමග දේශපාලන මැදිහත්වීමේ ක්‍රියාව වූ කලී ''මැනිය නොහැකි තරමේ විපාක ගෙනදෙන මෙන්ම විනිසුරුවරුන්ගේ ස්වාධීනත්වයට හා අධිකරණ ස්වාධීනත්වයට අහිතකර ලෙස බලපාන අපගේ ව්‍යවස්ථාදායක ඉතිහාසයේ නින්දිත සිදුවීමක්'' වශයෙනි.[105]

එවකට ජනාධිපතිවරයා වූ ජේ. ආර්. ජයවර්ධන වෙත ලිපියක් යවමින් ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ සභාපති බිෂොප් ලක්ෂ්මන් වික්‍රමසිංහ මෙසේ ලිවීය, 'විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශයන් මත සිරිමාවෝ ආර්. ඩී. බන්ඩාරනායක මහත්මියගේ ප්‍රජා අයිතිවාසිකම් අහෝසි කිරීම වූ කලී මහත් උන්නදුවක් ඇති ප්‍රජාතන්ත්‍රවාදයක එක් මූලික පදනමක් අවතක්සේරුවට ලක් කිරීමේ හැකියාවක් ඇති තත්වයකි. ඔහු විසින් තවදුරටත් පෙන්වා දෙන ලද්දේ, ''විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු සාධාරණ සහ අපක්ෂපාතී අන්දමින් සිදු වූ අධිකරණමය ක්‍රියාවලියක් බවට හැඳින්විය නොහැකි'' බවයි.[106]

## 2. රජයේ ඇතැම් ආයතනවල සිදුවන අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීම සඳහා වර්ෂ 1995 දී පත් කරන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

---

103 ඉහත එම

104 ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, 'ජනාධිපති සහ පාර්ලිමේන්තු මැතිවරණවලට සහභාගී වීම සීමා කරන විස්මිත සංශෝධනයන්' (1980 නොවැම්බර් 2)

105 සන්ඩේ ඔබ්සර්වර්, 'සිරිමාවෝ බණ්ඩාරනායකයට ප්‍රජා ආබාධිතභාවය පැනවීම: දැවැන්ත දේශපාලන වැරැද්දක්, යොමුව <http://archives.sundayobserver.lk/2004/10/10/fea26.html>

106 1980 ඔක්තෝබර් 14 දින සිට බිෂොප් ලක්ෂ්මන් වික්‍රමසිංහ මහතා විසින් ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන වෙත යැවූ ලිපිය 1983 දෙසැම්බර් 10 වන දින මානව හිමිකම් දිනය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයේ සභාපති, කුරුණෑගල රදගුරු දිවංගත රදගුරු ලක්ෂ්මන් වික්‍රමසිංහ මහතා විසින් ලියන ලද එකී ලිපියෙහි කොටසක් සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

රජයේ ඇතැම් ආයතනවල සිදුවන අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීම සඳහා වර්ෂ 1995 දී පත් කරන ලද විශේෂ ජනාධිපති කොමිෂන් සභාව, වගඋත්තරකරු තෙනහන්දි විජයපාල හෙක්ටර් මෙන්ඩිස්ව විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා නීතියෙහි 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ බලය අනිසි ලෙස භාවිතා කිරීම හෝ අයුතු ලෙස පරිහරණය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු බව නිර්දේශ කර ඒ අනුව ඉහත විධිවිධාන යටතේ ඔහුව ප්‍රජා අශක්නුතාවයට පත් කළ යුතුයැයි නියම කරන ලදි.[107] විජයපාල මෙන්ඩිස් එදිරිව පී. ආර්. පී. පෙරේරා නඩුවෙහි දී ශ්‍රේෂ්ඨාධිකරණය පෙන්වා දෙන ලද්දේ එකී ප්‍රජා අශක්නුතාවය පැනවීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශය අත්තනෝමතික හා අසාධාරණ බවටය.

### 3. ලලිත් අතුලත්මුදලි සහ විජය කුමාරතුංග ඝාතන පිළිබඳ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා

මෙහි දී සාධාරණ නඩු විභාගයක් පැවැත්වීමේ රීතිය නොසලකා හරින ලද අතර, අනෙක් අයගේ වරද සම්බන්ධයෙන් නිගමනය කිරීම සඳහා පුද්ගලික එදිරිවාදිකම් සම්බන්ධයෙන් ක්‍රියා කළ පුද්ගලයින්ගේ සාක්ෂි කොමිසම විසින් ලබා ගන්නා ලදී. දෙවන හා තුන්වන පුද්ගලයින්ට නැවත නැවතත් කරන ලද ප්‍රකාශයන් 'ළඟාවිය නොහැකි සාක්ෂි' ලෙස සලකනු ලැබීය. හිටපු ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ඒ. සී. අලස් එකී කොමසාරිස්වරුන්ගේ නිගමන ප්‍රතික්ෂේප කරන ලද්දේ 'ගම්‍යාර්ථ' කළ අයට එරෙහිව බැලූ බැල්මට නඩුවක් ස්ථාපිත කර ඇති බැවින් ඔවුන්ට අභිප්‍රායක් 'තිබිය හැකිව තිබූ බව' ය. විනිසුරු අලස් පෙන්වා දුන් පරිදි, 'චේතනාවෙන් වරදකාරිත්වය' 'අපරාධ නීතියේ ස්ථාපිත මූලධර්මවලට සම්පූර්ණයෙන්ම පරිබාහිර තත්වයක් විය.'

'ශ්‍රී ලංකාවː බලයේ අධිමානය - මිථ්‍යාව, පරිහානිය සහ මිනීමැරුම' නම් වූ කෘතියෙහි කතුවරයා වන විද්වත් රාජන් හූල් විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි සොයාගැනීම් පිළිබිඹු කරමින් නිරීක්ෂණය කරන ලද්දේ, 'ජාතික වශයෙන් කැළඹීමට පත්වූ සිදුවීම් සම්බන්ධයෙන් සත්‍යය යටපත් කිරීම සඳහා මිස සත්‍යය ඉස්මතු කරනු ලබන තත්වයකට කටයුතු කර වරදිකරුවන්ට වගවීමට කරනු ලැබීමට කටයුතු නොකරන තරම් පහත් තත්වයට නෛතික ක්‍රියාවලිය පත් වී ඇති බවයි.'[108]

---

107 විජයපාල මෙන්ඩිස් එදිරිව පී. ආර්. පී. පෙරේරා (1999) 2 ශ්‍රී ලංකා නීති වාර්තා 110, පිටුව 119, යොමුව < https://www.lawnet.gov.lk/wp-content/uploads/2016/11/014-SLLR-SLLR-1999-V-2-WIJAYAPALA-MENDIS-v.-P.-R.-P.-PERERA-AND-OTHERS.pdf >

108 'විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක සැබෑ අවදානම්' (සන්ඩේ ටයිම්ස්, 2019 දෙසැම්බර් 8), යොමුව https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20191208/281994674365356

## දේශපාලන පළිගැනීම් පිළිබඳ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන්

දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වර්ෂ 2021 ජනවාරි 29 දිනැති අංක 2212/53 දරන(අති විශේෂ) ගැසට් පත්‍රය මඟින් පත් කරන ලදී.[109] ගරු ධම්මික ප්‍රියන්ත සමරකෝන් ජයවර්ධන මැතිතුමා (ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර) ගරු බේමා කුමුදිනී වික්‍රමසිංහ මැතිතුමිය (ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර) සහ ගරු රත්නප්‍රිය ගුරුසිංහ මැතිතුමා (අභියාචනාධිකරණ විනිශ්චයකාර) යන අයගෙන් සමන්විත විය. රත්නප්‍රිය ගුරුසිංහ විනිශ්චයකාරතමාගේ ඉල්ලා අස්වීමෙන් පසුව, විනිශ්චයකාර සෝභිත රාජකරුණා මැතිතුමා කොමසාරිස්වරයෙකු වශයෙන් පත් කරන ලදි.[110]

දේශපාලන පළිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ අයිතම අංක 08 යටතෙ සඳහන් වගඋත්තරකරුවන් (දූෂණ විරෝධී කමිටුවට අදාළ) විසින් පහත සඳහන් වරදවල් සිදුකර ඇත්දැයි විමර්ශනය කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට බලය ඇත.

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි ලබා දී ඇති දිවුරුම කඩ කරමින් එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය කිරීම,

II. බලය අනිසි ලෙස පරිහරණය කිරීම හෝ බලය අයථා පරිදි පාවිච්චි කිරීම, මැදිහත් වීම, වංචා කිරීම, දූෂණය, සාපරාධී සාවද්‍ය පරිහරණය, සාපරාධි විශ්වාසය කඩ කිරීම හෝ ඥාති සංග්‍රහය

III. යම් තැනැත්තෙකුගෙන් දේශපාලන වශයෙන් පලි ගැනීම,

IV. යම් තැනැත්තෙකුගේ -

(අ) යම් පත්වීමක් ලබා දීමේදී හෝ ස්ථාන මාරුවක් සිදු කිරීමේදී,

(ආ) යම් උසස් වීමක් දීමේදී,

(ඇ) යම් අක්‍රමිකතාවක් හේතුවෙන් සේවය අවසන් කිරීමේදී, යම් අක්‍රමිකතාවයක්

---

109 වර්ෂ 2021 ජනවාරි 29 දිනැති අංක 2212/53 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2021/1/2212-53_S.pdf>

110 වර්ෂ 2021 පෙබරවාරි 19 දිනැති අංක 2215/59 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2021/2/2215-59_S.pdf>

(ඈ) යම් ලිඛිත නීතියක් උල්ලංඝනය කිරීම[111] සිදුකර තිබේද යන වග.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වැනි අනු ව්‍යවස්ථාව සහ 1978 අංක 04 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 07 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 09 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව වගඋත්තරකරුවන් විසින් ඉහත කී යම් ක්‍රියාවක් සිදු කර ඇත්නම් එවන් යම් තැනැත්තෙකු ප්‍රජා අශක්නුතාවකට යටත් කළ යුතු ද යන වග නිර්දේශ කිරීම මෙකී විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කාර්යයන් විය.

කොමිෂන් සභාව පත් කළ දින සිට මාස තුනක් ඇතුළත අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම සහ අවසන් වාර්තාව හෝ අතුරු වාර්තා ජනාධිපතිවරයා වෙත භාර දීමට අවශ්‍ය කටයුතු කිරීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට බලය ඇත. මහජනතාව දැනුවත් කිරීමකින් තොරව ඕනෑම පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පැවැත්වීමට විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට නියම කෙරේ. සියළුම රජයේ නිලධාරීන්, ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සහ විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සහය ඉල්ලා සිටිය හැකි හෝ තොරතුරු ලබා ගත හැකි අනෙකුත් පුද්ගලයින්ට හැකි සෑම සහයක්ම ලබා දී හැකි සියලු තොරතුරු ලබා දෙන ලෙසට උපදෙස් දෙනු ලැබිය හැකිය.

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින සියලුම සාක්ෂිකරුවන්ට විශේෂ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව නඩු පැවරීමෙන් නිදහස වීමේ මුක්තිය ලැබේ.

වර්ෂ 2021 අප්‍රේල් 01 වන දිනැති අංක 2221/54 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය මගින් අංක 2 අයිතමය ඇතුළත් කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් සංශෝධනය කරන ලදී. එමගින් පෙන්වාදෙනු ලබන්නේ,

> ''2021 ජනවාරි මස 29 දින පළ කරන ලද අංක 2212/53 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි ඇතුළත් පරිදි ඔබ වෙත නිකුත් කෙරුණු නිර්ණය කරුණු වල අංක 1 ප්‍රකාර ඔබ විසින් එයට අතිරේකව පරීක්ෂා කොට වාර්තා කළ යුතු කරුණුවල විශේෂයෙන් නිශ්චිතභාවයට අගතියකින් තොරව සහ එකී හඳුනාගනු ලැබූ තැනැත්තන් සියල්ලම හෝ යම් කිසිවකුට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි කෙරුණු නිගමනයන්, තීරණයන්, නිර්දේශයන් සියල්ලම හෝ කිසිවක් යුක්ති සහගත වන්නේ ද යන්න සහ ඒවා කිසිවක් හෝ සියල්ලම ක්‍රියාත්මක කළ යුතු ද, නැතහොත් ක්‍රියාත්මක කරලීමට සැලැස්විය යුතු ද, එසේ

[111] වර්ෂ 2021 ජනවාරි 29 දිනැති අංක 2212/53 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2021/1/2212-53_S.pdf>

නැතහොත් අන්‍යාකාරයකින් තව දුරටත් කටයුතු කරගෙන යා යුතු ද යන්න පරීක්ෂා කොට වාර්තා කිරීම සහ ඔබගේ අභිමතය පරිදි මෙම සංශෝධිත නිර්ණේය විෂයයන්ගෙන් පැන නගින සහ එකී නිර්ණේය විෂයයන්ට ඇතුළත් කිසියම් කරුණක් පිළිබඳව යම් සීමිත හෝ සාමාන්‍ය විමර්ශනයක් හෝ තව දුරටත් විමර්ශනයක් කිරීම අවශ්‍ය යැයි ඔබේ අභිමතය අනුව පෙනී යන්නේ නම් හෝ එසේ නැතහොත් යෝග්‍ය යැයි ඔබට පෙනී යා හැකි පරිදි ඔබේ පරීක්ෂණය පොදුවේ ඉහත කී වාර්තාවේ අන්තර්ගතය විස්තරාත්මකව සලකා බැලීමකට සහ පූර්ණ පරීක්ෂාවකට සීමා කරලීම.'' යනුවෙනි.[112]

# නිගමනය

මෙම විවරණයේ දී, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පරීක්ෂණ කොමිෂන් සභාවේ පසුබිම සහ නෛතික රාමුව සහ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවන් පිළිබඳ අතීත තත්වයන්, දේශපාලන පළිගැනීම සම්බන්ධයෙන් වන පරීක්ෂණ කොමිෂන් සභාවේ සහ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විමර්ශන යාන්ත්‍රණවල මූලික කරුණු සහ ගම්‍යාර්ථයන් කෙටියෙන් විදහා දක්වයි. දේශපාලන පළිගැනීම් වලට ලක්වන බව ප්‍රකාශ කරනු ලබන පුද්ගලයින් සඳහා නෛතික ආරක්ෂණ සඳහා ප්‍රවේශ වීමේ වැදගත්කම පිළිගන්නා අතර, වගවීම සහ යුක්තිය සෙවීමේ උත්සාහයන්ට බාධා කිරීම සඳහා එවැනි ආරක්ෂණ උපයෝගී කර නොගන්නා බවට සහතික කිරීම සඳහා පවත්නා නීති රාමුවට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අවශ්‍ය බව පැහැදිලිය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් සමාජය ඇතුළු විවිධ පාර්ශවයන් විසින් පරීක්ෂණ කොමිෂන් සභාවේ කාර්යයන් සහ එහි සොයා ගැනීම් අධිකරණය හමුවේ අභියෝගයට ලක් කර ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තවදුරටත් සඳහන් කරනු ලබයි.

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හා සම්බන්ධ ඉදිරි කටයුතු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබේ. කෙසේ නමුත්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව තුළ වර්තමානයෙහි සිදුවන කටයුතු සම්බන්ධයෙන් මහජනතාව තුළ ඇත්තේ සීමිත තොරතුරු ප්‍රමාණයක් පමණි. එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පවතින දේශපාලනීකරණය වීම සහ විනිවිදභාවයක් නොමැතිකම යන චෝදනා හේතුවෙන් අදාල කටයුතු විවේචනයට ලක්ව තිබේ. විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කාර්යයන් සහ එමගින් උද්ගත විය හැකි ප්‍රතිවිපාකයන්හි ගම්‍යාර්ථයන් සැලකිල්ලට ගනිමින්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් එවැනි යාන්ත්‍රණවල විනිවිදභාවය සහ වගවීමේ වැදගත්කම අවධාරණය කරනු ලබයි.

---

112 වර්ෂ 2021 අප්‍රේල් 1 දිනැති අංක 2221/54 දරන (අති විශේෂ) ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2021/4/2221-54_S.pdf>

අවසාන වශයෙන්, වර්තමාන විවරණයේ සාකච්ඡා කර ඇති ක්‍රියාදාමයන් සහ ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය සඳහා එහි ඇඟවුම් සමඟ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සිය උත්සුකයන් නැවත අවධාරණය කරයි. විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශයන්ට ඇති විය හැකි බලපෑම විවරණය මඟින් සලකුණු කරන අතර, දැනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති යෝජනාව සහ ඊළඟ පියවර ගැන අවධානය යොමු කළ යුතුය. මේ සියලු ක්‍රියාමාර්ගයන් දැනටමත් බලවත් විධායක නිලධාරියෙකු ශක්තිමත් කිරීම, විමර්ශන සහ අධිකරණ කටයුතු අඩපණ කිරීම සහ ශ්‍රී ලංකාවේ ආයතන හා ක්‍රියාවලීන්හි විශ්වාසනීය හිඟයක් ඇති කිරීමට සැලකිය යුතු ඇඟවුම් ඇති කළ හැකිය. මේ අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පසුබෑමට හේතු විය හැකි ඕනෑම ක්‍රියාමාර්ගයක් පිළිබඳව වැඩි විමර්ෂණයක්, විවාදයක් හා අභියෝගයක් පැවැත්වීම අවශ්‍ය වේ.